# පන් පසිඳුවන් සහ පාලු නගරයේ අබිරහස

දිලීප් ප්‍රසන්න



FAMOUS FIVE

පන් පසිඳුවන් 22

# පන් පසිඳුවන් සහ පාලු නගරයේ අබිරහස

DILEEP PRASANNA



Scanned with CamScanner

ENID BLYTON'S FAMOUS FIVE 22

PAALU NAGARAYEE ABIRAHASA

BY

DILEEP PRASANNA SENEVIRATHNE

DA . SA . RU . BOOK

2021/8/21

DILEEP PRASANNA



Scanned with CamScanner

# පන් පසිඳුවන් 22

## පන් පසිඳුවන්

## සහ පාලු නගරයේ අබිරහස

DILEEP PRASANNA

දිලීප් ප්‍රසන්න සෙනෙවිරත්න



Scanned with CamScanner

# පෙරවදන

එනිඩ් බ්ලයිටන් විසින් ලියන ලද ද ෆේමස් ෆයිව් කතා මාලාවේ කෘති විසි එකකි . සියල්ල සිංහලයට නැගීමෙන් පසුව සිතේ ඇති වූ කුඩා අදහසක් මෙම කතාව සඳහා වස්තු විශය විය . ඔබට කියවා හුරු පුරුදු ළමා වීරයන් පිරිස තරමක තරුණයින් බවට පත් කොට මම මෙම කෘතිය රචනා කලෙමි . එහෙයින් ම මෙය කිසිඩු ලෙසකින් පරිවර්තන කෘතියක් නො වන්නේ ය . මෙය සම්බන්දයෙන් කිසියම් අදහසක් ඔබ සතුව තිබේ නම් මට දන්වා සිටින මෙන් ඉල්ලා සිටිමි .

එනිඩ් බ්ලයිටන් මැතිණිය විසින් ලියන ලද ෆේමස් ෆයිව් කෘති පෙළ සේම මා විසින් රචනා කරන ලද මේ කුඩා කෘතිය ද ඔබේ රස වින්දනයට හේතු වේවායි පතමි .

දිලීප් ප්‍රසන්න සෙනෙවිරත්න

**0703315404**

DILEEP PRASANNA



Scanned with CamScanner

## 01 පරිච්ඡේදය

" බිග් හොලෝව් වලට ගිහින් ටින්කර්වත් අරගෙන ම යන එක හොඳයි" යි පවසමින් ඩික් ජූලියන් දෙස බැලී ය. " මිස් චීෆ් ව දැකපු කාලයක් මතක නෑ"

" ඒක ඇත්ත" යි ජෝර්ජ් වහා එකඟ වූවා ය . " අවුරුදුම කීයක් ගිහින්ද ? හේලින් මහාචාර්යතුමා වුනත් සතුටුවෙයි අපි ටින්කර්ගෙන් එයාව නිදහස් කරන එක ගැන"



DILEEP PRASANNA

Scanned with CamScanner

සැබැවින් ම ටින්කර්ගෙන් සහ මිස් වීෆ්ගෙන් හෙවත් ටින්කර්ගේ වදුරු තඩියාගෙන් ගැලවීමට ලැබීම ගැන නම් මහාචාර්ය හේලින් සතුටට පත් වෙනවාට කිසි ම සැකයක් නැත. ජෝර්ජ්ගේ සුරතල් බල්ලා ටිමියා පවා බිරුම් හඬක් නගා එකඟත්වය පෑවේ ජෝර්ජ්ගේ කතාව අනුමත කළ ලෙසිනි.

" ක්වින්ටින් මාමාත් හේලින් මහාචාර්යතුමාත් කවදාවත් වෙනස් වෙන්නෙ නෑ" යි ඈන් කීවේ හොස්ස ළඟින් මැස්සා යෑමත් නො රිස්සන ක්වින්ටින් මාමා ගැන කල්පනා කරමිනි. මහාචාර්ය හේලින් ද ඉක්මන් කේන්ති කාරයෙකි. " තාමත් ඉස්සර වගේ ම තමයි කියලයි මං නම් හිතන්නෙ. ඉක්මන්ට කේන්ති යන මිනිස්සු කවදාවත් වෙනස් වෙන්නෙ නෑ"

" ඇයි ටින්කර් වුනත් මං හිතන්නෙ නෑ කවදාවත්වෙනස් වෙනස් වෙයි කියල. ඔයාලට මතකනේ අර හිතින් වාහනයක් වෙන කැත පුරුද්ද ?"

ජෝර්ජ් කීවේ කවුරු කවුරුත් සිනහ ගන්වමිනි. සැබැවින් ම වාහනයක් බවට පත් වී නිවස දෙදරවමින් හඬ නගමින් ඇවිදීමේ පුරුද්දක් ඒ දිනවල ටින්කර්ට තිබිණි. විටෙක ගුවන් යානයක් , රොකට්ටුවක් බවට පවා හේ පත් වෙන්නේ තත්පර කිහිපයකිනි. ඒ අතර ඩික් ජෝර්ජ් දෙස බලමින් තවත් යමක් කියන්නට උත්සාහ ගත්තේ ය.

" ඉතිං ජෝර්ජ් ඔයා වෙනස් වෙන්නෙත් නැනෙ. තාමත් කොන්ඩෙ කොටට කපලා කොල්ලෙක්වගේ ඉන්න නේද හදන්නෙ. ජෝර්ජිනා කියල කතා කලොත් තාමත් කඩාගෙන පනී"

එවර නම් ජෝර්ජ්ගේ මුහුණෙන් වෙනදා දැක පුරුදු කෝපය දක්නට ලැබුනේ නැත. සාමාන්‍යයෙන් මෙවන් කතාවකට වෙනදා ඈ දක්වන



DILEEP PRASANNA

Scanned with CamScanner

ප්‍රතිචාරය යක්ෂාරූඪ වූ එකකි. ඈ මද සිනාවක් පෑවාය. කොටට කපන ලද අක්බමරු හිසකෙසින් ද , පිරිමි ළමයෙකු හා සමාන ඇඳුම් පැළඳුම් ද ජෝර්ජිනා යන ස්ත්‍රී නාමකරණය ජෝර්ජ් යන පුරුෂනාමකරණය දක්වාපරිවර්තනය වීම තුළින් ද තවමත් ඈ කෙරෙන්පළවෙන්නේ පිරිමි ළමයෙකුට සමාන පෙණුමකි.

" හරිහරි මම උත්සාහ කරන්නම්කෝ" යි ඈ කීවා ය. " දැං අපි අර ඉස්සර ඉඳපු පොඩි උන් නෙමේනෙ.යමක් කමක් තේරෙන ළමයි. මට දැනටත් 16ක්. .ජුලියන්ට 19 ක්. ඉතිං අපි දැං පොඩ්ඩක් හැදෙන එක හොඳ යි"

ඒ හා සමඟ ම " ඔව්" යි කියන්නට මෙන් ඇගේ සුරතල්බල්ලා බිරුම් හඬක් නිකුත් කොට ඇගේ පය ලෙව කෑවේ ය. ළමෝ එක් හඬින් සිනා සුනහ.

" අන්න තවත් වෙනස් වෙන්නේ නැති කෙනෙක්.තාමත් පරණ ලෙවකන බල්ල ම යි. . හරි දැං නිවාඩු ගමනට වුවමනා සේරම බඩු සූදානම් කරල ඉවර ද ?"

" ඔව්" යි කුඩා ගැහැණු ළමයා ඈන් කීවා ය. එසේ වතුදු ඈ ද දැං පෙර සිටි කුඩා ගැːඇණු ළමයා නොව වයස අවුරුදු පහළවක යෞවනියකි. " ඉස්සර වගේ නෙමේ දැං නිවාඩු ගමනක් යනව කියන එක හරි ලේසියි. බඩු ටික ලැහැස්ති කරගත්තා. ගිහින් ජූලියන්ගේ කාර් එකට නැග්ගා. පියාඹලා ගියා. කෝච්චි බලන්ඩ ඕනි නෑ. බස් බලන්ඩ ඕනි නෑ. බය වෙන්ඩ ඕනි නෑ"

" ඇති යන්තම් උඹලාට මගේ වහනේ අගය ගැන අන්තිමට හරි මතක් වුනා" යි සිනාමුවෙන් පවසමින් ජූලියන් කතාවට එක් වූවේ ය. " මං බලන් හිටියෙ මගෙ වාහනේ ගැන දැංකියවෙයි දැං කියවෙයි කියලා. "



DILEEP PRASANNA

Scanned with CamScanner

ළමෝ කවුරුත් එක් හඬින් සිනා වූහ. ජූලියන්ගේ නවතම මෝටර් රථය ඔවුන්ට අමතක නැත. ඇන් කීවාක් මෙන් දැං කෝච්චිවල බස්වල ගමන් කිරීමේ ඇවශ්‍යතාවයක් ළමුන්ට නැත. එක් වරම ටිමී බිරුම් වැලක් පිට කළේ ය.

" ඔය කියන්නේ ඌත් මගෙ වාහනේට කැමතියි කියල නොවැ" යි ජූලියන් සිනා මුවින් කී ය. " ඉස්සර අපි බයිසිකල්වල නිවාඩු ගමන් යද්දී මූ හැතැම්ම ගනන් දුවගෙන එනව පයින්. දැන් කොල්ලාට තියෙන්නේ පාඩුවේ ජනේලෙන් එළියට හොම්බ දාගෙන බලාගෙන ඉන්න විතරයි"

ළමුන්ගේ කතාවට බාදා කරමින් පිය ගැටෙන හඬක් නැගුණේ ය. ඔවුන් රඳී හුන් කාමරය ඇතුළු වූවේ ෆැනී නැන්දා හෙවත් ජෝර්ජ්ගේ අම්මා ය. ඉස්සර මෙන් නොව දැන් ඇගේ කොන්ඩය ද තනින් තැන සුදු වීගෙන එයි. ඈ ද ක්වින්ටින් මාමා මෙන් කණ්නාඩි යුගලයක් ද පළඳී.

" ඔන්න ඔයාලට ගමන අතරමගදි කන්න සැන්ඩ්විචස් ගොඩකුයි ලෙමනේඩ් බෝතල් දෙකකුයි චොක්ලට් වගයකුයි පළතුරු කේක් එකකුයි ලැහැස්ති කරලයි තියෙන්නෙ. දැං ඉතින් කට්ටිය වාහනේ යන නිසා මහ ගොඩක් බඩගිනි වෙන්නෙත් නෑනේ"

" මාත් යනවනෙ නැන්දේ" යි කියමින් ඩික් ඇගේ දෙවුරට දැත් බර කළේ ය. " කොහොමත් මගේ බඩගින්න හැමදාම එක ම විදිහට තියෙයි"

" අනෙ අප්පේ ඒක නම් ඇත්ත. ඉතිං දැං කියමු බලන්න විස්තර. ඔයාල කීයට ද යන්නෙ ?"

DILEEP PRASANNA



Scanned with CamScanner

" අපි මෙහෙන් කෙලින් ම බිග් හොලෝවලට ගිහින් ටින්කර්ව ගන්නවා" යි ජූලියන් පිළිතුරු දිනි. " අරන් එහෙම්ම ග්‍රේලින් වලට යනවා. කොහොමත් මගෙ වාහනේ හොඳ නිසා උදේ 9ට මෙහෙන් පිට වුනා ම අපිට ග්‍රේලින් ටවුන් එකට 2 විතර වෙනකොට යන්න පුලුවන් .. අපි හිතන් ඉන්නේ වාහනේ දාන්න පුලුවන් තැනක් හොයාගෙන ඉක්මනින් ග්‍රේලින් කඳුවැටියට යන්න. ඊට පස්සේ කූඩාරම් ගහගන්න පුලුවන්නේ"

" හොඳයි " යි ෆැනී නැන්දා කීවේ යළිත් වරක්ඩික් ගලවා ගත් උපැස් යුවල උදුරාගෙන දෙනෙත් මත රඳවා ගනිමිනි. " අනේ ඔයාලා කොහේ ගියත් ආපහු අර ඒ කාලෙ වගේ එක එක අනතුරුදායක වැඩවලට නම් මැදිහත් වෙන්ඩ එපා. ඔයාලා නිවාඩු ගමනක් ගියා ම මම ඉන්නේ ඇගේ ලේ පතු වෙලා"

" ඒක නම් පොරොන්දු වෙන්ඩ බෑ අම්මා" යි ජෝර්ජ් කීවා ය. " ත්‍රාස ජනක වැඩවලට අපි හැමදාමත් පැටලෙන්නේ අහම්බෙන්නෙ. අනික ඉතින් එහෙම දෙයක් නැත්තම් නිවාඩුවේ කිසි වැඩකුත් නෑනේ"

" ඔය කිව්වේ. ටිමීත් ඉන්න නිසා තමා මං පොඩ්ඩක් හරි හිත හදාගෙන ඉන්නේ"

සැබැවින් ම මොකක්දෝ හේතුවකට ළමුන් යන යන තැන අබිරහස් , වීර ක්‍රියාවල පැටලීම නම් ෆැනී නැන්දාට අනුමත කළ නො හැකි ය. ඔවුන්ගේ සෑම වීරක්‍රියාවක ම අග ඈ ප්‍රීතියටපත් වුන ද ඒ අතර මග කාලය ඈ ගෙවා දමන්නේ ඉතා අපහසුවෙනි. බියෙනි. හද ගැස්මෙනි.සංත්‍රාසයෙනි.

" නැන්දා වයසට යනවට මං ආස නෑ" යි එක්වර ම ෆැනී නැන්දාගේ කෙස් ගසක් අතින් අදිමින් ඈන් කීවා ය." මේ ඔක්කෝම මං වෙලාවක කලු පාට ගාලයි නවතින්නේ"

DILEEP PRASANNA



Scanned with CamScanner

" අනේ අනේ ඇත් " යි ෆැනී නැන්දා මද සිනාවක් පළ කළා ය. " ඔයාලාත් ඉතින් දැං ඉස්සර ඉඳපු පුංචි ළමයි නෙමේනේ. මේ බලන්නකෝ දැංකට්ටිය කොච්චර ලොකු වෙලාද කියලා. මට මතකයි තුන් දෙනා මුලින් ම කිරින් වලට ආව දවස. පුංචි ළමයි තුන් දෙනෙක් ඊට පස්සේ මගේ කුකුල් කේන්ති කාරී ... සමාවෙන්න කුකුල් කේන්ති කාරයා එක්ක එකතු වෙලා කිරින් දූපතේ නිදාමයක් හොයා ගත්තා.ඊටත් පස්සේ කට්ටිය ක්වින්ටින්ගේ ලිපි වගයක් බේර ගත්තා. අනේ ඇත්තට කොයි තරම් නම් දේවල් සිද්ද වුනා ද ළමයි"

මොහොතකට ළමුන් පිරිස ගැඹුරු සිතුවිල්ලක ගිලුනෝ ය. සැබවින් ම අතීතය සිහියට නැගීම අපූරු ය. සෑම නිවාඩුවක ම අද් දකින ලද වික්‍රමකාමී ක්‍රියා මේ වනවිට ඔවුන්ගේ සිත්වලට ඇති කරන්නේ වචනයෙන් කිව නො හැකි තරමේ චමත්කාර ජනක මතකයන් සමුදායකි.

" හරි හරී. දැං බඩු ටික කට්ටිය ම කාර් එකට පටවන්ට" යි ජුලියන් යෝජනා කළෙන් ළමෝ වහ වහා නිවාඩු ගමන රැගෙන යාම සඳහා සූදානම් කොට ගන්නා ලද කලමන්ස සියල්ල ජුලියන්ගේ මස්ටැන්ග් වර්ගයේ මෝටර් රථයට පටවන්නට වූහ. ඒ සඳහා ෆැනී නැන්දාජ් උපකාරය ද නිර්ලෝභී ව ලැබුණු අතර ජොආනා හෙවත් කිරින් කොටේජ් නිවහනේ ඉවුම් පිහුම් කටයුතු සිදු කළ කාන්තාව විශාලා මල්ලක් ද රැගෙන ඔවුන් දෙසට පැමිණියේ ඒ අතර තුර ය.

" මෙන්න මං ඔයාලට රස කැවිලි වගයක් ගෙනාවා" යි ඇ කියන්නට වී ය. " නැන්දාට කාඩ් එවන කොට ඒවායේ හොඳ නරක කියල එවන්ටත් අමතක කරන්න එපා"

" ඔයාව අපිට අමතක වෙන්නේ කවද්ද ජොආන්.."

DILEEP PRASANNA



Scanned with CamScanner

" හරි හරී" යි ඇන් ජොආනාගේ මුහුණසිම්බා ය. " ඒ පැත්තේ ලස්සන මල් ජාති තිබුනොත් මම ඔයාටයි නැන්දටයි තැපෑලෙන් එවන්නම්"

ඔවුන් මෙසේ සල්ලාපයේහි නියැලෙන අතර තුර ඔවුන් දෙසට වේගයෙන් දිවගෙන ආවේ ජෝර්ජ්ගේපියස හෙවත් ක්වින්ටින් මහතා ය. උස් හා කෙට්ටු සිරුරත් වයස්ගත පෙණුමත් හේතු කොටගෙන ඔහුගෙන් පළ වූවේ වෙනදා ට ත් වඩා වැඩි වෙහෙසට පත් බවකි.

" ඔයාලා කොහේ හරි යන්ට ද ?" යි ළමුන් පිරිස දෙස බලමින් හේ විචාලේ ය. " කාගෙද මේ වාහනේ ?"

" ඕ ක්වින්ටින් ..." යි ෆැනී නැන්දා සිනා මුවින් කීවා ය. " මේක ජුලියන්ගේ. ඇයි අනේ ඔයාට අමතක ද ඒ ළමයා ඕක ගත්තේමේ ළඟදිනෙ.අපි හැමෝම ට්‍රෙමෙනන් ෆාම් එකට ගිහින් එන්නත් ගියා මතක නැද්ද ?"

ජුලියන් සිනා වූවේ ය මාමාට කිසිත් මතක නැති බව ඔහු දනී. ඒ මාමාගේ සදාකාලික ස්වභාවය යි. නිවාඩු ගමන සම්බන්දයෙන් දිගු විස්තරයක් ක්වින්ටින් මාමා සමග කියන්නට ඔවුන්ට සිදු වූවේ එතැන් සිට ය.

" මම දන්න විදිහට ග්‍රේඉන් කියන්නේ මහ අබිරහස් පළාතක්. නගරය මේ වෙද්දි පාලුවට ගිහින්. ජනතාව නගරය අත් හැරලා එක එක පළාත්වලට සංක්‍රමණය වුනේ ඇයි කියන එක තව ම හරියට හිතා ගන්ට බෑ. ඔහොම පාලු ඉදිබර ගම්මානයක සතියක් දෙකක් තිස්සේ ඔය ළමයි මොනවාකරන්න ද හිතාගෙන ඉන්නේ?"

" අපි යන්නේ කඳුකරයටනේ" යි ඩික් කී ය. " කොහොම හරි අපිට විසඳන්න තවත් අබිරහසක් පැදෙන හැඩයි ?"

DILEEP PRASANNA



Scanned with CamScanner

" මොනවා .. යන්නත් කලින් ?"

" ඇයි දැං මාමා කිව්වේ නගරයේ මිනිස්සු නගරය අතෑරලා සංක්‍රමණය වුනේ ඇයි කියලා තාවම රහසක් ය කියලා. ඉතිනපිට පුලුවන් පාලුවට ගිය නගරයේ අබිරහස විසඳන්ට"

" අනේ අනේ ළමයි. උඹලයි උඹලගෙ අබිරහසුයි. මේ පාරවත් මොකකටවත් පැටලෙන්නෙ නැතුව ලස්සන නිවාඩුවක් ගත කරලා එනවලා. ඒක නෙමේ ෆැනී. මගේ අලුත් පරීක්ෂණ සටහන් කොළ ටික දැක්කද ?..."

ෆැනී නැන්දා සුසුමක් හෙලුවා ය. ජොවානා ඇසක් වසා ළමුන්ට ඉඟියක් පෑවා ය. පරණ විඩහමයි ජෝර්ජ් තමාට ම කියා ගත්ත ය. ක්වින්ටින් මාමා වෙනස් වෙන්නෙ නෑ ඈන්ට සිතුනේ එසේ ය. කණ්ණාඩිය යන්තමින් පහත් කොට කොල්ලන් දෙස බලා සිදුකලක්වින්ටින් මාමාගේ ඉඟි කිරීම දුටුවේ ඩික් සහ ජූලියන් පමණි.

නැන්දාටත් මාමාටත් ජොවානාටත් සුබ පැතීමෙන් ඉක්බිති වහ වහා රථයට නැගගත් ඔවුහු වේගයෙන් ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්තෝ ය . කිරින් දූපතත් කිරින් වෙරළ තීරයත් යළි යළිත් දැක බලා ගැනීමට ලැබීම කා තුළත් ඇති කලේ අසීමාන්තික සතුටකි . නැවතත් ඔවුන්ගේ මෝටර් රථය නවත්වන ලද්දේ බිග් හොලෝහි ටින්කර්ගේ නිවස ඉදිරියෙනි .

" මටත් වටයක් පදින්ට දෙන්ට" යි ඒ වන විටත් බඩු මල්ලක් ද අතින් ගෙන මිස් චීෆ් උරයේ දරාගෙන මග බලමින් හුන් ටින්කර් ප්‍රීතියෙන් කෑ ගැවේ ය .

" හරි හරී' යි ජූලියන් එකග වූවේ ය . ' නො දී හිටියොත් මට විසුමක් වෙන්නේ නෑ කියල මම දන්නවා"

DILEEP PRASANNA



Scanned with CamScanner

“ මේ ළමයි එන්ට එන්ට ම ලොකු වෙනව නොවැ” යි පවසමින් මහත තරබාරු කාන්තාවක් ඔවුන් සිටි තැනට ආවේ එවිට ය . ඈන් වහා දිව ගොස් ටින්කර්ගේ කුස්සි අම්මා , ආය අම්මා වූ ජෙනී ආදරයෙන් සිප ගත්තා ය .

“ මේ පාරවත් එක එක තඩමාරු වල වැටෙන් නැතුව එන්ට ඕන” යි ඈ වැඩි දුරටත් කියා සිටියා ය . “ සුබ ගමන් එහෙනම් හැමෝට ම”

“ ඔයත් සතුටින් ඉන්ට ජෙනී” යි ටින්කර් කීවේ සිනා වෙමිනි . “ මේ පස් දෙනා එක්ක ඉන්න කොට තඩමාරුවල පැටලෙන් නැතුව නම් ඉන්න පුලුවන් වෙය සිතන්ට බෑ”

DILEEP PRASANNA



Scanned with CamScanner

## 02 පරිච්ඡේදය

" මේක නම් මහා පාලුවට ගිය නගරයක් වගෙයි" යි ඇතත් මැතත් පිරික්ෂමින් ටින්කර් කී ය . " බලන්නකෝ තාමත් එක මනුස්සයෙක් වත් දකින්න ලැබුනේ නෑනෙ"

" ඒක ඇත්තයි" නැම්මක් වටා ප්‍රවේශමින් ධාවනය කරමින් ජූලියන් එකග වී ය . " එනකොටත් දැනගෙන හිටිය නිසා ඒ හැටි හිතන්ට එපා"

ඔහු එසේ සදහන් කළ ද නගරයක් මේ තරම් පාලුවට ගියේ කවර හේතුවක් නිසා දැයි නොසිතා සිටීමේ හැකියාවක් ළමුන් තුල නම් පැවැත්තේ නැත . මුලුවනින් ම අතහැර තිබේ යැයි සිතිය හැකි ගර කඩ

DILEEP PRASANNA



Scanned with CamScanner

සාප්පු කිහිපයක් ද වාසයක් නැතැයි සිතිය හැකි නිවාස කිහිපයක් ද හැරුනු කොට වෙනත් කිසිත් ඔවුන්ට දක්නට නො ලැබින . මාර්ගය පවා කැඩී බිඳී කඩ තොලුව ගොස් තිබෙන ආකාරය දක්නට ලැබුනු අතර වාහනයේ ගමන් කිරීම හේතුවෙන් ඉහළට නැගී දූහුවිල්ල වලාවක් සෙයින් පසුපසින් රැස්වෙනු පැති කණ්නාඩියෙන් පසු පසට නෙත් හලන ජූලියන් දිටී ය .

“ ශ්‍රේලින් දේවස්ථානය ගාවින් තියෙන පුංචි පාර හොයා ගන්ට ජූලියන්” යි ඇන් එක් වර ම කියන විට ඔවුන් මෙපරිද්දෙන් තවත් මිනිත්තු කිහිපයක් ඉදිරියට ගමන් කොට තිබින . “ එතනින් වැටෙන පාරේ ටික දුරක් ගියාම තමා ශ්‍රේලින් ගොවිපොල තියෙන්නේ’

‘ හරි හරී” යි ජූලියන් එකග වී ය . “ ඒකට තව හැතැම්ම බාගයක් විතර යන්ට තියෙනවා නොවැ . ජෝර්ජ් සිතියම බලන්ට”

ජෝර්ජ් ඒ වන විටත් ඩික් ද හා සමගින් සිතියම අද්‍යනය කිරීමේ නිරතව සිටියා ය . එසේ වුව ද විටින් විට ඇයට බාදා එල්ල කරමින් මිස් වීෆ් ද පසු පස අසුනේ සිට සිතිය ම කියවීමට උත්සාහයක් ගත්තේ ය . සැබැවින් ම ළමුන් පිරිස හා නැවතත් එක්වන්නට ලැබීම සම්බන්දයෙන් ඌ ද සිටියේ සතුටිනි .

“ මට මාර සත්ත්ව ආකර්ශන බලයක් තමා තියෙන්නේ . එහෙන් ටිමී මගේ කකුල් දෙක උඩ නැගලා . එහෙන් මිස් වීෆ් මට සිතියම කියවන්ට දෙන්නෙ නෑ”

“ අර කඬේ නම් ඇරලා’ යි හදිසියේ ම ඩික් විස්මයෙන් කෑ ගසන විට ඔවුන් මෙපරිද්දෙන් තවත් මිනිත්තු කිහිපයක් ඉදිරියට ගමන් කොට තිබින

DILEEP PRASANNA



Scanned with CamScanner

. වහ වහා  ඔහු කී දෙසට හැරී බලන සෙස්සෝ කුඩා ආපන ශාලාවකැයි සිතිය හැකි යමක් දුටුවෝ ය .

නගරයේ දෙපස වූ දුර්වන බැම්මෙන් යාව ඉදිකළ නිවාස සංකීරන සම්පූර්ණයෙන් ම වසන ලද කවුලුවෙන්  යුක්ත වුව ද ආපන ශාලාවකැයි ඩික් විසින් සඳහන් කරන ලද ගෘහය තුලින් දක්නට ලැබුනේ එවන් පෙණුමක් නො වේ . එහි කවුලුව සහ ඉදිරි දොරටුව මුලුවනින් ම හැර දමා තිබූ අතර අපිරිසුදු පෙණුමෙන් යුක්ත වූව ද ආහාර ද්‍රව්‍ය කිහිපයකින් සමංචිත රාක්ක දෙකක් ද ඔවුන්ට දක්නට ලැබුණි . කඩයේ දොර අසල වැතිරී සිටි ලෝම හැලී ගිය ජරාජීර්ණ බල්ලා ඔවුන් රථය නැවතීමත් සමග බුරන්න්ට පටන් ගත්තේ ය . එසේ වතුදු ඒ වූ කලී තර්ජනාත්මක බිරුම් හඬක් නොව සාම්ප්‍රාදානුකූල සුනඛ චාරිත්‍රයක් බව පමනක් වැටහී ගියේ ඔවුන් කිසිවෙකුත් කලබල වූවේ නැත . ටිමියා හෝ මිස් වීෆ් වුව ද එකිනෙක දෙස බලා ගත් අත බලා මොනවාදෝ තෙපළගත්තා විනා අඩව් ඇල්ලීමට සීදානම් බවට සලකුනකුදු පළ නො කළ බව නම් සඳහන් කළ යුතු ම ය .

රථයේ ශබ්දයත් බල්ලාගේ අප්‍රාණශීලී බිරුම් හඬත් කරණ කොට ගෙන වෙලද හල් හිමියා යැයි සිතිය හැකි කාන්තාව කවුන්ටරයෙන් ඉවත්ව ඉදිරි දොරටුව දෙසට පැමිනියා ය . සැට වියෙහි පමන පසුවන මැහැල්ලක වූ ඈ කෙරෙන්ද පළ වූවේ අපිරිදු ජරා ජීරණ පෙණුමකි .

“ හලෝ කොහොම ද ?” යි අසමින් ජූලියන් ඈ දෙස බැලී ය . “ කඩේ ඇරල ද ?”

එන්ට ය යි අතින් සන් කරමින් මැහැල්ල ඇතුළට ගියා විනා වචනයක් හෝ කීවේ නැත . ඔවුන් පුදුමයෙන් යුතුව ටිමියා හා මිස්වීෆ් ද සමගින් ඇතුලට ප්‍රවිශ්ට වූවේ ය .



DILEEP PRASANNA
Scanned with CamScanner

ආපන ශාලාවේ බිත්ති මුලුවනින් ම දුර්වල ව ගොසිනි . කාලෙකින් එහි බිත්ති වර්ණා ලේපිත කරන බවට සලකුණකුදු දක්නට නොලැබිනි . කාන්තාව මේසය පිස දමා පුටු පහක් පිතටට ඇද්දා ය . එසේ වුව ද " මොනව ද ඕනේ ? සුබ දවසක්" ආදී වශයෙන් එකදු වචනයකුදු ඇ තෙපලුවේ නැත .

" අපිට අයිස් ක්‍රීම් ගෙනෙන්ට" යි සිස් රාක්කක්යේ කෙසෙල් ඇවරියක් ද පරණ යැයි සිතිය හැකි ගල් බනිස් කිහිපයක් ද හැරුනු කොට වෙනත් යමක් දක්නට නො වූවෙන් ජූලියන් කී ය .

" ඒවා මෙහෙ නෑ" යි ඇ කියා දැම්මේ ඒ බලාපොරොත්තුව ද බිඳ දමමිනි . " ඕනි නම් සැන්ඩ්විච් හදල දෙන්ට පුලුවනි"

" ලෙමනේඩ් තියෙනව ද ?" යි පරන පාන් වලින් සකසන ලද සැන්ඩ්විචස් සඳහා ද සුහදත්වයක් නො මැති ගැහැණියගේ ජරා ජීරණ පෙනුම ද සලකා බලා ඩික් ඇසී ය .

" ඔව් පොඩ්ඩක් ඉන්ට"

ඇ කඩයේ මුලුතැන් ගෙය දෙසට නොපෙනී ගිය අතර ඈන් ඇ පිටව යනවාත් සමග ම රහස් හඬින් යමක් කියන්නට වූවා ය .

"මේ ගෑනු කෙනා කතා කරන්ට කැමති නැති කෙනෙක් වගේ"

" ඔව්" යි ටින්කර් එකග වී ය . " ඒයි මිස්චීෆ් දග වැඩ නම් එපා ඈ"

ඒ වුනත් ඒ වන විටත් මිස් චීෆ් සිටියේ දග වැඩකට අර අදිමිනි . රාක්කය තුළ තබා වීදුරුවෙන් වසා තිබෙන කෙසෙල් ඇවරිය උගේ දැසට ගෙනාවේ නවමු බලා පොරොත්තුවකි .



DILEEP PRASANNA
Scanned with CamScanner

“ පාර පොඩ්ඩක් අහගන්ට තිබ්බ බලා පොරොත්තු සේරම ඉවර යි” යි ජෝර්ජ් කීවා ය . “ මෙතන ඉදන් කදු ....”

“ ෂ් ....”

හදිසියේ ම ජූලියන් විසින් නිහඬ වන්නයි සන් කළෙන් ජෝර්ජ් තවත් වචනයකුදු නොකියා වහා නිහඬ වූවා ය .ටිමියා පවා දෙකන් ඔසවා ගත්තේ යමක් ඇසෙන්නට තිබෙන බව හග වමිනි . ඒ හා සමග නිවසේ පසුපසින් කාන්තාව හා තවත් පිරිමියෙකු අතර රහස් හඬින් වන වචන හුවමාරුවක් ඔවුන්ට අසන්නට ලැබින . ඒ අතුරින් යන්තමින් හෝ තෝරා බේරා ගන්නට හැකි වූ වචන කිහිපයක් දක්වා තබන්නේ නම් ඒ මෙසේ ය .

“ උන් කවුද කියන්ට මම දන්නෙ නෑ”

“ පියතුමාට දැනුම් දෙන්ට වෙයි නේද ?”

“ නැතුව කොහොම ද ? නීතිය නම් නීතිය”

“ සෑහෙන කාලෙකට පස්සේ ආපහු සාර්ථකත්වය නගරයට ලැබෙනවා” යි මිනිසා වියරු සිනා හඬක් නැගී ය . “ දුකත් හිතෙනවා”

“ කවද හරි එහෙම මීට කලින් දුක් වෙලා තියෙද ?” යි මැහැල්ල සිනා වූවා ය . ‘ඔහේ ගිහින් පියතුමා ව දැනුවත් කරනවා . මම ඉස්සරහට යන්නම්”

තවත් වචනයකුදු නොකියූ මැහැල්ල කුටියෙන් පිතටට පැමියා ය . ඇගේ ගොරහැඩි මුවෙන් වදනකුදු නො දොඩා ලෙමනේඩ් විදුරු පහක් තිබූ බන්දේසිය ඇ මේසය මත තැබුවා ය . ජූලියන් ඇ හා කතාවට මගක් පදා ගත්තේ ඒ අතර ය .

“ හරිම රසයි මිසිස් ......?”

DILEEP PRASANNA

“ තොම්සන් කියන්ට”

“ ලෙමනේඩ් රසයි තොම්සන් නෝනා . ඔයාලා ගොඩක් කාලයක් තිස්සේද මේ කඩේ කරන්නෙ ?”

තොම්සන් නෝනා පුදුමයට පත් වූ බැල්මක් ඔවුන් දෙස හෙලුවා ය . ඊ ලගට ඇ කීවේ ලමුන් සිහිනෙනුදු අපේක්ෂා කළ නොකළ කි .

“ මම විතරයි . ඔව් සෑහෙන කාලයක් තිස්සේ’

“ ඔයා විතරයි ?” යි ටින්කර්ට කියවිනි . “ එහෙනම් ඔයා අර ....’

ටින්කර් කියන්නට සූදානම් වූවේ කුමක්දැයි සැකයක් ඔවුනට නොවී ය . ඩික් වහා මේසය යටින් එල්ල කරන ලද පා පහරක් හේතුවෙන් ඔහුගේ කතාව නැවතී ගත්තේ මුවට ගත් බීම ස්වල්පය හදිසියේ ම පිට ගිරියේ ගොස් කැස්සක් ඇති වූ බැවිනි .

“ නගරයේ මිනිස්සු නැද්ද වැඩිය ?’ යි ජුලියන් නැවතත් ඉක්මනින් ම තවත් ප්‍රශ්නයක් නැගී ය . “ ඔබ තුමී හැරුනාම අපි වෙන කවුරුවත් මගදි දැක්කේ නෑනෙ”

‘ ඉස්සර මේක බොහොම දියුණු වෙලා තිබුනු නගරයක්” යි ඇ කීවා ය . “ පස්සෙ මිනිස්සුන්ට නගරය එපා වුනා . දියුනු ලෝකෙට මිනිස්සු සංක්‍රමනය වෙන්නට පටන් ගත්තා . දියුණු ව කියලා ඒ මිනිස්සු යන්නේ පරිහාණියට කියල ඔවුන් තේරුම් ගත්තෙ නෑ”

“ මම ත් හිතන්නේ ගමක ජීවත් වෙන එක වාසනාව කියලයි . කයී බහුල නගරයක ජීවිතේට වඩා මේ වගේ සාමාන්‍ය ස්වභාවික ජීවිතය බොහෝම සුංදරයි’

DILEEPPRASANNA

“ අනිවාරෙන් ම” යි ගැහැණිය එකග වුවා ය . “ මිනිස්සු භෞතික විමුක්තිය ගැන හිතනවා . අධ්‍යාත්මික විමුක්තිය ගැන හිතන්නෙ නෑ . නූතන තාක්ෂණය යි අරව යි මේව යි කල්පනා කරල පරම්පරා ගානක් තිස්සෙ අනුගමනය කළ ප්‍රතිඵත්තීන් බල්ලට දානව . ඊට පස්සේ මිත්‍යාච්ච වැළඳගෙන පිට වෙනව . මිත්‍යාව ළමයෝ මිත්‍යාව . මිනිස්සු මේ දේවල් තේරුම් ගන්නෙ නෑ . මිත්‍යාව ට හසු උනු මිනිස්සුන්ට මේ වගේ ශ්‍රේෂ්ට නගරයක් ඉන්න වරම් දෙන්නෙ නෑ . ඒකට ආත්මීය පාරිසුද්‍යත්වය අත්‍යවශ්‍ය කාරණාවක්’

විටෙක කෝපවත් හඩින් ද විටෙක කලකිරුණු හඩින් ද මෙතෙක් නිහඩව හුන් ගැහැණිය එක් අරම කියවන්නට වූවේ තොරතෝච්චියක් නැතිව ය . ඈ කියන්නක අරුතක් යන්තමින් හෝ නො වැටහුනෙන් ළමුන් පිරිස ඇස් දල්වා බලා සිටියා විනා වෙනත් යමක් අසන්නට ගියේ නැත . නගරයේ පරිහාණියට හේතුව ආගමික කරුණක් ද යන ගැටලුව ජුලියන්ගේ සිතේ නැගෙන්නට ඔන්න මෙන්න කියා තිබිය දී ය මිස් චීෆ් සියල්ල අපහසු තාවයට ලක් කරමින් රාක්කයේ වූ කෙසෙල් ඇවරිය ඩැහැ ගත්තේ .

“ ඒයි ඕක තියපන් ..” යි ගැහැනිය කෑ ගැවා ය . “ මගෙන් මන්නා පාර කන්නෙ නැතුව ඕක තියපන් ..”

මන්නා පාර කෙසේ වතුදු මිස්චීෆ් ඇයට දිව ද ඇද විරිත්තා වේගයෙන් රාක්කය මත ට නැගුනේ ය . අනතුරුව කෙසෙල් ඇවරිය මුවේ තබා ගත් මිස්චීෆ් වහළයේ ලීයක එල්ලී පැද්දි ළමුන්ගේ මේසය මතට පැන්නේ ය . ගැහැණිය කෝපාවිෂ්ටව බැන වදින්ටත් ,

“ ජේම්ස් …..”

යි මුර ගාන්ටත් වූවේ එක ම මොහොතේ ය .

DILEEP PRASANNA



Scanned with CamScanner

එසේ මුර ගැවද කිසිවෙකුත් පසුපස කුටියෙන් මතු වූවේ නැත . ටිමීගේ බිරුම් හඬ ද හේතු කොටගෙන එක ම කලබගැණියක් ආපන ශාලාව තුළ මේ වන විට මතුව තිබුණි .

“ ටින්කර් බකන් නිලා ඉන්නෙ නැතුව මිස්වීෆ්ට කතා කර ගන්නවා”

පැමිණෙන්ට ය යි මිස්වීෆ්ට හඬ ගාන්නට කිහිප වතාවක් ම ටින්කර්ට සිදු වූවේ නැත . ඌ ඉක්මනින් ම කෙහෙල ඇවරිය ද අත හර කොලුවාගේ උරහිසට පැන ගත්තේ ය . ටින්කර්ගේ උරහිසේ වාඩිගෙන හිස ද ටින්කර්ගේ හිස මතට හේත්තු කොට ගත්තේ කිසිවක් සිදු නො වූ පරිද්දෙනි .

“ මූසල වඳුරා” යි කියමින් ගැහැනිය දිලිහෙන දෑසින් යුතුව කොස්සක් ද රැගෙන ටින්කර් දෙසට පැමිනියේ ය . ඇන් දුන් ටින්කර්ගේ උරයේ සිටින ඉස් වීෆ්ට කොසු පහරක් වැදී කුදාගේ මදුරුවා මැරීමට පොල්ලෙන් හිසට ගැසූ කතාව අද්දකින්ට වේදැයි තැති ගැන්මක් ඈන් තුල ඇති වූවේ ඒ හාත් සමග ය . දැවැන්ත බිරුම් හඬක් නගා ගත් ටිමී ගැහැණිය ඉදිරිපිට විලිස්සා ගත් මුවින් ද යුතුව රැක ගත්තේ , වචනයේ පරිසමාප්තයෙන් ම කාන්තාව තැති ගැන්මට ලක් කාරමිනි .

‘ පලයල්ලා මෙතනින්” යි තත්පර කිහිපයකට පසු ඈ යටි ගිරියෙන් බෙරිහන් දුන්නා ය . “ කාල කන්නි”

“ ටිමී මෙහෙ එනවා” යි කියමින් ජෝර්ජ් ටිමියා අල්ලා ගත්තා ය .

“ හරි” යි අවසානයෙ ජූලියන් නැගී සිටියේ ය . “ ඔයා කාත් කවුරුත් නැතිව කරගෙන යන කඩේනේ . කරගෙන යන්න . අමුත්තන්ට හොඳින් සලකන්ට නො දන්න මිනිස්සු ඉන්න ටවුමක් පාලුවට යන එකේ පුදුමයක් නෑ”

DILEEP PRASANNA

“ ඇත්ත ද ? උඹලැ වඳුරු තඩියානෙ මගේ කඩේ කෙසෙල් ඇවරිය හොරකන් කරේ”

‘ මිස්චීෆ් ට මම කොහොමත් කෙසෙල් ඇවරියක් අරන් දෙන්ට තම හිටියෙ . ටින්කර් ඕක මිස් චීෆ්ට ඇහිදලා දීපන් ..’

ටින්කර් උරහිසේ රැදෙන වඳුරු නාම්බාට කෙසෙල් ඇවරිය නැවතත් අරන් දෙන්නට නැඹුරු වූවේ ය . ඒ හාත් සමග ම ඔහු දුටු යමක් හේතුවෙන් ටින්කර් තිගැස්මට ලක් වූවේ ය .

කාන්තාව හැද සිටි දිගු ගවොම තුලින් ඇගේ වලලුකර ප්‍රදේශය යන්තමින් නිරාවරණය වැ තිබෙයි . ඇගේ එක් පාදයක් සමෙන් මසෙන් නොව නිර්මානය වී තිබෙන්නේ දැවයෙන් බව ඔහුට දක්නට ලැබුනේ එවිට ය .

“ ගාන කීය ද ?” යි ජුලියන් නොරිස්සුම් හඩින් විචාලේ ය . “ මෙතන ඉදන් දේවස්ථානෙට තියෙන දුර කිව්වොත් තවත් සිලිමක් දෙනව”

‘ දේවස්ථානෙත් කණපිට හරවන්ට ද කල්පනාව ?”

‘ ඒකෙන් ඔහේට තියෙන වැඩේ මොකක් ද ? කරුනා කරල ගාන කීවොත් අපිට මේ කරපු ටවුමෙන් එලියට යන්ට පුලුවන් ඉක්මනට”

වැඩි කැමැත්තකින් තොරව වුව ද ජූලියන් ප්‍රදර්ශනය කරමින් හුන් සිලිමේ කාසිය දෙස හොරැහින් බැලුම් හෙලූ ගැහැණිය “ හැතැම්ම භාගයයි” යි ඇසෙන නො එසෙන හඩින් කියා දැම්මා ය . වහ වහා මුදල් මේසය මත දැමූ ළමෝ තවත් මොහොතකුදු පමාවකින් තොරව ටිමී ද මිස් චීෆ් ද සමගින් අවන් හලෙන් පිතටට බටහ .

“ මහ පුදුම ගෑනියෙක්” යි කියමින් ජෝර්ජ් නිහැඩියාව බිඳ දමන විට ඔවුන් ගමන් අරඹා තවත් මද වේලාවක් ගත වී තිබිනි . “ තව පොඩ්ඩෙන් ටින්කර්ගෙ ඔලුව ඉවරයි”

“ අහා ඒ විදිහට කළා නම් මං එයාගෙ ලී කකුල ගලවනවා” යි ටින්කර් සිනාවක් පෑවේ ය . “ දැක්කෙ නැද්ද එයා ලී කකුලක් දාගෙන හිටියෙ”

“ කාත් එක්ක හරි වාදෙකට ගිය වෙලාවක කකුල ගලවන්ට ඇති” යි ඩික් කීවේ ය . “ ඊටත් අපි එක්ක කියපු බොරු කන්දරාව බලන්ට එපායැ”

“ මම ඒක ගැන කියන්ට ගිය වෙලාවෙ මගේ කකුලට ගැහුවෙ ඇයි ?’

‘ මා දිහා ඔහොම බලන්ට එපා .. ඔයාට කට පරිස්සම් කරගන්න බෑ ටින්කර් . එක පාරක් මතකද තාත්තගෙ ලියවිලි හොරකම් කරන්න වූ කියල සර්කස් කාරයෙක්ට පොටක් පෑදුනා . ඒක වුනෙත් උඹේ කට හින්දනෙ” ( පන් පසිඳුවන් 21 – අවසන් වික්‍රමය කියවන්න) ඒ ඩික් ය .

“ කොහොම හරි ඇයි ගෑණු කෙනා අපට බොරු කීවේ කියන එකයි මට තියෙන ප්‍රශ්නෙ’ යි යළි කතා කරමින් ජූලියන් දැන්වී ය . “ මුලින් අපිට හොදට ම ඇහුණා ඇතුළෙ කාත් එක්ක හරි එයා කතා කරනවා . ඊට පස්සෙ කඩේ තනියම කරගෙන අවෙ වගේ දෙයක් කිව්වා . ඊටත් පස්සෙ මිස්ටීෆ්ගේ දිග වැඩ වෙලට පින්සිද්ද වෙන්ට ඇතුළෙ හිටිය මිනිහගෙ නම ජේම්ස් කියල දැන ගන්ට හම්බුනා”

“ සමහර විට මේ පළාතෙ පිරිමි ගෙයින් එළියට එන්නේ නැද්ද දන්නෙ නෑ නේ’ යි ජෝර්ජ් උපහාසාත්මක සිනාවක් පෑවා ය . “ මං මේ ළඟදි කියවපු ටාර්සන් පොතකත් ඔහොම කතාවක් තිබ්බා . කාජි ස්ත්‍රීන් කියල ගෑණු ජාතියක් රාජධානිය පාලනය කරන්නෙ ..”

DILEEP PRASANNA



Scanned with CamScanner

“ ඒ වුනාට ජූ ඔයා අර ගෑණු කෙනාට කතා කළ විදිහ මගේ හිතට ඇල්ලුවේ නෑ” යි ඈන් එක්වර ම කීවා ය . “ මොකක්ද ඒ ? කිසිම හැදියාවක් නෑ වගේනෙ . මට මතක් වුනේ බිලිකොක් ෆාම් එකේ ටෝබි ව” ( පන් පසිදුවන් 16 බිලිකොක් කන්දේ අබිරහස කියවන්න)

“ අහා ඒව එහෙම තමා ඉතිං . කොහොමත් මම දැං ඉස්සර ජූලියන් නෙමේ . වයස අවුරුදු 19 ක හැඩි දැඩි කොල්ලෙක් …”

ඔවුන්ගේ සිනා හඩ කලෙකට පසු නගරයට මුසු වී ගියේ ය . තවත් කිසිදු අනපේක්ෂිත එකදු සිදුවීමකින් හෝ තොරව දේවස්ථානය අසළට පැමිනි ඔවුහු මොහොතකට වාහනය නවතා ඒ දෙස විපරම් කරන්නට වූ හ.

එය ඉතා පෞරාණික ඉදිකිරීමකැයි කියන්නට දර්ශන මාත්‍රයක් පමනකුදු ප්‍රමානවත් ය . උස් පඩිපෙලින් අවසන දේවස්ථානයේ දොරටුවත් ඒ මත තිබෙන කුරුස ලකුනත් දෙස ළමෝ බලා සිටියෝ ය . කුරුසයේ ඉහල කණුව බිදී ගොස් තුබූ අතර කිසිදු ප්‍රතිශංස්කරණය ක් සිද නො වූ බව හගවමින් එකී අඩුව තව දුරටත් පැවැත්තේ ය . එසේ ම පල්ලියේ දොරටුව වසා තිබුනු බව ද සඳහන් කළ යුතු ය .

“ කවුරුත් නැති හැඩයි” යි ටින්කර් කී ය . “ බල්ලෙක් වත් නෑනෙ’

“ හැම තැන ම පාලුවට ගිහින් තියෙන එකේ ඒ ගැන පුදුම වෙන්ට එපා” යි ජෝර්ජ් පිළිතුරු දිනි. “ අපිට ළඟදි ම ලොකු ප්‍රශ්නයකට මුහුන දෙන්ට වෙනවා”

“ ඒ මොකක් ද ?’

“ කෑම .කෑම ගන්ට තැනක් නැති වෙයි . ඉස්සරලා ගිය කඩේ පැත්තෙ නම් ආයෙ යන්ට බෑ”

DILEEP PRASANNA

“ ඒ ගැන බය නො වී ඉන්ට” යි ජූලියන් කීවේ ය . “ ශ්‍රේලින් ගොවිපොළ කියලා එකක් තියෙන බව අමතක වුනා ද ? ගමේ නමෙන් ම තියෙන එකේ එතන සරුවට ඇති”

ඒ හා සමග ම නුදුරු වන පෙත දෙස විමසුම් ඇසින් බලා ටිමී ගෙරවුම් හඬක් නැගුවෙන් ළමෝ මොහොතකට එදෙසට නෙත් හෙලූ හ .

“ඇයි ටිමී ? කවුරු හරි ඉන්නව ද ?”

“ හාවෙක් වෙන්ට ඇති” යි ඩික් සිනා වූවේ ය . “ ජෝර්ජ් මූට යන්ට නම් දෙන්න එපා . මතකනේ වතාවක් හා ගුලක වැටිලා පශුවෛද්‍ය කෙනෙකුත් හොයන්ට යන්ට වුනා . මේ ගමෙ නම් ඒ වගේ දෙයක් බලා පොරොත්තු වෙන්ට එපා”( පන් පසිඳුවන් 10- අඳුරු විලේ වික්‍රමය කියවන්න)

මිස් චීෆ් ද ප්‍රශ්නය අවබෝධ කලාක් මෙන් ටිමියාගේ කර බදා ගෙන පිට මත නැගී ගත්තෙන් දීර්ඝ කාලීන විමර්ශන කටයුත්තක් සඳහා ටිමියාට ඉඩ ලැබුනේ නැත .නමුත් ඒ මොහොතේ එවන් යමක් සිදු නොවිනි නම් ඔවුන් දෙස පදුරු අතරින් බලා සිටින්නෙකු හැක බලා ගැනීමට ළමුන්ට අවකාශ සැකසෙනවා නිසක ය .

“ පල්ලියට ගිහින් බලමු ද ?’ යි හදිසියේ ම ටින්කර් ඇසුවේ කිසියම් වූ කුතුහලයක් ඔහුට දැනෙමින් තිබූ බැවිනි .

‘ දැං වෙලාවක් නෑ යි” යි ඔරලෝසුව දෙස බැල්මක් හෙළමින් පෙරළා තම වාහනය දෙසට පැමිනෙමින් ජූලියන් කීය .. “ ඉක්මනින් අර කියන ගොවිපල හොයාගෙන ගිහින් ඊට පස්සේ කඳුකරයට යන්න තියෙනවා . ඊට පස්සේ කූඩාරම් ගහන්න තියෙනවා . බලන්න තව කොච්චර දේවල් කරන්න තියෙද කියලා . දැනට ම හවස් වීගෙන එන්නේ’’

DILEEP PRASANNA



Scanned with CamScanner

ඒ අනුව නැවතත් ගමන් අරඹන ලද ළමුන් පිරිස වම් පසට විහිදෙන මාවත ඔස්සේ ඉදිරියට ගමන් කරන්නට විය . එය ගොවි පොළේ සිට ප්‍රධාන මාවත දක්වා බඩු භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන්නකැයි සිතිය හැකි එකකි . මාවත දෙපසින් වැවී ගත් සණ හෙදර් යාය ද , ඊට ඔබ්බෙන් වන වගා කටයුතු සිදු කළ තිබූ තැනි තලා භූමි භාගයන් ද ක්‍රමයෙන් වන ගත භූමි සීමාවක් කරා ඔවුන් සේන්දු වන බවට සලකුනු තබා තිබුණි . ඈතින් වන විශාල ගොවි පලක සේයාව හදිසියේ දර්ශනය වන විට ඔවුන් යය්හොක්ත මාවත කරා එළඹ වැඩි වේලාවක් ගතවැ නොතිබිණි .

තන් තන්හි උලා කෑමෙහි නිරතවන එලුවන් සමූහයක් ද කිකිළියන් රංචුවක් ද පසු කරමින් ඔවුහු ඉදිරියට ගමන් ගත්තෝ ය . එක් වරම ගොවි නිවස ඉදිරියෙහි රථය නතර වීමත් සමග බල්ලන් කිහිප දෙනෙකු විසින් නගන ලද බිරුම් හඩක් ද ඊට ප්‍රතිචාර වශයෙන් ටිමීගේ ගෙරවුම් හඩ ද අසන්නට ලැබිණි . හොදින් හැද පැළඳ ගත් මිනිසෙකු දොරටුව අසළින් මතු වූවේත් ළමුන් රථයෙන් බිමට බැස්සේත් එක ම මොහොතේ ය . සැට වියේහි පමන වන්නෙකැයි සිතිය හැකි මිනිසාගේ ආගමනයත් ඔහු විසින් කරන ලද ඉගියත් හේතු කොටගෙන කාලවරණ බලු ආරක්ෂකයින්ගේ බිරුම් හඩ එක්වන ම නැවතී ගත් අතර පෙර දුටු අමුත්තියගේ මෙන් නොව සිනහවෙන් පිරී ගත් මුහුණක් ඔහු තුළ වීම ඔවුන්ගේ දැඩි සැන සිල්ලට හේතුවක් වූ බව නම් සඳහන් කළ යුතු ම ය .

“ හලෝ” යි පවසමින් ජූලියන් කතාව ඇරබී ය . “ මේ ග්‍රේලින් ගොවිපල වෙන්ට ඇති ?’

“ ඔව්” යි අනෙකා පිළිතුරු දුන්නේ ය . “ ඔය ළමයි කවු ද ?’

“ කඳුකරයේ නිවාඩුවක් ගත කරන්ට කියල ආවේ . ඔයාලගෙ ගොවිපල ගැන සිතියමේ දැක්කා”



DILEEP PRASANNA

Scanned with CamScanner

“ අවුරුදු ගානක ඉදන් සිතියම් වල අපි ඉන්නවා නොවැ” යි මිනිසා මද සිනාවක් පෑවේ ය . “ කාලෙකට පස්සෙ ආව සංචාරකයො ටිකක් . එන්න ඇතුලට . මාර්තා … මාර්තා …”

ඔහු මෙසේ හඬගාන්නා හා සමග නිවසින් පිතටට පැමිණියේ මිනිසාගේ ම වයසේ යැයි සිතිය හැකි කාන්තාවකි . සුහද බව පාමින් මද සිනාවක් පෑ ඇය ,

“ කාලෙකින් ආව සංචාරකයෝ පිරිසක් නොවැ .. අපිත් එක්ක ම තේ වලට ඉමු . දැං බඩගිනිත් ඇති නොවැ” යි කීවා ය .

“ අපූරු බාන්ඩයක් නොවැ . වදුරෙකුත් ඉන්නවා”

ජූලියන් පෙරටු කොටගෙන ගොවි නිවසට ඇතුළු වූ ඔවුන් රැගෙන යන ලද්දේ තරමක විශාල කෑම කාමරයක් වෙත ය . විවිද ආහාර වර්ගයන්ගෙන් පිරී ගත් කෑම මේසයක වාඩි ගැනීමේ අවස්තාව ඔවුන්ට උදා වූ අතර ගොවියාත් ගොවි බිරිදත් හැරුණු කොට තවත් තරබාරු සිරුරැති මිනිසුන් දෙදෙනෙකු ද තේ පානය සදහා ඔවුන් හා සමගින් අසුන් ගත්තේ ය. හැඩි දැඩි මිනිසුන් දෙදෙනා දෙස බලන ජූලියන් ඒ මිනිසුන් දෙදෙනාගේ මුහුනු තුළ නම් ගොවියාගේ හෝ ගොවි බිරිදගෙන් දක්නට ලැබෙන සුහද බව දක්නට නොලැබෙන බව අවබෝද කොට ගත්තේ ඒ මුහුණු වල එකදු හසරැල්ලක සලකුනකුදු දක්නට නො වූ බැවිනි .

“ මේ හෙක්ටර් .. මේ නිව්ටන් ..’ යි ගොවියා විසින් ඔවුන් දෙදෙනා හදුන්වා දෙනු ලැබී ය . “ දෙන්නම මගේ දරුවො .. ගොවිපල තාමත් දුවන්නේ මේ දෙන්නා නිසා තමයි”

“ ඇත්තට ම මේ නගරෙ වැඩිය කවුරුවත් නෑ නේද ?”

DILEEP PRASANNA

“ ඔව් .. ඉස්සර ගොඩාක් මිනිස්සු හිටපු තැනක් . ඒ වුනාට දැන් ගොඩාක් අය නගරය දාලා ගිහින්ලා .ඉස්සර ශ්‍රේලින් කියන්නේ සැහෙන්න ගොවිපොලවල් තිබුනු තැනක් . දැන් දෙකයි තුනයි තියෙන්නේ . ඒ අතරින් පරණ ම එක මේක වෙන්න ඕන”

ජූලියන් සිනා මුහුණින් ම යුතුව තවත් සෙන්ඩ්විච් එකක් අතට ගත්තේ ය . ඒ අතර තවත් මිනිතුතු පහක් පමණ ගෙවී ගියේ නිහඩතාවයේ ය . ඒ නිහඩතාවය අතර තුර වේගවත් ආහාර ගැනීමක නියැලුනු ගොවි පුත්‍රයෝ සිනාවකුදු නොහෙලා පිටව ගියෝ ය . ඔවුන් දෙදෙනා අතුරින් නිව්ටන් ය හගවන ලද මිනිසා ඈන් දෙස ගැඹුරු බැල්මක් හෙලුවෙන් ඈ බෙහෙවින් ම තැති ගත්තා ය . ළමුන් දෙස හෙලූ බැල්මට ප්‍රතිචාරයක් වශයෙන් දෝ ටිමියාගෙන් සිහින් කෙදිරියක් නැගුනු බව නම් සඳහන් කළ යුතුව තිබේ.

“ ඒ දෙන්නා ඔහොම තමයි” යි ඈන් දෙස බලමින් ගොවියා මද සිනාවක් පෑවේ ය . “ මේ ගමේ දැං ඉන්න ගොඩක් මිනිස්සුන්ගෙ ඇවතුම් පැවතුම් ඔය විදිහයි . ඒකට හේතුව එයාලට අමුත්තො පුරුදු නෑ . අවුරුදු ගානකින් මේ පැත්තටට කෝච්චිය හැරුණා ම කවුරුත් ඇවිත් නෑ . ඉතිං කියමු බලන්න ඔයාල කවුද නම් ගම් මොනව ද කියලා”

“ මම ජූලියන් .. මේ මගේ නංගිලා මල්ලිලා”

“ නංගිලා මල්ලිලා කීවේ මේ දෙන්නත් එක්ක වෙන්න ඇති ?” යි මිස්චීෆ් සහ ටිමියා දක්වමින් මිනිසා මද සිනාවක් පෑවේ ළමුන් කවුරුත් සිනා ගන්වමිනි .

“ දැන් නම් ඒකත් ඒ වගේ තමා . මේ ඩික් . මේ ජෝර්ජ් මේ ඈන් .. මේ ජෝර්ජ්ගේ බල්ලා ටිමී . මේ මිස්චීෆ් . ආ මේ අපේ හොද ම යාලුවෙක් ටින්කර් .මිස්චීෆ් ගේ සහෝදරය”

“ හරිම අපූරු පිරිසක්නේ .”



DILEEP PRASANNA

Scanned with CamScanner

එකගත්වය පාන්නට මෙන් මිස් චීෆ් ගොවියා දෙස බලමින් දිව එලියට ඇද්දේ ය . උගේ අතක් ටින්කර් දෙසට යොමු කොට පාන් පෙත්තක් අතට ගත්තේ ය . පාන් පෙත්තක් අතට ගෙන ඉන් කැබෙල්ලක් අනුබව කොට ඉතිරි කැබැල්ල ටිමියා වෙතට දිගු කලේ ය .

" නියමයිනෙ" යි ගොවියා විසම වී ය . "මේ තරම් හැකියා තියෙන වඳුරෙක් දැක්කේ අවුරුදු ගානකට කලින් සර්කස් එකක . මාත් කොල්ලා කාලේ"

" ඔබ තුමාගෙ නම මොකක් ද ?"

" සැම් . ගොඩක් අය සැම් කියනවා . ගමේ නම ඇඩිය කවුරුත් එහෙම කියන්නෙ නෑ . මොකද මිනිස්සු අඩුයිනේ . අපි මෙහෙ ඉදන් එලවලු පලතුරු අරගෙන ප්‍රධාන නගරෙට ම යනවා . ඒවා විකුන ගන්න . මගේ සහෝදරයා ගේ නමත් සැම් . අපි හැමෝගෙම නමේ වාසගම ග්‍රේලින් .."

" නගරෙ නම ම යි ?"

" ඇත්තට ම ඒක වෙන්නේ මෙහෙම යි . මේ නගරේ ආරම්බ කරන්නේ අවුරුදු  සිය ගානකට කලින් අපේ මුතුන් මිත්තන් විසින් . ඊට පස්සෙ අපි ඒක සාරවත් නගරයක් කරා . දැං මේ මගේ කාලෙ විතර වෙනකොට නගරය අභාවයට ගිහින් තියෙන්නෙ . ඔය ළමයි පල්ලිය දකින්ට ඇති ?"

" ඔව්" යි ඩික් කී ය . " නමුත් කවුරුවත් හිටියෙ නෑනෙ"

" පූජක තුමා ඇතුළෙ ඉන්ට ඇති . මගේ සහෝදරයා තමයි ඒ"

ළමෝ මද වේලාවක් කල්පනාවේ නිමග්න වූ හ . ඔවුන් ප්‍රථමයෙන් ඇතුලු වූ වෙලද සැළ සම්බන්දයෙන් වැඩි යමක් ඇසීමේ වුවමනාවක් ළමුන් තුළ වුව ද එවන් කතාබහකට මේ අවස්ථාව නොවෙන බව ඒ හාම ජූලියන් තීරණය කලේ ය .

DILEEP PRASANNA

“ මෙතන ඉඳන් ග්‍රේලින් කන්දට කොයි තරම් දුර ද ?” යි අන්තයේ ජූලියන් ඇසී ය .

“ ඒ හැටි දුරක් නෑ . ඒක ආරම්භ වෙන්නෙ ගොවිපල ඉවර වෙනවත් එක්කම . මම ඔයාලට ඉරිගු යායක් පෙන්වන්නම් . ඒක දිගේ ම ගියාම කන්ද පටන් ගන්න තැනට යන්න පුලුවන් . ඊට පස්සෙ අනන්තයට යනකම් ම ඔයාලට ඇවිදින්න පුලුවන් . හැබැයි වාහනයකින් නම් යන්න බැරි වෙයි”

“ අපේ වාහනේ ගොවිපොලේ දාල ගියාට කමක් නැති වෙයි නේ ද ?”

“ ඒකට මට නම් කමක් නෑ . වාහනේ ගොවිපොලේ තියෙන්ට හරින්ට . එහා පැත්තෙන් තියෙනවා අපි වාහන ගාල් කරන තැනක් . ඔය වගේ නවීන පන්නයේ මෝටර් රථයක් එතනට දාන එකත් ආඩම්බරයක්”

ඩික් උපහාසාත්මක සිනාවක් නගා ටින්කර් දෙස බලනු ජූලියන් දුටුවේ නැත .

“ හොඳයි සර්” යි ජූලියන් කීවේ ය . “ එහෙනම් අපි දැන් ම ගමන පිටත් වෙන්නම් . කූඩාරම් බඩුත් අරගෙන යන්න තියෙන නිසා ඉක්මන් කරන එක හොඳයිනේ”

“ ඒක හරි . අනිත් කාරණාව ළමයෝ මතක තියා ගන්න .කෑම බඩු ගන්න ඕන වුනා ම ගොවිපොළට ඇවිත් යන්න . ඔය ළමයින්ට මේ පැත්තේ එන්න මොකක් හරි අපහසුතාවයක් තියෙනව නම් මේ බල්ලාගේ හරි වඳුරාගේ හරි අතේ පණිවුඩයක් එවන්න”

ඒ අනුව ඔවුන් දෙදෙනාට ස්තූති වන්ත වූ ඔවුහු වහ වහා මෝටර් රථයෙන් ලබා ගත යුතු ආම්පන්න සියල්ල මලු වල එල්ලා ගෙන ගමනට

DILEEP PRASANNA

සූදානම් වූහ. ජූලියන් තම ආඩම්බරකාරී කාරය ගොවියාගේ වාහන ගාල් කොට තැබූ නිවස්නය කරා රැගෙන ගියේ ය .

තවත් නො බෝ වේලාවකින් ම ගමන් ඇරඹූ ඔවුහු ගොවි නිවස පසුපසින් වන විශාල ඉරිගු යාය පසු කරමින් ඉදිරියට ගමන් කරන්නට වූවෝ ය . ඈත කිසියම් කටයුත්තක නියැලෙන ග්‍රේලින් දෙසොහොයුරන් දක්නට ලැබුන ද ළමුන් දුටු බවට හගවන බැල්මකුදු නො හෙලා ඔවුහු තම තමන්ගේ රාජකාරී කටයුතුවල නියැලුනෝ ය . ක්‍රමයෙන් බිම උස්ව නැගෙන්ට වන බව ළමුන් අවබෝද කොට ගන්නා විට මෙපරිද්දෙන් ගමන් අරඹා වැඩි වේලාවක් ඔවුන් ගත කොට තිබුනේ නැත .

සූයීා මේ මොහොතේ පැවැත්තේ බැස යමිනි . එබැවින් දැඩි තාපයක් නො දැනුන ද බිම ක්‍රමයෙන් උස්ව නැගීමත් , උරයේ තුබූ මලු වලින් දැඩි බරක් දැරීමත් හේතු කොටගෙන ගමන කිසිසේත් පහසු වූවේ නැත . හමා යන මන්ද මාරුතය කරණ කොටගෙන සැලෙන උස්ව වැවී ගත් පදුරු සහ තුරු ළතා මද සහනයක් ඔවුන් ගේ සිරුරු වෙත රැගෙන ආ බව සැබෑ ය . කරුණු කාරණා එසේ වතුදු විටින් විට නැවතී හෙදර් පදුරු මත වාඩි වැ විඩා නිවීමට ළමුන්ට සිදු වූ බව නම් සදහන් කළ යුතුවැ ඇත .

“ ටිමියා හාවො පස්සෙ දුවන එක නවත්ත ගන්ට” යි හදිසියේ ළමුන් ට වඩා වැඩි වේගයකින් ඉදිරියට යාමට සූදානම් වන බල්ලා දෙස බලමින් ටින්කර් කී ය . “ මොකක් හරි හා ගුලක එහෙම හිර වුනොත් ලොකු ඇබැද්දියක් වෙන්නේ”

“ හරී” යි යළිත් කර පටියෙන් අල්ලා ගනිමින් ජෝර්ජ් කීවා ය . “ මම නැතත් මිස් වීෆ් එයාව බලා ගනී . ජේනවනේ ළගින් ම යන හැටි”

“ අපි තව කොයි තරම් දුරක් යන්න ඕන ද ජූලියන් ?”



DILEEPPRASANNA

Scanned with CamScanner

“ තව පොඩි දුරයි . හොදට අහල බලන්න දිය අල්ලක හඬක් ඇහෙනව ද කියලා . අන්න ඒ දිය පාර හොයා ගත්තම අපේ ගමන එතනින් ඉවර වෙනවා . ඊට පස්සේ තියෙන්නේ ගෙනාව ටෙන්ට් රෙදි දෙකෙන් කූඩාරම් ගහ ගන්ට විතරයි”

අයියාගේ උපදේසය අනුව එතැන් සිට ඔවුන් ගමන් ගත්තේ දැසට වැඩි අවදානයක් දෙකන් මත රදවා ගෙන ය . ප්‍රථමයෙන් ම දිය ඇල්ලක හඬ ඇන් විසින් සොයා ගන්නා ලද අතර හඬ ආ දෙස ඔස්සේ ඉදිරියට ගමන් කරන ළමයින්ට නො බෝ වේලාවකින් ම කඳු මුදුනේ සිට ගලා බස්නා සොදුරු දිය පහරක් දැක ගැනීමට හැකි යාව ලැබිණ .

වචනයේ පරිසමාප්තයෙන් ම ඔවුන් සිටියේ සුන්දර භූමි භාගයක ය . කඳු මුදුනේ සිට පහළට ගලා බසිනා දිය ඇල්ල වටා නේක විද මල් පැල වැවී තිබෙන්නේ ය . කැලා මල් මේ තරම් සුන්දරදැයි සිතෙන තරමට ඒවා සුන්දර ය . දිය පහරේ ගලා බැස්මට සමපාතව යමින් විවිද සත්සර නාද රටා එක් කරන සියොත් කැලක ගේ හඬ ද ඔවුන්ට අසන්නට ලැබිනි .සැකෙවින් සදහන් කරන කල ඒ වූ කලී සිහිණ ලෝකයක් හා සමවන භූමි භාගයකි .

“ මට තිබහයි වෙහෙසයි මහන්සියි’ යි පවසමින් මල්ල බිම දැමූ ඩික් වේගයෙන් දිව ගොස් දිය පහරට පැන්නේ ය . “ මාර සීතල වතුර ටික …’

ටිමී ද මිස් චීෆ් ද සිරුරු පුරා දිය නා ගැනීමට ඒ මොහොතේ ම වාසනා වන්ත වූහ .

“ කූඩාරම් දෙක හදල ඉවර වෙලා නා කියා ගන්ට පුලුවන් නොවැ’ යි ජූලියන් කීවේ ඔරලෝසුව දෙස බැල්මක් හෙලමිනි . “ නැත්තම් ආයෙත් දාඩිය දා ගන්ට වෙන්නේ”

“ ඒක ඇත්ත’ යි ඈන් එකග වූවා ය . “ කට්ටිය ම එන්න”

DILEEP PRASANNA



Scanned with CamScanner

ඒ අනුව දිය නෑමේ කටයුතු මොහොතකට නැවතූ ළමෝ වහ වහා කූඩාරම් සවි කිරීමේ කටයුතුවල නියැලුනෝ ය . මිස් චීෆ් විවි ද කළමනා ඔවුන් අතරට රැගෙන එමින් උපකාර කළ තර ළමුන්ගෙන් වැගිරෙන් දහදිය ලෙව කමින් ටිමියා ද කිසියම් වූ උපකාරයක් ලබා දීමේ කැමැත්තෙන් පසු වූවේ ය .

තවත් පැය බාගයක පමණ කාලයක් ගත වෙන විට මනා කොට ඉදි කරන ලද කූඩාරම් දෙකක් ඔවුන් අබියස වී ය .

" රෑට ගිනි මැලයක් ගහන්න දර ටිකක් එකතු කරල ම නාන්ට යමු" යි කුස්සි අම්මාගේ කටයුතු ස්ව කැමැත්තෙන් ම බාර ගත් ඈන් හදිසියේ යෝජනා කරන විට ආකාශය මද ලා රත් පැහැයක් ගෙන රාත්‍රී අඳුර ක්‍රමයෙන් සමීප වෙමින් තිබ්න .

" එකගයි"

ඒ අනුව ඉනික්බිති ගතවන මිනිත්තු පහළොවකට ආසන්න කාලය ළමුන් ගත කළේ වියලි දර ඉපල් සෙවීම සඳහා ය . සොයා ගන්නා ලද දර ඉපල් කූඩාරම් දෙක මධ්‍යයේ ගොඩ ගසන ලද අතර මිස් චීෆ් ද නැවතත් ප්‍රයෝජනවත් රාජකාරියක් ඉටු කළේ ය .මනුස්සයෙකුගේ සෙයියාවෙන් ගමන් ගනිමින් කූඩා වදුරු පැටියා හැකි හැකි ලෙසින් දර කැබලි ඇහිදගෙන ආවේ ය .

කටයුතු සියල්ල මෙපරිද්දෙන් අවසාන කොට වහ වහා නාන ඇඳුම් වලට බට ළමයි දිය නෑම සඳහා දිය ඇල්ල වෙත පිනූහ . අතිශයින් ම නැවුම් සීතල දිය දහර ගත මෙන් ම ඔවුන්ගේ සිතත් ප්‍රබෝදවත් කරන ලදී .

රාත්‍රී අඳුර පැතිරීමත් සමග නැවතත් කූඩාරම් කරා සපැමිණි ඔවුහු දල්වන ලද ගිනිමැලය අබියස හිද රාත්‍රී ආහාරය අනුබව කරන්නට වූහ.



DILEEP PRASANNA

Scanned with CamScanner

“ මගේ කාර් එක පරිස්සමට තිබුනොත් ඇති” යි හදිසියේ ම ජූලියන් කීවේ ආහාර අනුබවය නිමා කොට සල්ලාපයේ යෙදෙන අතර තුර ය . “ ශ්‍රේලින් ලොක්කා සුවර් වුනාට මට අර මිනිහගේ පුතාලා දෙන්නා ගැන වැඩි විශ්වාසයක් නෑ’

“ ඒක ඇත්ත” යි ඩික් එකග වී ය . “ උන් දෙන්නා කාර් එකත් අරන් යාලුවෙක් එහෙම හම්බෙන්ඩ යයි ද දන්නෙ නෑ”

“ යාලුවෝ තියා සතුරෝවත් නැති නිසා ඒ ගැන නම් කලබල වෙන්ට එපා” යි ජෝර්ජ් මද සිනාවක් පෑවා ය . “ ඇත්තට ම මම කල්පනා කලේ ටිමීගෙන් වුනත් ආරක්ෂක කටයුතු වලට වැඩි ප්‍රයෝජනයක් වෙන එකක් නෑ මේ වතාවේ . මොකද මේ නගරෙ ඇත්තට ම මහ පාලු නගරයක්”

ජෝර්ජ් එසේ කීව ද නුදුරේ ම ඇගේ කියමන මුසාවක් වන බව ඒ මොහොතේ කිසිවෙකුත් දැන සිටියේ නැත . ආහාරයෙන් අනතුරුව කූඩාරම් කරා වැදුනු ඔවුහු අවටින් ඇසෙන නේක විද සංගීත සජ්ජායනා මැද , දැඩි වෙහෙසත් විඩාවත් හේතු කොටගෙන ස්වල්ප වේලාවකින් ම නින්දට වැටුනා හ .

DILEEP PRASANNA

## 03 පරිච්ඡේදය

---

කිසියම් සරසරයක් , වන සීමාව දෙසින් ඇසෙන්නා වූ සියුම් කලබ ගැනියක් හේතු කොටගෙන ටිමියා හදිසියේ අවදිවන විට මධ්‍යම රාත්‍රිය ආසන්න වැ තිබිනි . තමා අවදි කරවන ලද්දේ කුමක් විසින් දැයි දැන ගනු පිණිස දෙකන් ඔසවා ගැඹුරු විපරම් කිරීමක නියැලුනු ටිමී තම ස්වාමි දූත් ඇගේ හිතවතියත් අවදි නොකිරීමට තරම් ප්‍රවේශම් වූවේ සර සරය කුමක් නිසා නැගුනක්දැයි හරියාකාර අවබෝදයක් ඌ තුල නොවූ  නිසා ය . ඈතින් ඇසෙන හ්ම් හ්ම් හඬ බස්සෙකුගේ ගැඹුරු ගීයක් බව ඌ මනා කොට දන්නේ ය . කීං යන අනුකරණයෙ සංගීත බණ්ඩ වාදකයා අනිකෙකු නොව රැහැයියා බව ඌ දන්නේ ය . හමා යන මන්දමාරුතයට සෙලවෙන අතු ඉපලකින් නැගෙන හඬත් පයක ගැටීමෙන් බිදෙන ඉපලක හඬත් අතර ඇති සියුම් වෙනස පවා ටිමියා හඳුනන්නේ ය . එසේ වුව ද මේ ඇහෙන හඬ කිසියම් වූ අයෙකුගේ පිය ගැටෙන හඬක් බවට ඔහුට සැක නැත .

උගුර යටින් ඇසෙන නෑසෙන ස්වරයෙන මද හඬක් නගා ඌ කූඩාරමෙන් පිතටට ගමන් ගත්තේ ය .ගිනි මැලය මේ වන විටත් උලුවනින්

ම නිවී ගොස් තිබූ අතර එයින් ශේශව පැවැත්තේ කුඩා දුම් රැල්ලක් පමණෙකි . චන්ද්‍රයා නුදුරේ පැමිනෙන පසලොස්වක දවස ඉගි කරමින් මනා සේ පායා තිබුනෙන් කූඩාරම් දෙකින් පිතට වූවේ දිවා කාලයෙහි පවත්නාක් බඳු ආලෝකයකි . එලියකි .

පිරිමි ළමයින්ගේ කූඩාරම දෙසින් පිතටට පැමිනෙන දන්නා හඳුනනන හිතවතා මිස් චීෆ් බව ඌ හඳුනා අත්තේ ඉවෙනි . මිස්චීෆ් ටිමී අසළට ඇදී ආවේ ඌටත් මේ රාත්‍රී නිහඬතාවය යටින් සැඟවී කිසියම් නො පුරුදු නො හඳුනන හඩක් ශ්‍රවණ ය වැ තිබූ නිසා ම ය . ආරක්ෂකයෝ දෙදෙන බුද්ධිමතුන් වූහ . නිසියාකාර ව කරුනු කාරනා දැන හඳුනා ගැනීමකින් තොරව විඩා බර ළමුන් පස් දෙනා අවදි නොකළ යුතු බව උහු දැන සිටියා හ .

නිශාචර දෙපයක් ටිමියාට ඇස ගැසෙන විට මිස් චීෆ් ද හා සමග දෙදෙනා කඳුයායේ බෑවුම දෙසට මඳ දුරක් ගමන් කොට තිබිණි . කිසිදු ආලෝකයකින් තොරව සඳ එලිය පමණක උපයෝගී කොට ගනිමින් අමුත්තා රහසි ගත ගමනක නියැලී සිටින්නේ සූදානම් ශරීරයෙනි . කූඩාරම් යුගලය දෙදුරුම් කවන බිරුම් හඩක් නගන්නට ටිමියා සූදානම් වුවද ඒ නො කළ යුත්තකැයි හැඟී ගියෙන් දෝ හේ මිස් චීෆ් පසුපසින් දිගින් දිගට ම මිනිසා පිටිපසින් ගමන් ගන්නට තීරණය කොට ගත්තේ ය .

හැරත් අමුත්තාට කඩා පැණීම සිදු කළ යුත්තේ කූඩාරමට ආසන්න වුවහොත් පමණකැයි හේ සිතන්නට ඇත .

****************************************************

ඉක්බිති දින උදෑසන ප්‍රථමයෙන් ම අවදි වූවේ ඈන් ය . තමා සිටින්නේ කොහේදැයි සිහියට නගා ගැනීම සඳහා මඳ වේලාවක් ගතකළ ඈ අනතුරුව

DILEEP PRASANNA



Scanned with CamScanner

ජෝර්ජ් දෙස ද ඈ අසළ නිදා සිටින ටිමියා දෙස ද බලා තම හඩ අවදි කළා ය .

“ ගුඩ් මෝර්නින්ග් ජෝර්ජ්’

ජෝර්ජ් ඇණුම් මාලාවක් ම හැර ඈන් දෙස බලා මද සිනාවක් පෑවා ය . ඊ ළගට ඇගේ දෑස් ටිමියා වෙත යොමු වූ අතර මැදියම් රැයේ කිසිවක් සිදු නො වූ අයුරෙන් ඌ සිටියේ තව දුරටත් නින්දේ ය .

ජූලියන් සහ ඩික් දෙදෙනා ඒ වන විටත් කූඩාරම තුළ කිසියම් කතා බහක නියැලෙන ආකාරය ඔවුන්ට දක්නට ලැබුනේ පිරිමි ළමුන්ගේ කූඩාරමට ගිය විට ය . මිස් චීෆ් ද ටින්කර් ද ඒ කතාව අසා සිටිමින් අනුපාන එකතු කරන ආකාරය ද දක්නට ලැබිණි .

“ ප්‍රශ්නෙ තියෙන්නේ මිස්චීෆ් කොහෙන් ද ඒ තොප්පිය හොයා ගත්තෙ කියන එක” යි ජූලියන් පැරණි වර්ගයේ හිස් වැස්ම දෙස බලමින් කියන්නට විය . ‘ මූ ඊයෙ ගොවිපොලෙන් හරි අර ගෑණිගේ කඩයෙන් හරි මේක අරන් ආවා වෙන්ට බැරි ද ?”

“ නැහැ” යි ටින්කර් විරුද්ධ වී ය . “ එහෙම වුනා නම් මම අනිවාරෙන් ම දකින්න එපායැ . අනික මෙයා ඊයෙ හවස නිදා ගන්න කොට මේක ඔලුවෙ දාගෙන හිටියෙ නෑ’

ඔවුන්ගේ කතාවට එක්වීමෙන් අණතුරුව ඈන්ටත් ජෝර්ජ්ටත් ඇති ඌ විස්මය වචනයෙන් කිව නො හැකි තරමේ එකකි .ජෝර්ජ් කෙසේ වතුදු ඈන් නම් කිසියම් තැති ගැන්මකට , අනිවාරයෙන් බිය උපදවා ගැනීමකට ලක් වූ බව නම් සදහන් කළ යුතුව තිබේ .

“ අපේ කූඩාරම ගාව ඊයෙ රෑ කවුරු හරි හිටියෙ නෑ කියලා ඔයාලට විශ්වාසයි නේ ද ?’ යි ඈ ඇසුවේ එබැවිනි .

DILEEP PRASANNA

“ ඔන්න පටන් ගත්තා’ යි ඩික් මද සිනාවක් පෑවේ ය . “ මෙයා තාමත් අර පුංචි ඇන් වෙන්ට හදනවනෙ”

“ බය වෙන්ට එපා . අපිට නොකියා කුරුමිණියෙකු හරි හිටිය නම් ටිමී අපිට ඇහෙරවන්නෙ නැතුව ඉන්නෙ නෑනේ .” ඒ ජෝර්ජ් ය .

“ වූෆ්”

“ අපි දැනට තොප්පිය මෙතන ම තියෙන්ට හැරලා පොඩ්ඩක් මූන කට හෝදගෙන මොනව හරි කන්ට බලමු . ඊට පස්සේ අපි කදවුර වටේ පොඩි සෝදිස්සියෙක් දාල බලමු . මේක ඔහොමත් අවුරුදු ගානකට කලින් මෙතන කූඩාරමක් ගහගෙන ඉදපු මිනිහෙක්ගේ තොප්පියක් එහෙම නෙමේනේ . මේක සම්පූර්ණයෙන් ම පාවිච්චි කරන තොප්පියක්”

අන් කළ යුත්තක් සිතා ගත නො හැකි වූවෙන් ජූලියන්ගේ යෝජනාවට එකගත්වය පෑ සෙස්සෝ වහ වහා දිය පහර කරා ඇදෙන්නට වූහ .

නව දිනයක අරුණැල්ලෙන් සමස්ත පරිසරය ඒ වන විටත් නැහැවෙමින් තිබිණ . ඈත සිට හමන්නට වූ මන්ද මාරුතය ඔවුන්ගේ සිරුරු කිතිකවමින් සිප ගනිමින් හමා ගියේ ය . තන් තනිහි මෙන් ම යායට ද වැවී ගත් මල් පඳුරු පරිසරයේ සුන්දරත්වය තව දුරටත් වර්ද්නය කරන්නට සමත් වූවේ ය .

උදා ආහාරයෙන් අනතුරුව නැවතත් ළමුන්ගේ කතා බහට පාදක වූවේ තොප්පිය යි .

“ ආව පාර දිගේ ම අපි පොඩ්ඩක් ගිහින් බලමු ද ?’ යි හදිසියේ ම ටින්කර් ඇසුවේ කල්පනාකාරී හඩිනි .

DILEEP PRASANNA

“ ඔව් . කවුරු හරි ආවා නම් එන්න ඕන ඒ පාරෙන්නේ . අපි බලමු . ඒත් මොකට ද කෙනෙක් අපේ පස්සෙන් එන්නේ කියල නම් හිතා ගන්න බෑ”

විපරම් සහගත දෑස් දල්වා ගනිමින් ඔවුහු මද දුරක් ඉදිරියට ගමන් කරන්නට වූහ . ගණව වැවී ගත් හෙදර් ගොල්ලේ කිසිදු අඩි සටහනක් , හෝඩුවාවකැයි ඉතිය හැකි කිසියම් වූ සාදකයක් සොයා ගැනීමට නම් ඔවුන් සමත් වූවේ නැත .

“ මේක මහ තේරුමක් නැති ගමනක්” යි වසානයේ අදෛරයට පත් සිතින් ඩික් කියා දැම්මේ එහෙයිනි . “ මේ හෙදර් පඳුරුවල අඩි සටහන් හිටින්නේ නෑ . අනික පඳුරු තැලිලා තිබ්බත් ඒවා අපේ ම ඒවා වෙන්ට පුලුවන් ..”

“ මට බයත් හිතෙනවා ජූලියන් ..” යි ඈන් එක් වර ම තම සොහොයුරා දෙසට ඇවිද යමින් කීවා ය . “ අපිට තුවමත් නිවී සැනසිල්ලේ නිවාඩුවක් ගත කරන්ට ලැබෙන්නේ නැති හැටි”

“ අම්මෝ ඈන් . දැං ඔයා ලොකු ළමයෙක් නේද ? අපිට මේ පාර නම් මේ හම්බෙලා තියෙන්නේ අබිරහසක් කියලා හිතන්ට බෑ . බය නැතුව ඉන්න”

“ ඒක නෙමේ අද අපි මොකද කරන්නේ ?” යි ඩික් විචාලේ ය . “ දවසම තොප්පිය ගැන කල්පනා කර කර ඉන්ට බෑනෙ”

“ අපේ කූඩාරම කෙලින් ම අපි දකුනු පැත්තට ඇවිදගෙන යමු . ඒ කරලා සානුවක් වගේ හම්බෙන නිම්නය දිගේ පොඩ්ඩක් ඉස්සරහට ගිහින් බලමු”

ජූලියන්ගේ යථොක්ථ යෝජනාව ඒක මතිකව සම්මත වූවෙන් හොඳින් හිරු රැස් පතනය වන කඳුවැටිය ඔස්සේ ඔවුහ් කූඩාරම හා

DILEEP PRASANNA



Scanned with CamScanner

සමගාමීව දකුනු පසට ඇවිදින්නට වූහ . උස් ව වැවී ගත් තුරු ලතා ද නේක විද මල් පිපි පඳුරු ද හැරුනු කොට ගෙන වැදගත් ය යැයි සිතිය හැකි කිසිවක් දැක්මට ලැබීමකින් තොරව දවසේ ප්‍රථම භාගය ගෙවී ගියේ ය .මුලු කාලය පුරා ම මිස්චීෆ් ටිමියා හා එක්ව ඇවිදගෙන ගිය අතර ඌ විසින් සොයා ගන්නා ලද තොප්පිය සමස්ත කාලය පුරාවට ම හිස පැළැඳ සිටින්නට ද ඌ අමතක කලේ නැත . ඒ තොප්පිය මත සවි කොට තිබෙන රෝස මල් පොකුර නම් ගමන අතරතුර ඇන් විසින් මිස්චීෆ්ගේ හිස් වැස්මට එකතු කරන ලද්දකි .

" කොච්චර පාලුවට ගියත් අත හැරල දාල තිබුනත් මේ බලන්ටකො මේ පලාතෙ ලස්සන" යි නිම්න භූමිය ඔස්සේ තව දුරටත් ඉදිරියට ඇදෙන අතර ඇන් කීවා ය . " ෆැනී නැන්දාට ලිවුමක් යවන්ටත් ඕනි මේව ගැන කියලා'

" මෙහෙ තැපල් කන්තෝරුවක් තියෙනවා දැක්ක ද ?"

" අන්න ඒක තමා මටත් තියෙන ප්‍රශ්නේ" යි ජෝර්ජ් කීවා ය . " මම තැපැල් කන්තෝරුවක් නොදැකපු එක ම නගරෙ මේක'

" සමහර විට ගොවිපොලේ දුරකතන පහසුකම් තියෙන්ට පුලුවන්' යි හදිසියේ ම යෝජනා කරන ලද්දේ ටින්කර් ය . " කොයිකටත් ගොවිපොළට ගිය වෙලාවක ඒ ගැන අහන එක හොදයි"

තවත් බොහෝ වේලාවක් ගත වන තුරු වනයේ ඒ මේ අත සැරූ ඔවුහු නැවතත් කූඩාරම් වෙත යාම සදහා සූදානම් වූහ . දිවා කාලය ද ඉක්මවා තිබුනෙන් මේ වන විට ළමුන් පිරිසට දැනෙන්නේ යක්ෂාරූඩ කුස ගින්නකි .

" කෑමත් අරගෙන ආවා නම් ඉවරයිනේ" යි ඇන් කීවා ය . " එහෙනම් මේ තරන් කලබලෙන් යන්ට ඕන නෑනේ ආපහු"

DILEEP PRASANNA

“ එහෙම කියන්ඩ එපා’ යි ජෝර්ජ් සිනා මුවින් යුතුව කීවා ය . “ කොයි දේ වෙන්නෙත්හ් හොදටනේ’

“ බඩ ගින්නේ හැතැම්මක් විතර ආපහු ගාටන්ට වෙන එක නම් හොද දෙයක් කියන්ට බෑ”

කෙසේ වෙතත් යළිත් කදවුර කරා පැමිනෙන විට අනපේක්ෂිත යමකට තමා පැටලෙන බව ළමුන් ඒ මොහොතේ දැන සිටියේ නැත .

DILEEP PRASANNA



Scanned with CamScanner

## 04 පරිච්ඡේදය

---

මිස් චීෆ් යෙදී සිටින්නේ ආඩම්බරකාරී ගමනක ය . උගේ හිස මත රෝස මල් ගැවසූ හිස් වැස් ම කි . කැන්දාගෙන යන්නාක් මෙන් සමීපව , ගමන් ගන්නා විටින් විට ප්‍රවාහන පහසුකම් පවා සපයන බල්ලෙකි .මේ මොහොතේ පවා කොහේ හෝ තැනක සිට හිස් වැස්මේ අයිතිකරු තමා දෙස බලා සිටින බවක් මිස් චීෆ් යන්තමින් හෝ සිතී නම් උගේ ගමන මේ තාක් ආඩම්හරකාඅරී එකක් නම් නොවනු ඇත .

කදවුරට ආසන්න වන විට ටිමිය නැගූ බිරුම් හඩ සැබැවින් ම බිහිසුනු එකකි . ඒ වූ කලී සාමාන්‍ය බිරුමක් නොව අනතුරක සේයාවක් , නාදුනන්නෙකුගේ සම්ප්‍රාප්තියක් ඉගි කරන බිරුම් හඩකි .

“ ඇයි ටිමී”



DILEEP PRASANNA

Scanned with CamScanner

‘ කවුරු හරි කූඩාරම් කිට්ටුවට ඇවිත් ඉඳලා තියෙනවා’’ යි ඩික් කීවේ කල්පනාකාරී හඬිනි . “ ටිමී ඔය තාලෙට බුරන්නේ ඒක යි’’

මිස් චීෆ් ද මෙලෝ හසරක් නො වැටහෙන වඳුරු බාෂාවෙන් බොහෝ දෑ කියන්නට විය .ටිමියා කූඩාරම වටා ඇවිදින්නට පටන් ගන්නා විට ඌ ද ගමනට එක් වූයේ ය . ටිමියා පොලොව ඉව කරන්නට පටන් ගත් විට මිස්චීෆ් අතු මත්තේ නැග සෝදිසියේ නියැලුනේ ය .

“ ආව එකා වාෂ්ප වෙලා ද කොහෙද ?’’ යි ටින්කර් කීවේ කළ යුත්තක් සිතා ගත නො හැකිව ය . “ අපේ කූඩාරම් වටේ කැරකෙන්ට කාටවත් තියෙන වුවමනාව මොකක් ද ?’’

“ ඒ ගැන වැඩිය හිතන්ට එපා .. හැංගි හැංගි වෙස් බැන්දට නටන්න වෙන්නෙ එලියෙනේ . දවසක අපේ පස්සෙන් ආව එකා අත් දෙකෙන් ම අල්ලා ගමු’’ ඒ ජූලියන් ය .

අයියලා ජෝර්ජ්ලා මොන මොනවා කීවත් ඈන් සැබැවින් ම සසල වී සිටියා ය . නිවී සැනසිල්ලේ නිවාඩුවක් ගත කිරීමේ වාසනා මහිමය මෙවරද ඔවුන් කෙරෙන් ඉවත් වීගෙන යන බව දැන් දෙන් ඇයට ඉවෙන් මෙන් දැනෙමින් තිබෙන්නේ ය .

“ මට බයයි ජූලියන්’’ යි සෙස්සන් තරමක් එහාටත් මෙහාටත් යන තුරු බලා හුන් ඈ වැඩිමල් සොහොයුරා සමග කීවේ ය . “ මොකක් හරි අනතුරක් අත ළඟ කියල මට හිතෙනවා . හැරත් මම මේ පාලු නගරෙට කැමති නෑ’’

ජූලියන් මද සිනාවක් පෑවේ ය .

“ බය නැතුව ඉන්ට . මොකුත් වෙන්නෙ නෑ කාටවත් . සමහර විට කවුරු හරි කොල්ලෙක් , ගොවියෙක්ගේ පුතෙක් අපිව දැකල නිකන් රවුම්

DILEEP PRASANNA



Scanned with CamScanner

ගහනව ද දන්නෙ නෑනේ . ඒ නිසා ඒ තරම් හිතන්න එපා . අපි ඉක්මනින් ම අපේ වටේ කැරකෙන කෙනා බෙල්ලෙන් ම අල්ලා ගත්තා ම ඉවරනේ”

“ මට බය ඌ මාව අල්ලා ගනී කියලා . මට එහෙම මොකක් හරි උ නොත් ඔයා මාව කොහොම හෑඉ බේර ගන්ට . මට නම් බෑ එක තත්පරයකට වත් කාටවත් අහුවෙලා ඉන්න”

එතැන් සිට ජූලියන් ඈන් සම්බන්දයෙන් පෙරටත් වඩා වැඩි ඉමසිල්ලකින් පසු වූ බව නම් සඳහන් කළ යුතු ය . කුඩා ගැහැණු ළමයාගේ බිය මනාව වටහා ගැනීමේ හැකියාවක් ඔහු සතු විය .

දිවා ආහාරයෙන් ඉනික්බිති මද වේලාවක් එළි මහනේ හෙදර් ගොල්ල මත වැතිර හුන් ළමුන් පෙරලා නින්දෙන් අවදි කරන්නට සමත් වූවේ අහස දෙසින් එක්වර ම ඇසෙන්නට වූ අකුනු හඬක් විසිනි . කලු පැහැ වලා ගැබැක් , නිල් පැහැති අහස් කුස ආක්‍රමනය කිරීමේ නියැලී සිටිනු ඔවුන්ට ඒ හා සමග දක්නට ලැබිනි . වලා ගැබට සම්මිශ්‍රව හාත්පස පරිසරය තුළ පවා පැවැත්තේ අන්ධකාරයකි . නුදුරේ ඇතිවන මහා වරුශාවක පෙර නිමිති කියා පාමින් සීතල සුළං දහාරාවක් ගත කිලි පොලා හමා ගියේ ය.

දිය ඇල්ල සමීපයේ වියැලෙන්නට දැමූ ඇඳුම් කිහිපයක් වැස්සට පෙර රැගෙන ඒමේ අදහසින් ඈන් දිය ඇල්ල්ල මුදුනට ගියේ තනිව ම ය . වර්ශාවට මුහුන දීම සඳහා කටයුතු සම්පාදනය කිරීමේ නියැලී සිටියෙන් කවුරු කවුරුත් සිටියේ කාර්‍ය බහුලව ය .

ඈන් ගලක් මත දමා තිබූ ඇගේ ඇඳුම අතට ගත්තා ය . මේ වන විටත් පරිසරය පුලුල් වෙනසකට සැරහෙමින් තිබෙන ආකාරය දෙස හුන් තැන ම හිඳ මොහොතක් බලා සිටියා ය .හැම තැන ම අඳුරු ය . ඇස ගැසෙන ගැසෙන සෑම ඉසව්වක් ම කරුවල ය . තවත් නො බෝ වේලාවකින් මහා වරුශාව එක් වරම මහා පොලොවට ඇද හැලෙනු ඇත . ඈන් තුරු හිස් දෙස

DILEEP PRASANNA

බලා සිටියා ය . තුරු අතුරින් අඳුර ගලා යන ආකාරය බලා සිටියා ය .. ඒ අඳුර අතුරින් තමා අසල ම ගස් දෙකක් අතරින් බලා සිටින කලු පැහැති ඡායාව ඇට දක්නට ලැබුනේ එ විට ය .

" ජූලිය ……න්"

සුලගේ හඬත් අකුනු පුපුරන හඬත් ලැප්ජාවට පත් කරමින් ඇන්ගේ මුවෙන් නැගෙන විලාපය ශ්‍රවනය වන විට ජූලියන් සිටියේ ඇන් එන තුරු පෙර මග බලමිනි . දෙවනි වරටත් හඬ ගෑමේ අවශ්‍යතාවයක් නොමැති වූ අතර ජූලියන් ද ඩික් ද ජෝර්ජ් ද ටින්කර් ද වහ වහා ඈ සිටි දෙසට දුවන්නට වූවෝ ය . ටිමියා නැවතත් දඩයම් බල්ලෙකුගේ ස්වයාව ආරූඪ කොට ගත්තේ ය . අතට හසුවන්නෙකු කීතු කිරීමේ අභිලාශයෙන් මෙන් ඌ සිංහ වෙස් ගෙන ඉදිරියට දුවන්නට විය .

ජෝර්ජ් වහා දිව ගොස් ඇන් ව අල්ලා ගත්තා ය . ඇගේ දෑස් බියපත් ව තිබෙන හැටි ජෝර්ජ්ට පෙනේ . පදුරු බිඳෙන හඬත් ටිමියාගේ ඉරුම් හඬත් මිස්චීෆ්ගේ යුද ගෝසාවත් පිරිමි ලමුන් තිදෙනාගේ පිය ගැටෙන හඬත් නුදුරු වන පෙත තුල ඇති කලේ සියුම් කලබලයකි . තමාට ඉදිරියෙන් වේගයෙන් දිවෙන මිනිසෙකු දක්නට ලැබීමත් සමග මිස් චීෆ්ගේ මහ පොලොවේ ගමන් බිමන් අතුරු දන් වූවේ ය .

එක් වරම අත්තක එල්ලෙමින් වටයක් පැද්දී ගත් මිස්චීෆ් කෝපවත් හඬක් නගමින් ඉදිරියිට දිවෙන මිනිසාගේ මුහුනට පැන්නේ ය . මිනිසා විලාපයක් නගූ අතර හිස දෑතින් ම බදා ගත්තේ ය . ඔහුගේ දර්ශනය සහමුලින් ම අවහිරව ගිය බවට සකයක් නැත . ගමන් ගත් වේගයෙන් ම යුතුව ඉදිරියෙන් වන මුලක පැටලි ඇද වැටුනු ඔහු තමා පසු පසින් නෙත් හෙලා සිටි අධිෂ්ටාන ප්‍රතිබද්ද වීරියෙන් යුතු මුහුනු සතරක් නො දැක ම සිහිසුන් වූවේ ය .

DILEEP PRASANNA



Scanned with CamScanner

## 05 පරිච්ඡේදය

මිනිසා වයස අවුරුදු හතලිහත් පනහත් අතර පසු වන්නෙකැයි අනුමාන කිරීම ළමුන්ට අපහසු වූවේ නැත . කාලවර්න කබායත් , කලු පහැති දිග කලිසමත් ඔහුට එක් කලේ අමුතු පෙනුමකි . ශරීරය ආරෝහ පරිණාහ දේහයෙන් යුක්ත එකක් වුව ද සිහිසුන් ව සිටිය දී ම ඔහු ඔසවා කූඩාරම කරා ගෙන ඒමට තරුන ජවයෙන් යුතු පිරිමි ළමුන් තිදෙනාට හැකිටායාව ලැබිණ .ටිමියා කිහිප විටක් ම සපා කෑමට දැරූ වෙහෙසත් , මිස් වීෆ්ගේ පහුරු ගෑමේ වුවමනාවත් වලකන ලද්දේ අපහසුවෙනි . බියපත් ව සිටි ඈන් සිහිසුන් ව සිටි මිනිසා පැහැදිලිව දැක ගැනීමත් සමග නැවතත් යථා තත්වයට පත් වූවා ය .

“ එයාට අමාරු ද ?” යි අනුකම්පාවක හැඟීමක් හදිසියේ ඇගේ සිත තුළ පහළ වූවේන් ඈන් ජූලියන් දෙස බැලුවා ය . “ ඔලුව වැදුන ද දන්නෙ නෑ’

‘ ඔත්තු බලන්ට හේතුව හරියට නො කීවොත් මීටත් වඩා අමාරුවක මේ මිනිහා වැටෙනවා” යි අත මිටි මොළවමින් ජූලියන් කී ය . ‘ ඩික් පොලු කැල්ලක් ගන්ට”

“ නපුරු කම් බෑ ජූ …”

“ නපුරු කම් නොකර ඉන්ට තිබ්බා ඔයා බය නො වුනා නම් . දැං කටවහගෙන වතුර බාජනයක් අරන් එන්ට . බලමු මිනිහට සිහිය ආවට පස්සේ මොනව ද කියන්ට තියෙන්නේ කියලා’

ඒ වන විටත් මෙතෙක් වහින්නට අර හදිමින් හුන් අහස වේගයෙන් හඩා වැටෙන්නට පටන් ගෙන තිබුනේ ය . අකුනු හඩ ත් මාරුතයත් ප්‍රබල වූ අතර කඳවුර වටා වන තුරු මුදුන් වේගයෙන් කැලඹෙන්නට පටන් ගත්තේ ය .අන්දකාරය තමා අසල සිටින්නාගේ මුහුන පවා නො පෙනෙන තරම් ප්‍රබල වූවෙන් ඉටි පන්දම් කිහිපයක් දල්වන ලැද්දේ ටින්කර් විසිනි .

ඈන් දිය බඳුනක් රැගෙන එන්නට ගිය විට ජූලියන් ඩික්ගේ උපකාරය ද සමගින් මිනිසාගේ සාක්කු සිස් කරන්නට පටන් ගත්තේ ය .

“ මේ වැඩේ හරි ද ජූ ?” යි ඩික් විචාලේ ය .

“ මොකක් ද වර ද ?”

‘ සිහි නැතිව ඉන්න මිනිහෙක්ගෙ සාක්කු එලියට අදින එක ?’

“ වරදක් වෙන්නෙ කොහොම ද ? හිරකාරයෙක් පරික්ෂා කරන කොට එහෙම තමයි “

මිනිසාගේ කලිසම් සාක්කුව තුල තිබී ජූලියන් පිතටට ගත්තේ මුදල් පසුම්බියකි . විදුලි පන්දමක් ද නැවිය හැකි ආකාරයේ කුඩා පිහියක් ද පෑනක් හා කොල කැබැල්ලක් ද සොයා ගන්නා ලද්දේ ඩික් විසිනි .

DILEEP PRASANNA



Scanned with CamScanner

“ මේවයෙන් ඒහැටි එලක් වේයැයි සිතන්ට බෑ” යි අධෛරයට පත් හඬින් ජෝර්ජ් කීවා ය . ‘ ටිමී ඔය ගොරවන එක නවත්තනව නම් හොඳයි දැං . මේ මිනිහට හැඳුනුම් පතක්වත් නෑ නොවැ”

‘ රත්තරන් බඩුත් නෑ’ යි ඩික් මද සිනාවක් පෑවේ මිනිසාගේ ගෙලේ එල්ලා තිබූ රිදී කුරුසයික් ද ගලවා පිතටට ගනිමිනි . ඒ හාත් සමග ම ඔහු විශ්මයෙන් මුර ගාන්ට වූවේ ය .

“ මේ කුරුසය දැක්කා ම මොනව ද මතක් වෙන්නේ ?”

ළමෝ වහ වහා සියලු වැඩ රාජකාරින් නවතා කලු පැහැති නූලකින් මිනිසාගේ ගෙල පැලඳි රිදී පැහැ කුරුසය අධ්‍යනය කරන්නට වූවෝ ය . එය කුලුණු තුනකින් පමණක් සමන්විත වූ අතර කුරුසයේ ඉහළ කොටස දක්නට නො ලැබීම ඔවුන්ට පුදුමයක් වී ය .

“ පල්ලියේ තිබ්බ කුරුසය වගේ ම යි’ යි ජූලියන් යළිත් තම හඬ අවඬ්දි කලේ ය . ‘ උඩ කෑල්ල නෑ .”

‘මේ පැත්තෙ ඉන්න මිනිස්සු සේරම දාන්නේ මේ වගේ නවීන විලාසිතාවක කුරුසයක් ද දන්නෙ නෑ’ යි ජෝර්ජ් කීවා ය . ‘ අයියෝ ටිමී ඔය බුරන වැඩේ නවතනවා . නැත්තම් අපිට පිස්සු හැදෙයි”

හිස් වැස්මක් සොයා ගත් ලෙස ම කුරුසිය දෙස ද තම සොයා ගැනීමක් ලෙසින් මද වේලාවක් බලා හුන් මිස් චීෆ් වහා එය ද රැගෙන අතුරු දන් වූවේ ය . දැතින් ම රැගත් කුරුසය ගෙලේ එල්ලේ ගත් දගකාර වඳුරා එක් වර ම ඇන් පසු පසින් අතුරු දන් වූවේ වානර භාෂාවෙන් මොන මොනවදෝ තෙපළමිනි .

ඈන් විසින් ගෙනෙන ලද දිය බඳුනෙන් ස්වල්පයක් මුහුණට ඉසීමෙන් අනතුරුව සිර කාරයා යළිත් ප්‍රකෘතිමත් වූවේ ය . තවත් දිය බිඳක් බීමෙන්

DILEEP PRASANNA

අනතුරුව සියුම් කැස්සක් පිටකළ මිනිසා තමා වට කොට සිටින ළමුන් දෙස විස්මයෙන් බලා සිටියේ මද වේලාවක් ඈන් දෙස බලා සිටීමෙන් අනතුරුව ය .

" එයා දිහා නෙමේ මා දිහා බලනවා" යි ජූලියන් දැඩි හඬින් කියද්දී මිනිසා තිගැස්සිනි " ජෝර්ජ් ටිමී අල්ල ගන්න . නැත්තම් ඌ මේ මිනිහගේ උගුරු දන්ඩ කැවොත් අහන්ට තියෙන ප්‍රශ්න ටික අහගන්ට බැරි වෙනවා"

" හරි' යි ජෝර්ජ් එකග වූවේ නැගෙන්නට ගිය සිනාව යටපත් කොට ගැනීමේ උත්සාහයක් ද දරමිනි . " ටිමී පොඩ්ඩක් ඉදහන් කැම දෙන්නම්"

මිනිසා වචනයක් හෝ නො කියා ජූලියන් දෙස බලා සිටියේ ය . ඒ අතර ජූලියන් මිනිසාගේ සාක්කුවෙන් පිතටට ගත් පිහිය දිග හැර බිම ඉරි කිහිපයක් අදිමින් තර්ජනාත්මක බැල්මක් හෙලන්නට වී ය . ඩික් ද ජෝර්ජ් මෙන් ම සිනාව වලකා ගැනීමේ ආයාසයක නිරතවෙමින් කඩාගෙන විත් තිබූ මුගුර උලුක් කොට ගත්තේ ය .

" දැං තමුන්ට සැරයක් කීවනෙ ගෑනු ළමයා දිහා බලන්ට එපා කියල" යි ටින්කර් ගිගිරුවේ ය . ' අපි දිහාත් පොඩ්ඩක් බලනවා'

" මගේ කුරුසය දෙන්ට" යි අවසානයේ මිනිසා මතුළන්ට වූවේ බිඳුනු හඬිනි .

" කුරුසිය වගේ ම ඊයෙ නැති වුනු තොප්පියත් තමුසෙට දෙනවා" යි ජූලියන් යළි තම හඬ අවදි කළේ ය . " ඊට කළින්  අපිට දැනගන්ට ඕන දේවල් ටික කියල ඉන්නවා"

" හොදයි"

" තමුසෙගෙ නම ?"



DILEEP PRASANNA

“ ජේම්ස් .. ජේම්ස් බාකර්”

“ ඔය නම කොහේදි හරි අහල තියෙනවා” යි ඈන් කීවා ය . ‘ ඒත් හරියට මතකයක් නෑ”

“ අර කඩේදි . අර ගෑණු කෙනා කතා කරේ ජේම්ස් කියල නේද ? මීස් චීෆ් කෙහෙල් ඇවරිය හොරා ගත්ත වෙලාවෙ”

“ ඒක වෙන්ට බෑ” යි මිනිසා විරුද වී ය . ‘ මම මීට කලින් ඔය ළමයි මුන ගැහිලා නෑ”

“ තව පාරක් ළමයි කීවොත් අතක් පයක් කඩාගන්ටයි වෙන්නේ’ යි ජූලියන් දැඩි හඬින් කීවේ ය .

එය නම් ඔහු විසින් නොකළ යුතුව තිබූ ප්‍රකාශයකි . ජූලියන් එසේ කියන්නා හා ම ඔහු වටා හුන් ළහුණුතුයවක් සිනාවෙන් පිරී ගියේ ය . සිනාව වලකා ගැනීමේ උත්සාහය තව දුරටත් දරා ගත නො හැකි වූ ඩික් කොක් හඩලා සිනා සෙන්නට පටන් ගැනීමත් සමග ජූලියන්ගේ තර්ජනාත් මක පෙණුම මොහොතකට මුලුවනින් ම සේදී ගියේ ය .

“ ඔය ලමයි මෙහේ මොකද කරන්නෙ ?” යි විචාලමින් මිනිසා මද සිනාවක් පෑවේ ය . “ මාව අල්ලගෙන ඇවිත් මෙහෙම ප්‍රශ්න කරන්ට හේතුව මොකක් ද ?”

“ ඊයෙ හවස අපේ කූඩාරම ගාව හැංගිලා මොනව ද කලේ ?”

‘ මොකුත් නෑ . කොහොමත් මම මේ කැලේ ඇවිදින මිනිහෙක්”

“ එහෙම කැලේ ඇවිදින්ට හේතුව මොකක් ද ?”

“ මම දුර්ලභ පැලෑටියක් හොයනවා” යි පවසමින් හේ සුසුමක් පිට කලේ ය . “ ගොවිපොලේ එක එක විදිහේ බේත් වර්ග හදනවා . ඇත්තට ම



DILEEP PRASANNA
Scanned with CamScanner

මෙහෙට පිටින් බේත් හේත් වත් එන්නෙ නැති නිසා අපට වුවමනා කරන බේත් හේත් හදා ගන්නේ අපිම තමයි . මම මේ කැලේ මේ ඉසව්වේ නිතර කරක් ගහන්නේ ඒවට වුවමනා කලමනා හොයා ගන්ට''

" ඉතිං ඒක හැංගි හැංගි කරන්ට ඕන ද ?'' යි ජුලියන් යළිත් ඇසුවේ සැකයෙනි .

" කවුද හැංගුනේ ? මම හොයන බේත් පැලෑටිය මේ හරියේ තිබුනා ඉස්සරලා . ඒක හොයා ගන්ට නම් රෑ වෙනකම් හරි අඳුරු වැටෙන කම් හරි ඉන්ට ඕන . ඉර එළිය වැටෙන වෙලාවට ඒක පේන්න්නේ නෑ''

" තවත් සුරංගනා කතා කියන්ට තියෙනව ද ?''

ටින්කර් එසේ අසන විට මිනිසාගේ ඉවසීම අන්තයට ම බිඳී ගිය බවක් පෙනෙන්නට තිබිනි . සැබැවින් ම අමුත්තාගේ කතාව විශ්වාස කිරීමට හැකි බවක් ටින්කර්ට දැනෙන්නේ ද නැත .

" ඔය ළමයින්ගෙ කටවල් නම් හොදටෝම වැඩි බව මට පේනවා . මා ගැන සැකයි නම් ශ්‍රේලින් මහත්තයාගෙන් ගිහින් අහල බැලුවොත් හොදයි .එහෙම නැත්තම් මාර්තා නෝනගෙන් හරි පියතුමාගෙන් හරි ගිහින් අහගන්නවලා . වයසක මිනිහෙක්ට මෙහෙම හිරි හැර කරන්ට ලැජ්ජා නැද්ද ? රාත්‍රියට මල් පිපෙන ගස් තියෙනවා වගේ ම රාත්‍රියට ආලෝකයක් විහිදන ගස් වැලුත් මේ ලෝකෙ තියෙන බව ඕන මෝඩයෙක් තමුසෙලට කිය යි''

" අපට සමා වන්න'' යි හදිසියේ දැනෙන්නට වූ කණගාටු දායක හැඟීමක් හැතුවෙන් ඈන් කීවා ය . " අපි හිතුවේ හොරෙක් වෙන්ට ඇති කියල''

" හොරෙක් ..'' යි උපහාසාත්මක සිනාවක් මුවගට නගා ගත් ජේම්ස් බාකර් කූඩාරම වටා මද බැල්මක් හෙලා ඈන් දෙසට නැවතත් දැස් දල්වා

DILEEP PRASANNA

ගත්තේ ය .කතා බහ කරන බොහෝ විට ඔහුගේ දෑස් ඈන් දෙසට යොමු වීම ජූලියන් තුල ඇති කලේ කෝපයෙකි .

" ඇයි ඔහේලගෙ කූඩාරමේ ටෙන්ට් රෙදිටික හොරකම් කරන්ට ද ?"

" මෙයා දිහා ගස් අස්සෙ හැංගිලා බලන් ඉන්ටත් අපිව දැක්ක ම කඩාගෙන බිදගෙන දුවන්ටත් හේතුව කියනවකො එහෙනම්" යි ජූලියන් නියවී ය . " උඹ ආයෙත් ඈන් දිහා කන්ඩ වගේ බලා ගෙන හිටියොත් ඇස් දෙක ගලෝනව"

" තමුසෙට දෙයක් තේරුම් කරන්ට නම් බොහෝම අමාරු හැඩයි" යි පවසමින් මිනිසා සුසුමක් හෙලුවේ ය . " මම ආවෙ බේත් පැලෑටි හොයන්ඩ . තමුසෙලා මෙතනට ආවත් නාවත් බෙහෙත් පැලෑටි හොයන වැඬේ මම කරනවා . ඒක මේ නගරෙ තාමත් ඉන්න ඕන ම මනුස්සයෙක් දන්න දෙයක් . ඊයෙ රෑ වෙලා ඔහේලාගෙ කූඩාරම ගාවට ආවත් හැමෝම නිදි වගේ පෙනුන නිසා මම කතා කරන්ට උත්සාහ ගත්තේ නෑ . දැං ටිකකට කලින් මම ආවේ වෙනත් පැලෑටි ටිකක් හොයා ගන්ටත් රෑ වෙලා අර කලින් හොයපු පැලෑටිය සොයා ගන්ටත් හිතාගෙන . මේ ළමයා .. මොකක්ද නම කිව්වේ .. ඈන් නේද ? ඈන් අතන ඉන්නවා දැකලා මට හිතුනා ටිකක් කතා බහ කරන්ට . අනිත් එක උඹලා මේ තරම් යක් පැටව් ටිකක් බවවත් නැහැදිව්ව ..."

" හෝ හෝ .. විශේෂණ පදවලට කලින් කතාව කියනවා"

" .. එවුන් ටිකක් කියල වත් මම දන්නෙ නැනෙ . මම හිතුවේ මගේ වැඬේට පොඩි උදව්වක් ඉල්ල ගන්ට . මාව දැකපු ගමන් මේ ළමයා බය වුන එක මගේ වරදක් නෙමේ . මොකෝ මම බය කරන්ට ආවා නෙමේනේ .එයා ම බය වුනා . ඊට පස්සේ තමා අර යක්ෂ බල්ලගේ කටහඩ ඇහෙන්න පටන් ගත්තේ . දුවන් නැතුව මම වෙන මොන මල උලව්වක් ද කරන්නේ



DILEEP PRASANNA

? ළග තියෙන්නේ පිහියක් වුනත් කඩාගෙන පනින බල්ලෙක් එක්ක ඔට්ටු අල්ලන්ට පුළුවන් ද ?''

මිනිසාගේ ප්‍රකාශන දෙස බලන විට තාර්කික ව පිලිගත හැකි බවක් ළමයින්ට දැනේනේ ය . එසේ වුව ද ඔවුන් තුළ ජේම්ස් බාකර්ගේ සෑම වචනයක් ම ඇති කලේ සැකයකි . මද නිහඬියාවක් ඒ හාම පැතිර ගිය අතර අවසානයේ ,

“ ඉතිං ..'' යි කියමින් ජූලියන් නිහඬියාව බින්දේ ය .

‘ ඉතිං පන්ඩිතයා . මාව තවත් මෙහෙම රදවගෙන හිටියොත් මම කෝ කියල මාව හොයන්ඩ එන මිනිස්සුන්ගෙන් හමුසෙලාට ගැලවීමක් නම් හම්බෙන එකක් නෑ . හැරත් මට තාඩන පීඩන කලාය කියලා ළගම නගර්යේ තියෙන පොලිසියට පැමිනිලි කරන්ට ත් මට පුලුවනි''

“ ඒ කතාවෙත් ඇත්තක් තියෙනවා'' යි තමාට ම කියා ගත් ඈන් ඉනික්බිති කලබලයෙන් යුතුව ජූලියන් දෙස බැලුවා ය . ඔහු කෙරෙන් නම් පළවෙමින් තිබෙන්නේ මිනිසාගේ කතාවට යන්තමින් හෝ හසු නො වෙන , කලබල නො වෙන ගතියකි .

“ හරි මම තමුසෙව යවන්නම්' යි හේ අන්තිමේදී කීවේ ය . “ නමුත් ඊට කලින් මම ගොවිපොළ ට ගිහින් තමුසෙ ගැන විපරම් කරල බලන්ට ඕන''

“ මේ මොන සමයමක් ද කොල්ලෝ . වැස්ස අඩු වෙන පාටකුත් නෑ . නිකන් තේරුමක් නැති වැඩ මොකට ද ?''

“ අන්න හරි .'' යි ජූලියන් මද සිනාවක් පෑවේ ය . “ මේ වැස්සේ තෙමීගෙන ගොවිපොලට යන්ට වුවමනා නෑ නොවැ . තමුසෙ ඔය කියන විදිහේ වෙද මහත්තයෙක් නම් අනිවාරෙන් ම ගොවිපොලෙන් කවෘ හරි හොයාගෙන එන්න එපායෙ . ඒ ආවම නො තෙමී යන්ට පුලුවන්''



DILEEP PRASANNA

Scanned with CamScanner

“ ගොවිපොලෙන් ආවම උඹ මාව හිර කරගෙන ඉන්නවා කියලයි මට කියන්න තියෙන්නේ . එතකොට අදම අකුල්ගෙන මෙහෙන් යන්ට පුලුවන්’

“ අපූරුයි” යි ජූලියන් වියරු සිනාවක් නැගී ය . සැබැවින් ම වෙනදා කාටත් කාරුණික ජූලියන් අද නගන්නේ වියරු සිනාවකැයි ළමුන්ට ද සිතින . “ ඔහෙත් දන්නවා මාත් දන්නවා නොකියනවාට වඩා දෙයක් මෙතන තියෙනවා කියලා . ගොවිපොලෙන් හරි පොලිසියෙන් හරි හමුදාවෙන් හරි ආවත් මම බය නෑ . ඔහේ අපි නැති අතරෙ අපේ කූඩාරමට ආවා . ආවෙ මොන හේතුවෙන් වුනත් ඔහේ ගාව ආයුදයක් තියෙනවා . ආව කියල ඔප්පු කරන්ට ඔහේගේ තොප්පිය අපි ගාව තියෙනවා . අපි හොයල බලලා තමුසේ කියුවේ ඇත්ත කියලා තේරුණාම තමුසෙට යන්ට අරිනවා . එතකන් මේ වැස්සේ මෙතනට වෙලා වාඩි වෙලා හිටියට කමක් නෑ . ටින්කර් මිස්චීෆ්ගෙන් මේ මිනිහගෙ කුරුසෙ ගලවලා ගෙනත් දෙන්ට”

ටින්කර් මිස් චීෆ් සොයා පිටව ගියේ සතුටිනි . ඔහුට දැනෙන්නේ කුතුහලයකි . එමෙන් ම උද්දාමයකි . කරුණු කාරණා එපරිද්දෙන් ටින්කර්ට දැනුන ද ඈන් නම් මේ සිදුවන කිසිවකට වැඩි මනාපයක් නො දැක්වූවා ය . ඈ ටින්කර් ද සමගින් මිස් චීෆ් සොයා ගියේ එබැවිනි .

‘ ජූලියන්ට මොනව ද වෙලා තියෙන්නේ ටින්කර් ?”

“ ඇයි ?”

“ නිකන් ප්‍රශ්න දාගන්නනේ හදන්නේ . අර මනුස්සයා හිර කරගන්ට හේතුව මොකක් ද ? අපි නිකන් මංකොල්ල කාරයෝ වගේනේ’’

“ මම ඔයාලා තරම් වීර ක්‍රියාවලට සම්බන්ද වෙලා නෑ . ඒ වුනාට හිතන්නකෝ ඔයාලා කී පාරක් හතුරන්ට අහුවෙලා ඉදලා තියෙද ? මේ පාර අපිටම හතුරෙක් අහුවෙලා ඉන්නවා . ඉතිං ජූලියන් එක පාරම ඔහුව



DILEEP PRASANNA

Scanned with CamScanner

යවන්ට කැමති නැතුව ඇති . අනික මින්හා ඔයා දිහා බලන විදිහ තමා අවුල ?''

" අනේ මං දිහා එහෙම බලන්නෙ නෑ''

" ඔයාට ඒක තෙරුන් නැද්ද ඈන් ?'' යි ටින්කර් මිස්ච්ෆ්ගේ හිස අතගාමින් කීවේ ය . " කොහොම වුනත් ජූලියන්ට හොඳ සැලැස්මක් ඇති කියලයි මං හිතන්නෙ''

" ටිමී උඹ මේ මිනිහ ගැන ඇහැ ගහගෙන ඉන්ට ඕන'' යි කියමින් ජෝර්ජ් වාඩිවී සිටි තැනින් නැගිට්ටා ය . " පැනල යන්ට හැදුවොත් හපන්ට දෙපාරක් හිතන්ට එපා''

" වුෆ්'' යි ටිමී එකඟ වූවේ ය .

" හරි . ඩික් අපි කට්ටිය එහා කූඩාරමට ගිහින් මොනව හරි කාල තේ ටිකක් බීල එමු'' යි ජූලියන් හදිසියේ ම යෝජනා කලේ ටින්කර් විසින් ගෙනැවිත් දුන් කැඩී ගිය කුරුසිය නැවතත් මිනිසාගේ හිස මත පලඳවමිනි . " ටිමී ඉන්නවනේ මෙයාව බලා ගන්න . පරිස්සමින් ඉන්ට ඕන''

" ඒයි ඔහොම ඉන්නවලා'' යි මිනිසා තැති ගත්තේ ය . " තමුසෙලා ගියාම මේ බල්ලා මාව හපන එකක් නෑ කියල විස්වාස කරන්නේ කොහොමද ?''

" හොරෙන් අපේ කූඩාරමකට ඇතුළු වුනු මිනිහෙක් ව අපේ බල්ලා කෑවා කියලා අපිම පොලීසියට කියන්නම් . එච්චරයි''

ටිමියා ද මිනිසා ද කූඩාරමේ තනිකොට ඔවුහු මිස්ච්ෆ් ද සමගින් ගැහැණු ලමුන්ගේ කූඩාරමට වැදුනාහ . ඈන් බිකට් පෙට්ටි කිහිපයක් කඩන්නට වූ අතර තවත් කෑම ජාති ගනනාවක් ද ජෝර්ජ් පිතටට ගත්තා ය .

DILEEP PRASANNA

“ අර මනුස්සයටත් තේ ටිකක් දෙමු ද ?” යි ඈන් ඇසුවේ ඒ අතර ය .

“ තේ බොන්ට ඔය මිනිහ ඉන්න එකක් නෑ ?” යි මද සිනාවක් නැගූ ජූලියන් කූඩාරමේ විවරය අසළට වී බලා සිටින්නට පටන් ගත්තේ ය .

“ මොකක් ?’

‘ තව ටිකකින් ඔය මිනිහා ඉටිපන්දමත් නිවලා පැනල යනවා . ටිමී බුරනව ඇහෙයි ඉක්මනට ම”

“ පැනල යන්ට දෙන්නෙ ඇයි ?’

“ රෑ එලි වෙනකන් තියා ගන්ට යැ”

‘ ටිමීට අනතුරක් කරයි ද ?” ඒ ජෝර්ජ් ය .

“ නෑ . මම මිනිහගේ පිහියත් අරගෙනමයි ආවේ”

“ ඉතින් එයාට යන්ට දුන්න නම් ඉවරනේ’ යි ඈන් කීවේ ජූලියන් කියන්නක් නිසි අකාරව වටහා ගැනීමේ හැකියාවක් නො වූ බැවිනි . “ එහෙම කරා නම් ප්‍රශ්නයක් ඇති කර ගන්න වෙන්නේත් නෑ”

“ එහෙම ගියා නම් ආපහු සැරයක් ඇවිල්ලා ඔයා දිහා බලා ගෙන ඉදීවි . ඊට පස්සේ ඔයා ගිලීවි”

ජූලියන් කීවාක් සැබෑ වීමට ගත වූවේ තවත් තත්පර කිහිපයක් පමණෙකි . පසුම්බිය විදුලි වේගයෙන් කූඩාරමේ කෙළවරක වූ ඉටිපන්දම දෙසට විසි කළ මිනිසා ඉටිපන්දමේ නිවී යාමත් සමග කූඩාරමේ විවරය දෙසට දුවන්නට වී ය . ආලෝකය නිවී යාමත් පසුම්බිය පතිත වීමෙන් නැගි හඬත් කරණකොටගෙන ටිමියාගේ සමස්ත අවදානය යොමු වූවේ පෙරළී නිවී ගිය ඉටිපන්දම දෙසට පමණි . තමා රැවටුනු බව හදුනා ගත් ටිමියා

DILEEP PRASANNA

වහා හැර්න ද ඒ වන විටත් ඇද හැලෙන වර්ශාව ද නොතකා මිනිසා වේගයෙන් දුවන්නට පටන් ගෙන හමාර ය .

" මම කීවේ ඕක ඔය පිළිවෙලට ම වෙයි කියලා" යි සිනාවක් පළ කළ ජූලියන් , " ජෝර්ජ් අල්ල ගන්ට .. ඌ මේ කරුවලේ ඔය මිනිහා පස්සෙන් යන්ට ඕන නෑ' යි ද උපදෙස් දුන්නේ ය .

ජෝර්ජ් ද ටින්කර් ද ටිමියා අල්ලා ගැනීම සඳහා දිව ගිය අතර ඩික් තම සොහොයුරාගේ මුහුණ දෙස බැලුවේ සිනා පිරි මුහුණිනි .

" ඊ ළඟට මොනව ද වෙන්නෙ ශර්ලොක් ?"

' තේ බීලා කාඩ් අතක් ගහලා රෑට කාලා නිදාගෙන ඉඳලා හෙට එලි වෙලා ගොවිපොලට ගිහිල්ලා ජේම්ස් බාකර් ගැන අහලා පල්ලිය පැත්තට ගිහින්ලා එමු වොට්සන් ..."

DILEEP PRASANNA



Scanned with CamScanner

## 06 පරිච්ඡේදය

ඉක්බිති දින උදෑසන අවදි වූ ළමුන්ට දක්නට ලැබුනේ පරිසරය වසා ගෙන පැතිරෙන ඝන මීදුමකි . මීදුම පහව ගොස් නොබෝ වේලාවකින් ම උදෑසන ආහාරය ගත් ඔවුහු , වහ වහා හැද පැළඳගෙන ග්‍රේලින් ගොවිපොළ කරා ගමන් කරන්නට වූහ . පෙරදා ඇද හැලුනු වර්ශාව හේතු කොටගෙන ගහ කොළ පවා නව පනක් ලඩද්දාක් මෙන් දක්නට ලැබුණු අතර වැඩෙහි නියැලෙන පිරිස් අතරින් ඔවුහු ග්‍රේලීන් මහතා සොයා ගමන් ගත්තෝ ය .

“ සුබ දවසක් ළමයි” යි පෙර පුරුදු සිනාවම මුහුණට නගා ගත් මහල්ලා ළමුන් දෙස බැලුවේ ය . “ ඊයෙ වැස්ස වෙලාවේ කූඩාරමේ ඉන්ට පුලුවන් වුනා ද ?’



DILEEP PRASANNA

Scanned with CamScanner

‘ ඔව්’ යි මද සිනාවක් පෑ ජුලියන් “ මෙහෙට කොහොම ද /’ යි විචාලේ ය .

“ අපි කොයි වෙලේ හරි වහී කියලා බලා පොරොත්තුවෙන් හිටිය නිසා බෝග ටික ට නම් හානියක් නො වී බේර ගන්ට පුලුවන් වුනා . කොහොමත් පසලොස්වකට කලින් මෙහෙම වැස්සක් එනවනේ . හෙට පසලොස්වක”

තව්ත් බොහෝ වේලාවක් ගත වන තුරු සල්ලාපයේ නියැලුන ද ඊයේ හවස කූඩාරමේ සිදු වූ කිසිවක් ගොවියා විමසුවේ නැත . ජේම්ස් බාකර් සම්බන්දයෙන් යමක් ග්‍රේලින් මහතා විසින් විමසනු ඇතැයි බොහෝ බලා පොරොත්තු සහගතව බලා සිටියද එවැන්නක් සිදු නොවන බව පෙනි ගියෙන් අවසානයේ ජූලියන් මාතෘකාව දෙසට හැරීමට තීරණය කොට ගති .

“ ජේම්ස් බාකර් කියල කෙනෙක් දන්නව ද ?’

“ අපොයි ඔව්’ යි ගොවියා මද සිනාවක් පෑවේ ය . “ ඊයෙ ඔය ළමයින්ට අහුවුනු සිර කාරයා නොවැ”

හදිසි පහරක් එල්ල වූ කලෙක මෙන් ත්‍රස්ත වූ ඔවුහු ගොවියා දෙස බලා සිටියේ නිහඬව ය . සාමකාමී සිනාව යළිත් වරක් මුවගට නගා ගනිමින් ඔහු කතාව ආරම්භ කළේ ය .

“ මිනිහා මට සිද්ද වුනු හැම දේම කිව්වා . ඇත්තට ම ඔය ලමයි වැඩ කරලා තියෙන විදිහ අපූරුයි”

“ අපූරුයි ?” යි ජුලියන් විස්ම වී ය .

“ මම මේ වගක් කිව්වා කියල කාටවත් නොකියන තරමට හොඳයි .” යි ග්‍රේලින් මහතා හඬ බාල කලේ ය . ‘ මිනිහා මේ පැත්තට ම ඉන්න එක ම

DILEEP PRASANNA

දොස්තර බව ඇත්ත . ඒ වුනාට ජන්මෙට වඩා පුරුද්ද ලොකු වෙන ගතියක් හැම තිස්සේ ම තියෙනවා . අනුන්ගෙ දේවල්වලට ඇගිලි ගහන ගතියක් . හොරෙන් මිනිස්ස ගැන විපරම් කරන ඕප දූප හොයන ගතියක් ඒ යකාට තියෙනවා'

තවත් සුළු වේලාවක් ගත වන තුරු ගොවියා හා මාර්තා සමග කතා බහෙහි නියැළි පන් පසිඳුවෝ දේවස්ථානය පරික්ශා කරනු වස් ගොවිපොලින් පිතටට බටහ . දිවා ආහාරය සඳහා ගොවි නිවසට පැමිනෙන මෙන් මාර්තා විසින් කරන ලද ආරාදනය ද ඔවුන් විසින් පිළිගනු ලැබිණි .

" දැක්ක්නේ ජූ .. ඔයා හැම දෙයක් ම හැම කෙනෙක් ම දිහා සැකෙන් බලන එකේ තේරුමක් නෑ' යි ගොවිපලෙන් පිතටට පැමින මද දුරක් ගමන් ගන්නා අතර ඈන් කීවේ චෝදනාවක් කරන අයුරෙනි . " දැං අර මනුස්සයා ඇත්තට ම ඇත්ත දොස්තර කෙනෙක් කියලා ඒකෙන් ම තේරෙනවනේ"

" මිනිහෙක් කිව්ව පලියට හැම දේම පිළිගන්න එපා ඈන්" යි ජූලියන් කීවේ නොරිස්සුම් හඬිනි . " මෙතන මොකක් හරි දෙයක් තියෙනවා . මට ඒක දැනෙනවා"

" විකාර" යි ජෝර්ජ් ද වහා විරුද්ද වූවා ය . " ඒ මිනිහා ගැන තවත් සැක කරන එකේ තේරුමක් නෑ . අපි දේවස්තානෙට ගිහින් පොඩ්ඩක් ඇවිදල බලමු . එතකොට මේ දේවල් අමතක වෙයි . මගෙ හිතට මොකක්ද වගේ ඊයෙ අපි හැසිරුණු විදිහ . මොන දේ වුනත් මේ මේ මිනිස්සුන්ගේ අගරෙනෙ . අපි මෙතන පිටස්තරයෝ"

" හරි හරි .. දැන් වැරදි මිනිහා මමනේ'

වාදය හදිසියේ ම ඇන හිට්වේ , ඔවුන් ඒ වන විටත් දේවස්ථානය කරා සමීපවැ තුබූ බැවිනි . සූර්‍ය ලෝකය වැද දිලෙන බිදී ඉය රිදී කුරුසය ඔවුන් තුළ ඇති කලේ කළකිරීමකි . පල්ලියේ ඉදිරිපස මිදුල යන්තමින් අල්

DILEEP PRASANNA



Scanned with CamScanner

බිහිවැ තිබූ  තර , දේවස්ථානය කරා වන පිය ගැට පෙල නගිමින් සිටින ළමුන්ගේ සිත් තුල පල්ලියකට පිවිසෙන සෑම විටක ම ඇති වෙන පහන් සිතිවිල්ල නම් ඇති වන බවක් පෙනෙන්නට තිබුනේ නැත .

" මේක නම් නිකන් අවුරුදු සීයක් විතර පරණ එකක් වගෙයි" යි දූර්වරන ව ගිය බිත්ති දෙස බලමින් ඈන් කීවා ය . ' අපි දවසක ගොවිපොලේ අයත් එකතු කරගෙන මෙතන සුද්ද කරල දාමු ද ? මෙහෙන් යන්න කලින් ?"

" හොද අදහස" යි ජූලියන් වහා එකග වූවේ ය . ' අපි බලමු පියතුමා ඇතුලෙ ඉන්නව ද කියල'

තරප්පු පෙල හැකි තාක් ඉක්මනින් නැගගත් ඔවුහු ටිමියා පෙරටු කොට ගනිමින් දේවස්ථානයේ දොරටුව අසළට පැමිනියෝ  ය . සීනුවක් සවි කොට තිබුන  ද කිහිපවරක් නාද කළ ද එයින් කිසිදු හඩක් නිකුත් වූවේ නැත . එසේ නමුදු දොර ද අගුලු ලා නො තිබුනෙන්  තවත් මොහොතකුදු පමා නොවූ ලමුන් පිරිස දෙව් මැදුරට ප්‍රවිශ්ය වූවේ ටිමියා හා මිස්චීෆ් ද සමග ම ය .

ඔවුන් පැමින තිබූ කුටිය ස්රැජුකෝනාස්‍ර එකක් වූ අතර ඒ තුල පැවතියේ ගණ අන්දකාරයකි . දේවස්ථානයක අපේක්ෂා කළ නො හැකි ආකාරයේ දූර්ගන්දයක් ඒ තුළ පැතිර යන බැව් ඒ හාත් සමගම ළමුන්ට දැනිනි . බිත්තියේ වූ ඉටිපන්දම් රදවනය සොයා ගත් ජූලියන් වහා ගිනි  කූරක් රැගෙන ඉටිපන්දමක් දැල් වූ අතර ද්යේගන ශලාවේ අසුන් පේළියත් එහි ඉදිරියේ වන කුරුසියත් ලමුන්ට දක්නට ලැබුණේ එවිට ය . ඔවුන්ගේ විශ්මයට හේතුවක් වෙමින් ඒ දක්නට ලැබුනු කුරුසයේ ද ඉහළට පිහිටන රේඛා ව දක්නට ලැබුනේ නැත .

" මේක නම් විකාරයක්" යි ජූලියන් තැති ගත් හඩින් කොදුලේ ය . " එක කුරුසෙකවත් උඩ කෑල්ල නෑ . සේරම කැඩිල"

DILEEP PRASANNA



Scanned with CamScanner

“ අනේ මන්දා මටත් තේරුම් ගන්ට බෑ” යි ජෝර්ජ් එකග වූවා ය . ‘ අනික කෝ ජේසු තුමාගෙ පිළිමයක් වත් මෙතන නැනෙ’

අසුන් මත තබා තිබූ බයිබල් කිහිපයකින් එකක් පිතටට ගත් ටින්කර් වහ වහා ඉටි පන්දම් ආලෝකයෙන් එය පෙරළා බලන්නට වී ය . එහි වන අක්ෂර කිසිවක් ඔහුට හඳුනා ගත නො හැකි වූ අතර සෙස්සන් ද වහ වහා බයිබල රැගෙන පරික්ශා කරන්නට වූවේ ඒ නිසා ම ය .

“ මේ භාෂාව මොන රටේ එකක් ද කියල හිතා ගන්ට බෑ නොවැ” යි ඩික් අවසානයේ නිහඬ බව බින්දේ ය . ‘ ටිමීවයි මිස්චිෆ් වයි හොඳින් අල්ලා ගන්න . උන් දෙන්නා මේක ඇතුලේ කොහේට හරි ගියොත් අපි කොහෙන් හොයා ගන්නට ද කියල හිතා ගන්ට බෑ”

“ ඒක හරි “

ජෝර්ජ් ඒ අනුව වහා ටිමියාගේ කර පටිය තදින් අල්ලා ගත්තා ය . ටින්කර්ගේ උරහිස නැවත වතාවක් මිස්චීෆ් වෙනුවෙන් වෙන් කරන ලදී .

“ මේ කිසි ම දෙයක් තේරුම් ගන්ට බෑ’ යි දේශන ශාලාවට නුදුරින් ඉහළ මාලයට විහිදෙන තරප්පු පෙළ දෙසට බැල්මක් හෙලමින් ජූලියන් කීවේ ය . “ මේකෙන් උඩට නැග්ලා බලමු ද ? පියතුමා උඩ ඉන්නවා ද කියල බලමු”

“ ඔයාලට බය නැද්ද” යි ඈන් ඇසුවා ය . “ මේක මහ අමුතුයිනේ”

“ පල්ලියක මොනව ද බය වෙන්ට තියෙන්නේ ?”

ඩික් එසේ විමසා සිටියද වචනයේ පරිසමාප්තයෙන් ම මේ වන විට ඔවුන් කා තුලත් නැගෙන්නේ තැති ගැන්මකි . කුටිය තුළ පවත්නා ගුප්ත බව ළමුන්ගේ සිත් තුලටට මුළුවනින් ම ඒ වන විටත් කා වැදී අවසන් ය . ජේසුස් වහන්සේගේ පිලිමයක , හෝ එක දු රූපයකින් හෝ තොර ,

DILEEP PRASANNA



Scanned with CamScanner

නිසියාකාර එකදු කුරුසියක හෝ නොමැති අදුරු පල්ලියක විවිදාකාර ගුප්ත සිතිවිලි ළමුන්ගේ සිත්වලට පිවිසීම කිසි සෙයිනුදු අස්වාභාවික නො වේ . අනෙක් අතට ගීතිකා පොත් යැයි සිතා අතට ගන්නා ලද ග්‍රන්ථ තුලද පැවත්තේ එකදු වචනයක් හෝ කියවා වටහා ගත හැකි භාෂාවක් නො වේ. යාර ගණනක් දිගට පහළට එල්ලෙන මකුලු දැල් ද ක්‍රමයෙන් කිවිසිල්ල ඇති කරන අප්‍රසන්න දූර්ගන්දය ද ඔවුන්ගේ සිත් තුල ඇති ගුප්ත බව වඩ වඩාත් වර්දනය කරන්නට සමත් විය . හමාගෙන එන මන්ද මාරුතය කරණ කොටගෙන සැලී බිත්තියේ වදින ජනෙල් පියනක හඩ පවා ඔවුන් තිගැස්මට ලක් කිරීම සඳහා හේතුවක් වූවේ එහෙයිනි .

හදිසියේ ම නිහැඩියාව බිඳ දමමින් පිය ගැටෙන හඩක් ශ්‍රවනය වන විට ළමුන් පස් දෙනා සහ සුරතල් සතුන් දෙදෙනා ඉහළමාලයට නැගීම සඳහා වන පිය ගැට පෙළ නැගීම සඳහා සූදානම් වූවා පමණි . ඈන් ජූලියන්ගේ අත තදින් අල්ලා ගත් අතර ටින්කර්ට දැනුනේ මිස් වීෆ්ගේ දැතට තම ගෙල සිර වේවි යන සිතුවිල්ල යි . පිය ගැටෙන හඩින් තිගැස්සී අත් මිස්වීෆ් ඒ තරම් දැඩිව ටින්කර්ගේ ගෙල බදා ගෙන සිටියේ ය . ටිමියා වරක් දෙවරක් උස් හඩින් බිරූ නමුදු ඌ විසින් නගන ලද හඩ උගේ දෙසවන ද බිහිරි කරවමින් දෝන්කාර නංවන්නට වූවෙන් ටිමී වහා මුනිවත රැකීම යෙහෙකැයි තීරණය කොට ගත්තේ ය . කළු පැහැති කබායක් ද කලු පැහැති දිග කලිසමකින් ද සැරසී උස් වයස්ගත මිනිසෙක් වේගයෙන් තරප්පු පෙළ බසිමින් ළමුන් දෙසට ඇවිද ආවේ ඒ හාත් සමග ම ය .

" කොහොම ද ළමයි" යි කාරුනික ස්වරයක් නගා ගනිමින් මිනිසා විචාලේ ය . " ඕ ගොල්ලෝ ගැන මට ආරංචි වුනා . මම ඇතුලෙ හිටිය නිසා ඔයාලා ඇතුළට ආ බවක් අහන්ට ලැබුනෙ නෑ"

" අපි හොදින් පියතුමනි" යි ජූලියන් සුහද ශීලී බවක් පළ කරන්නට උත්සාහ ගත්තේ ය . එසේ වතුදු තවමත් ඔහු කෙරෙන් මුල් තැති ගැන්ම

පහව ගොස් නො තිබුනෙන් තම වචන සැලෙන සසැලෙන බවක් කොලුවාට දැණින .

“ මගෙත් එක්ක උඩට එන්න . උඩ මෙතනට වඩා පොඩ්ඩක් හොදයි”

පියතුමා පෙරටු කොට ගනිමින් ඔවුහු තරප්පු පෙලේ ඉහළට නැග්ගා හ. සමචතුරස්‍රාක්‍ර කුටියකින් ඔවුන්ගේ ගමන කෙළවර වූ අතර දෙපසින් වන බරාදයන් දෙකක් ද ඒ බරාද හා සමගාමීව වසන ලද දොරෙන් යුත් කාමර කිහිපයක් ද ළමුන්ට දක්නට ලැබින . පියතුමාගේ කතාව සත්‍ය බව හගවමින් ළමුන් පිවිසියා වූ යථොක්ථ සමචතුරස්‍රාකාර කුටිය හරින ලද ජනෙල් කිහිපයක් හේතු කොටගෙන මනා සේ ආලෝකවත් ව පැවතිනි . වහළය දක්වා උස්ව විහිදෙන දැවමය පොත් රාක්ක කිහිපයක් ද ඒ අතර මැද අසුන් කිහිපයක් තබන ලද විශාල මේසයක් ද හැරුනු කොට අන් කිසිත් ඔවුන් විසින් නො දක්නා ලදී .

‘ වාඩි වෙන්ට’ යි පවසමින් පූජකවරයා ලමුන් දෙස බැලුවේ නැවතත් ප්‍රීතිමත් සිනාවක් මුහුණට නගා ගනිමිනි . ‘ ඔයාලා හරි අපූරු කට්ටියක්නේ. වදුරෙක් මේ තරම් හීලෑවිට ඉන්නවා දකින්ටත් ආසයි”

“ ඔව් මෙයා මට පරම්පරාවෙන් ලැබුනු කෙනෙක්” යි ටින්කර් කට මැත දෙඩවීමේ උත්සාහයක නියැලෙන බව දක්නට ලැබුණි . “ මිස්චීෆ් පූජක තුමාට අතට අත දෙන්ට ..”

මිස් චීෆ් මේසය මතට නැගුණේ ය . අතට අත දීම යන වචනයේ අරුත ඌ මනා කොට හදුනන බව පූජකතුමාට පසක් වූවේ ඒ හාත් සමග ම මිස් චීෆ් ඔහු දෙසට දකුණු අත දිගු කළ විට ය . මිස්චීෆ්ගේ අත අතින් අල්ලා ගත් වර ම පැලද සිටි උපැස් යුවලය ගලවා දැමූ එතුමා සිනා පිරි මුවින් යුතුව වදුරාගේ හිස ද අත ගෑවේ ය . අනතුරුව සාක්කුවට අත දමා පිතටට ගත් ඇපල් ගෙඩියක් ද මිස් චීෆ් වෙත පෑමට තරම් කාරුණික වූවේ ය .



DILEEP PRASANNA

දෙවනි අතට අත දීමේ අවස්ථාව උදා කොට ග්ත්තේ අන් කිසිවෙකුද නොව ජෝර්ජ් නියෝජනය කරන ටිමියා ය . ආචාර පෙළපාලියක් යන්නාක් මෙන් හිස කඳ කෙලින් කැර ගමන් ගත් ටිමියා වහා එතුමාට අත දිගු කොට කියා සිටියේ ඌ ද අතට අත දීමේ චාරිත්‍රයේ කෙළ පැමිණියෙකු බව ය . පූජක තුමාගෙන් ඌට තෑගි ලැබුනේ විස්කෝතු පැකට් එකකි .

“ හරිම සන්තෝසයි” යි එකිනෙකා හා හුවමාරු කොට ගනිමින් අනුබවයේ නියැලෙන වඳුරු බලු මිත්‍රත්වය දෙස බලමින් පූජකයා කියන්නට වී ය . “ මගේ අයියා සෑම් ග්‍රේලින් මට ඔය ළමයි ගැන කිව්වා .දැන් එත්කොට කියමු බලන්න මේ ගොල්ලන්ගෙ නම් ගම් ටික”

“ මම ඈන්” යි ඈන් ඇගේ සොඳුරුතම සිනාව පෑවා ය . මේ වන විට ඇගේ සිත තුළ පෙර පැවති බිය තැති ගැන්ම සැක සහිත ස්වභාවය මුලුවනින් ම පහව ගොස් අවසන් ය . “ඈන් කිරින් . මේ ජෝර්ජ් . ජෝර්ජ් කිරින් . ඩික් කිරින් , ටින්කර් හේලින්ග් , ජූලියන් කිරින්’

“ ඈන් කිරින් ..” යි පූජකයා යළිත් ඈන්ගේ නම ප්‍රතිරාවය කළේ ය . ඊ ලගට දෑස් වඩාත් විශාල කොට ඈ දෙස බලා මදහසක් පළ කලේ ය . “ කිරින්ලා හතරයි හේලින් ලා එක්කෙනයි නේ ද !”

“ ඔව්’ යි ජූලියන් කතාවට එක් වූවේ ය . ‘ අපි නිවාඩුව ගත කරන්ට එන ගමනේදී තමයි පල්ලිය දැක්කේ . ඉතිං ග්‍රේලින් මහත්තයා කිව්වා ඔබ තුමා එතුමාගේ සහෝදරයෙක් කියලා . අපිට හිතුනා පල්ලියට පොඩ්ඩක් ගොඩ වැඩිල බලන්ට”

“ සාමාන්නෙන් මේ පලාතට අමුත්තෝ එන්නේ නැති එකේ ඔය ලමයි ආව එක අපි කවුරුත් ගොඩක් සතුටු වෙන කාරනාවක් . නිතර මෙහේට ආවොත් පොත් පත් නම් රාසියක් හොයලා දෙන්ට පුලුවන්”

DILEEP PRASANNA



Scanned with CamScanner

ඒ අතර ජූලියන් ගීතිකා පොතක් සාක්කුවෙන් පිතටට ගත්තේ ය . ඔහු එය රැගෙන විත් තිබුනේ පහතමාලයේ සිට ය .

“ මේ ජාතියේ අකුරුවලින් ලියල තිබ්බොත් නම් කියවන්ට බැරි වෙයි” යි කියමින් ඔහු එය පූජක වරයා ඉදිරියේ දිග හැරියේ ය .

මේසය මත තිබෙන පොත දෙස මද වේලාවක් බලා හුන් පියතුමා මොහොතකට නිරුත්තර වූ නියාවක් පෑවේ ය . ඉනික්බිති යළිත් තම හඩ අවදි කලේ පෙර පැවති මදහස ම නැවතත් මුහුනේ තවරා ගනිමිනි .

“ මේක පුරාන කාලෙ මේ පළාතේ භාවිතා වුනු භාෂාවක් . මේ නගරේ ඉදපු මිනිස්සු සංක්‍රමනය වෙන්න පටන් ගත්තට පස්සෙ මේ භාෂාවත් අභාවයට ගියා . ඔයාලට මේවා කියවන්න බැරි වුනත් ඉංග්‍රීසි බාෂාවෙන් ලියවුනු පත පොත ඕනෑ තරම් මෙහේ තියෙනවා’

“ ඇත්තට ම ඇයි පියතුමනි නගරෙ මිනිස්සු නගරෙ අතහැරලා ගියේ ?’

“ එක ම එක හේතුවක් කියලා කියින්න බෑ ළමයො . ඔයාල නිකන් හිතන්නකෝ මොකක් හරි රාජදාණියක් පරිහාණියට ලක් වෙන විදිහ . යුද්ද වලින් . වසන්ගත වලින් . ඒ වගේ තමයි මෙහෙත් . වසංගත හැදුනා . ලෝක යුද්ද කාලේ නගරය අතහැරලා වෙන වෙන පලාත්වලට සංක්‍රමනය වුනු අය හිටියා . කොහොමින් කොහොම හරි මේ නගරය මේ විදිහට පාලුවට ගියා’

තවත් මද වේලාවක් එතුමා සමගින් සල්ලාපයේ නියැලුණු ළමයින්ට ලෙමනේඩ් සංග්‍රහයක් ලබා දීම සදහා ද පියතුමා කාරුණික වූවේ ය. දේවස්ථානයේ මුළුතැන්ගෙය දෙසට එතුමා සමග ඇවිද ගිය ඔවුහු එතුමා සතුව තිබූ පැරණි පන්නයේ පිගන් කෝප්ප කිහිපයක් ද පිරිසිදු කොට දුන්හ.

DILEEP PRASANNA



Scanned with CamScanner

“ අනේ අපේ නගරෙත් ඔය ලමයි වගේ ළමයි ටිකක් එහෙම හිටිය නම්” යි සතුටු කඳුලක් ද පිරි දෑසින් පූජකයා කියන්නට විය .” ඒත් ආයෙ කවදා වත් ග්‍රේලින්වලට එහෙව් දවසක් උදා වෙයි කියලා හිතන්ට බෑ”

“ එහෙම කියන්ට එපා” යි ඈන් ළගන්නා සුළු හඬකින් කීවා ය . “ අපි වෙලාවක ඇවිත් දේවස්ථානේ සුද්ද පවිත්‍ර කරල දෙන්නම්’

“ ඔව් .. ඔබතුමාට පුලුවන් නම් අපිට දිනයක් කියන්න . ගොවිපොලේ අයවත් උදව් කරගෙන අපි මේ ටික සුද්ද කරමු’

“ ඔය ළමයි බොහොම හොඳ දෙමව්පියන්ගෙ ළමයි කියන එක සහතිකයි”

“ පියතුමනි ඇයි ජේසු තුමාගෙ පිලිමයක්වත් මෙතන නැත්තෙ ?” යි ජූලියන් තවත් ප්‍රශ්නයක් යොමු කලේ ය .

“ සියල්ල විනාශ වෙලා දරුවෝ . පිලිම වලට වඩා වටින්නේ ප්‍රතිපත්ති නේද පුතා’

තවත් මිනිත්තු පහළවක පමණ කාලයක් පියතුමා සමග ගත කළ ඔවුහු දිවා ආහාරය ලබා ගනු රිසින් ගොවිපොල දෙසට ගමන් කරන්නට වූ හ . නැවතත් දේවස්ථානයට පැමිනෙන මෙන් පූජක තුමා විසින් කරන ලද ඉල්ලීම ද ඔවුන් විසින් පිළිගෙන තිබිණ .

“ පියතුමා නම් හරිම හොදයි නේද ?’ යි ඈන් ඇපල් ගෙඩියක් සපමින් කීවා ය . එයද ඈ පූජකයාගෙන් ලත් ත්‍යාගයකි .

“ ඔව්” යි ජෝර්ජ් වහා එකග වූවා ය . “ අපිට අහන්න බැරි වුනානේ ඇයි අර හැම කුරුසෙක ම උඩු අණ්ඩ කැඩිල තියෙන්නේ කියල”

‘ඒක නාහපු එක හොදයි” යි ඩික් කීවේ ඇතත් මෑතත් පිරික්ෂමිනි .

DILEEP PRASANNA



Scanned with CamScanner

“ ඇයි ?’

“ එයා දාගෙන හිටිය කුරුසියත් මම දැක්කා කබාය අස්සෙන් . ඒකෙත් උඩු අණ්ඩ කැඩිලා’’

කිව යුත්තේ කුමක්දැයි සිතා ගත නොහැකි වූ නිහඬතාවයක් ඒ හා සමග ම ඔවුනොවුන් අතර පැතිර ගියේ ය . අවසානයේ ඒ නිහඬබව බිඳ දමන ලද්දේ ටින්කර් විසිනි .

“ මිස්චීෆ් කුරුසියක් හොරකම් කරලා . ඒකෙත් උඩ කොටස නෑ”

DILEEP PRASANNA



Scanned with CamScanner

## 07 පරිච්ඡේදය

පසුදා උදෑසන ළමුන් පිරිස අවදි වන විට බොහෝ වේලාවක් ගත ව තිබුණේ ය . පෙරදා මැදියම් රැය ද එලබෙන තුරු අවදිව එක් කොතක් සිදී ගිය කුරුසත් දේවස්ථානයත් පිලිබද කතා බහක් ඔවුන් අතර පැවතීම ඊට හේතුව යි . නුදුරෙහි හට ගැණීමට නියමිත සිදුවීම් දාමය සම්බන්දයෙන් හසරකුදු නො දත් ඈන් සුපුරුදු පරිද්දෙන් උදා ආහාරය සූදානම් කළ අතර අනුභවය සිදුවන විට ද ඔවුන්ගේ කතාවට බදුන් වූවේ දේවස්ථානය හා ඒ අවට සිදුවීම් සමුදා ය යි .

“ කැඩුණු කුරුස සමරන ආගමක් ගැන අහල තියෙනව ද ?’ යි අසමින් ජූලියන් දුම් දමන කොකෝවා කෝප්පයක් තොල ගෑවේ ය . “ මට හිතෙන්නෙම මේ මිනිස්සු වෙන මොකක් හරි අමුතු ආගමක් අදහන මිනිස්සු කියල”

DILEEP PRASANNA



Scanned with CamScanner

“ අර බාකර් අත තිබුනු කුරුසියත් ඔය වගේ එකක් නොවැ” යි ඩික් ද යමක් සිහි කැදවී ය . “ මේ මිනිස්සු මොන ජාතියේ උන්ද කියල මට හිතා ගන්ට බෑ”

“ අදත් අපි ගොවිපොළ පැත්තේ යමු” යි ජෝර්ජ් කී ය .” බාකර් ඉන්නව ද කියල ඊයෙ දැක බලා ගන්න බැරි වුනු එක අඩුපාඩුවක්’’

“ මට ෆැනී නැන්දට යවන්න කාඩ් එකක් තියෙනවා” යි හදිසියේ ම ඇන් දැන් වූවේ එ විට ය . “ ජූලියන් යමු ද ඊ ළග ටවුන් එකට ගිහින් එන්නත් මේ ගමන් ම’’

“ කාඩ් නම් වෙන වෙලාවක හරි යවන්ට බැරියෑ ඇන්’ යි ජූලියන් අදි මදි කලේ ය . “ ඉස්සරලා ගොවිපොලට යමුකෝ”

තවත් මිනිත්තු තිහකින් පමන වැඩ කටයුතු අවසන් කළ ඔවුහු ගොවිපොළ දිශාභිමුකව ගමන් කරන්නට වූවෝ ය . සුපුරුදු පරිදි මිස්ටීෆ්ගේ උර මත ලැග ගත් අතර ජෝර්ජ් ටිමියාගේ කර පටිය අල්ලා ගත්තේ හදිසියේ හෝ බාකර් මුනගැසුණහොත් සිදු විය හැකි ගැටුමක් සම්බන්දයෙන් ඇ තුල අදහසක් පැවති බැවිනි .

සදහන් කළ යුතු යැයි හැගෙන කිසිදි විශේෂිත සිදුවීමක් ගමන අතර තුර නම් සිදු වූවේ නැත . ශ්‍රේලින් මහතා හා මාර්තා ළමුන් පිරිස කළින්දා සේ ම ඉත සිතින් පිලිගන්නා ලදී .

“ ෆැනී නැන්දා මොනවා හිතවනව ද දන්නෙ නෑ’ යි ඇන් සුසුමක් පිට කළා ය . “ මම එයාට පොරොන්දු වුනා කාඩ් එකක් එවනවා කියලා . නන්නාදුනනන පළාතකට වෙලා ඉන්න අපි ගැන එයා හරිම හිත් කරදරෙන ඇත්තෙ’

DILEEP PRASANNA



Scanned with CamScanner

“ ටින්කර් .. මගේ කාර් එක පදවන්ට පුලුවන් ද ?’ යි හදිසියේ ම ජූලියන් ඇසුවේ සිනා මුසුව ය .

“ යතුර දෙනව නම් බැරි වෙන්නේ නෑ’ යි ටින්කර් ප්‍රීතියෙන් කෑ ගැවේ ය . ‘ පුංචි කාලේ ඉඳන් මම හදට යන රොකට්ටුත් පැද්දා මතකයි නොවැ’

“ අපෝ ඔව් . ඈන් ව එහා නගරෙට එක්කගෙන ගිහින් ආපිට එනවා . අතරමග දි වාහනේ කඩා ගත්තොත් මම තමුසෙගෙ පිටේ නැගල ගෙදර යන්නෙ කියලත් අමතක කරන්න එපා”

“ විනාශයි” යි ඩික් සිනා මුහුනින් කීවේ ය . ‘ රෝද හතරම ආපහු එද්දිත් අරන් එන්ට”

“ ඒ ගැන බය වෙන්ට එපා” යි ටින්කර් ජූලියන් අහසට විසි කළ යතුර ඩැහැ ගනිමින් ඈන් දෙස බැලුවේ ය . ‘ එන්න නෝනා .. රියදුරා සූදානම් ඔබේ සේවයට’

රථය පන ගන්වා පිතටට රැගෙන ආ ටින්කර් ඈන් අසලින් නවතා ඈ ඇතුලට නගින තුරු මොහොතකට ප්‍රමාද වූවේ ය . ඈන් සිනා මුසු මුහුනින් ජූලියන් දෙස බලා සියල්ලට ම හිස වනා මෝටර් රථයට නැගුනා ය . ඒ හාත් සමග ම දොර වැසෙන්නට ඔන්න මෙන්න කියා තිබියදී මෙතුවක් වහළය මතට වී බලා හුන් මිස් චීෆ් ද කාරය තුළට රිංගා ගත්තේ ඌ ද ගමනට සැදී පැහැදී සිටි නිසා ය .

ඈන් සහ ටින්කර් නොපෙනී යනවාත් සමග ම සෙස්සෝ යළිත් ගොවිපොලේ සක්මන් කිරීමේ කටයුතු ආරම්භ කළහ.නා නා විද බෝගයන් සරුව වැවීගත්තා වූ ගොවිබිම කාලය ගත කිරීමට ඉතා අපූරු තැනක් වන බව ඔවුන්ට සැක නැත . හදිසියේ ම ලෝම උලුප්පා සිහින් කෙදිරියක් නැගූ ටිමියාගේ දර්ශනය අනුව හැරී බලන ළමයින්ට දක්නට

DILEEP PRASANNA

ලැබුනේ කිසියම් කතා බහක නියැලෙමින් සිටින ශ්‍රේලින් මහතා සහ බාකර් ය .

ඔවුන්ගේ කතා බහට පසු බිම වූවේ කවරක් වුවත් එය දැන ගැනීමේ ඇකියාවක් හෝ වුවමනාවක් අප මිතුරන්ට තිබුණේ නැත . ඇන් සහ ටින්කර් රැගත් කාරය දෙස ඔවුන්ගේ නෙත් යොමුව තිබූ බවත් , කතා බහට පදනම වැටුනේ ළමුන් දෙදෙනාගේ පිටව යෑම බවත් අප මිතුරන් දැන සිටියේ ද නැත . ළමුන් තමා දෙසට පැමිනෙන බැව් හදිසියේ දක්නට ලැබුණෙන් ශ්‍රේලින් මහතා වහ වහා පෙරළා ඔවුන් දෙසට පැමිණියේ සුහද සිනාවකින් මුව  සරසවා ගනිමිනි .

" අර ඉන්නේ බාකර් මහත්තයා නේද ?' යි ජූලියන් මද සිනාවක් පෑවේ ය . " පරණ දේවල් අමතක කරලා පොඩ්ඩක් කතා කරොත් හොදයි කියලත් හිතෙනවා"

" ඒ මිනිහා එක්ක කතාවට යනවට වඩා හොදා කට ගලක අතුල්ල ගන්න එක' යි ශ්‍රේලින් මහතා කීවේ පෙර පැවති සිනා මුවෙන් ම ය . " ඕන් දැන් බෙහෙත් පැලෑටි වගයක් හොයන්ට යන්ට තියෙනව ලු"

ඔහු මෙසේ කියන්නා හා මා බාකර් දේවස්ථානය දෙසින් නොපෙනී ගියේ ය .

නිව්ටන් වින්සන්ට් යුගලය හා  කතා  බහක් ඇරඹීමේ කැමැත්තක් ළමුන් පිරිසට පැවතිය ද ඒ සදහා අවස්ථාවක් ද උදා වූවේ නැත . විවිද රාජකාරීන්හි න් හි නියැලෙමින් හුන් ඔවුන් දෙදෙනා කතා බහ කිරීමේ වැඩි කැමැත්තක් හෝ වැඩ කටයුතු සදහා අමුත්තන් හවුල් කර ගැනීමේ හෝ කැමැත්තක් නො දැක්වීම ඊට හේතුව යි . එ බැවින් ටින්කර් සහ ඇන් පැමිනෙන තෙක් පමනක ගොවිපොළේ රැදී සිට ඔවුන් පමිනි වහා කදවුර කරා යාම ඔවුන්ගේ අභිලාශය විය .

DILEEP PRASANNA



Scanned with CamScanner

“ මේ දෙන්නා තවත් නෑනේ” යි ඔරලෝසුව පස් වෙනි හෝ හයවෙනි හෝ වරට පිරික්ෂමින් ජූලියන් කීවේ ය . “ පයින් ගිහින් ආවත් එන්ට වෙලානෙ”

‘තව ටිකක් බලමු” යි කියමින් ජෝර්ජ් නියරක් මත වාඩි ගත්තා ය . “ ටින්කර් වාහන පිස්සා නිසා රවුම් ගහනවා වෙන්ටත් පුලුවන්නේ”

“ මට බය මේකගේ තියෙන තදියමට මොනව හරි කරදරයක් අනතුරක් කර ගනී ද කියලා’ ඒ ඩික් ය .

දිවා ආහාරය ද ඉක්මවී නමුත් ටින්කර් සහ ඈන් පෙරළා නො පැමිනියෙන් ළමෝ තරමක් කලබල වූ හ .

“ අර ළමයි දෙන්නා තාම ආවෙ නෑ නෙද ?” යි අසමින් මාර්තා ඔවුන් අසළට පැමිනියා ය .

“ ඒක තමයි” යි ජූලියන් පිලිතුරු දිනි . “ හැබැයි දැන් නම් මග එනව ඇති කියල හිතෙනවා”

“ එයාලා එනකන් අපට පොඩි උදව්වක් කරන්ට පුලුවන් ද ?”

“ පුලුවන්.. කියන්ට”

“ මෙන්න මේ බෙහෙත් පැලෑටි වැවෙනවා ඔයලගේ කූඩාරම ගාව . මහන්සි නො බලා තුන්දෙනා එක්ක ගිහින් මේ ටික හොයාගෙන එනව ද ? ඉස්සරල බලන්ට අඳුරනවද මේ පැලෑටි කියලා”

ඇය විසින් දිගු කරන ලද පත්‍රිකාව කියවා බැලූ ඔවුන්ට දක්නට ලැබුනේ දන්නා හඳුනන පැලෑටි කිහිපයකි . නිකරුණේ බලාගෙන සිටීමට වඩා කිසියම් වූ කටයුත්තක නියැලීම මනසට සුවයක් බව අවබෝද කොට තිබුනෙන් ඔවුහු හැකි ඉක්මනින් නැවතත් කඳුකරය බලා ගමන් කරන්නට වූවෝ ය .

DILEEP PRASANNA



Scanned with CamScanner

වනයේ ගත කරන ලද පැය දෙක තුනක ප්‍රතිඵලයක් ලෙසින් බෙහෙත් පැලැටි සොයා ගැනීමේ හැකියාව ඔවුන්ට ලැබිණි . එහෙත් ඒ වන තුරුදු ඇන් සහ ටින්කර් පෙරලා නොපැමිනීම විසඳා ගත නොහැක් ගැටලුවක් වූවෙන් ජූලියන්ගේ මුහුනෙන් පලවූවේ නො ඉවසිල්ලකි . විටෙක ඔහු ආකාශය දෙසත් ඈත හෙදර් යාය දෙසත් බලයි . තවත් විටෙක හෙදර් යායෙ එහේටත් මෙහේටත් පිය නගයි .

" ඔය හැටි කලබල වෙන්ට දෙයක් නෑ" යි ඩික් කීවේ ජූලියන්ගේ සිත සනසවන අටියෙනි . " ඇන් එක්ක ඇවිදින්න ගියා ම එයාට වෙලාව කලාව ගැන අවබෝදයක් නැනේ . ටින්කර් වුනත් දන්නවනේ ඉතින්"

" තවත් මෙහෙම බකන් නිලාගෙන ඉන්ට බෑ . ඉක්මනට බිකට් දෙක තුනක් වත් කාලා ගමනක් යන්ට ලෑස්ති වෙන්ට"

" කොහේට ද ?"

' ගොවිපොලට . මේ පැලැටි ටික බාර දීලා ඕ ගොල්ලෝ එතන් ම ඉන්න. ශ්‍රේලින් මහත්තයගේ කාර් එක ඉල්ලගෙන මම යනවා අර දෙන්නව හොයගන්ට'

' අපිත් එනවා" යි ඩික් ද ජෝර්ජ් ද එක් හඩින් කීහ.

" වූෆ්"

DILEEP PRASANNA

## 08 පරිච්ඡේදය

---

ඇන් සහ ටින්කර් දෙදෙනා ග්‍රේලින් නගරයට ආසන්නත ම නගරයේ වැඩි වේලාවක් ගත කළේ නැත . ලිපිය යැවීම සඳහා ගත වූ වේලාවත් ඇන් ආසා කළ අරුමෝසම් බාණ්ඩ මිලයට ගැනීම සඳහා ගත කළ වේලාවත් එක් කොට බැලූ විට එය සුලු කාලයකැයි සඳහන් කළ හැකි ය .ජූලියන්ගේ කාරය පැදවීමට ලැබීම සම්බන්දයෙන් ටින්කර් සිටියේ ප්‍රීතිමත් සිතෙනි . විටෙක එහි වේගය උපරිමය දක්වා වැඩි කරමින් ද ප්‍රීති සිතෙන් ගීයක් ගයමින් ද ගමනෙහි නියැලෙන ඔහු දකින ඇන් තුළ ඇති කළේ හාසයකි. ගමන පුරාවට ම ගී ගායනා කිරීමේ නියැලුනේ ටින්කර් පමණක් නො වේ . මිස් චීෆ් ද උගේ වදුරු බාශාත්මක ගීයක රසය ළමුන් දෙදෙන හා සමග බෙදා ගත්තේ ය .

යලිත් ග්‍රේලින් කරා පැමිනෙන මෝටර් රථය හදිසියේ නවතමින් ගැහැනියක් මාවත මැදට පැන්නේ , ග්‍රේලින් කරා ළමුන් පැමිණි පලමුවන දිනයේදී ඔවුන් පාර අසා ගත් කුඩා ආපන ශාලාව ඉදිරියේදී ය . ඒ වූ කලී ආපනශාලාවේ හිමි කාරිය විනා අන් කිසිවෙකුත් නො වේ .

DILEEP PRASANNA



Scanned with CamScanner

“ මොකට ද එයා අත දාන්නේ ?” යි අසමින් ටින්කර් ඈන් දෙස බැලුවේ ය . “ එදා බැනලා ඉවර කරගන්ට බැරි වුනු මොනව හරි තියෙනවා වත් ද දන්නෙ නෑ”

‘ විහිලු නැතුව නවත්තල බලමු”

වේගය හීන කොට කාරය නවතා දැමූ ටින්කර් , වීදුරුව පහතට කළේ ය .

‘ඇයි ?’

“ උදව්වක් කරන්න පුලුවන් ද ළමයා ?”

“ මොකක් ද ?’

“ මගේ කුස්සියේ තිබුන කබඩ් එකක් පෙරලුනා . මට ඒක තනියම උස්සගන්ඩ බෑ .විනාඩියට ඇවිල්ලා මට පුංචි උපකාරයක් දෙන්න පුලුවන් නම් වටිනවා”

ටින්කර් ඈන් දෙස බැලුවේ ය .

“ ඔයා වාහනේ ම ඉන්න . මම ටක් ගාලා එන්නම් . මිස්චීෆ් ඈන් ව බලා ගන්ට”

ටින්කර් ගැහැණිය සමග ආපන ශාලාව තුලට පිවිසෙනු බලා සිටි ඈන් තමා සමීපයේ වාඩිගෙන සිටින මිස් චීෆ් දෙසට හැරුනා ය . මිස් චීෆ් මොනවදෝ කොඳුරමින් ඈ සමග දිගු කතා බහකට මුල පිරුවේ ය . උගේ නැහැයට කිති කැවීම ඈන්ට විනෝදයක් විය .කිව්සුම් යවා නැහැය පිරිමදිමින් බැන වදින මිස් චීෆ්ගේ හැසිරිමත් , ඈන්ගේ විකාර හාස්‍යජනක කිති කැවීමත් හේතු කොටගෙන තමා දෙසට පැමිනෙන හැඩි දැඩි මිනිසුන් තිදෙනා ඈන් හෝ මිස් චීෆ් කල් තබා දුටුවේ නැත .

DILEEP PRASANNA

ජේම්ස් බාකර් වශයෙන් ඔවුන් විසින් හඳුන්වන ලද පුද්ගලයා වහා ඉදිරිපිට දොරටුව විවර කරන විට ඈන් තිගැස්සී ගියා ය . විරෝදය පාන්නට ද මත්තෙන් වහා මුහුනට එල්ල කළ ඇලෙන සුලු පටියක් ඈන්ගේ කතා කිරීමේ හා කෑ ගැසීමේ හැකියාව මුලුවනින් ම නවතා දමන ලදී . ඒ හා සමග ම පසු පස දොරටු දෙක ද විවර කොට ගනිමින් ජුලියින්ගේ මෝටර් රථයට ඇතුලු වූවේ වින්සන්ට් සහ නිව්ටන් දෙසොහොයුරන් ය . තමා හසු වී ඇති බව දැනුනන ද කළ යුත්තක් සිතා ගැනීම පවා ඈන්ට කළ නො හැක්කක් විය .

සිදුවන්නේ කුමක් දැයි නො වැටහුණත් මිස් වීෆ් සිදු නො විය යුත්තක් සිදු වෙමින් පවත්නා බව නම් අවබෝද කොට ගත්තේ ය . උගේ වානර හඬ යටපත් කරමින් වේගයෙන් ධාවනය වෙන්නට පටන් ගත් මෝටර් රථයේ හඬ හාත්පස වසා ගත්තෙන් මිස් වීෆ් වඩ වඩාත් බියපත් වූවේ ය . මෝටර් රථයේ අසුන් අතරට රින්ගා දැතින් දැස් වසා ගැනීම විනා අන් කළ හැකි යමක් වඳුරාට නො වින .

තම හිස බමනය වන බවත් සිහිසුන් වන්නේ නම් මැනැවැයි වැනි සිතිවිල්ලකුත් ඈන් තුළ නැගෙන්නට වූ අතර තමා සහ මිස් වීෆ් මෙපරිද්දෙන් පැහැර ගැනීමට හේතුව ඈන්ට යන්තමින් හෝ සිතා ගැනීමේ හැකියාවක් නො වී ය . ගැහෙන හදවතින් බලා සිටීම විනා සැබැවින් ම ඈ වෙන කුමක් කරන්න ද ? මිනිත්තු පහක පමණ කාලයක් අවන්හලට පසු පසින් පිහිටි කැලෑ පාරක් ඔස්සේ වේගයෙන් ඉදිරියට ඇදුනු කාරය එක් වරම නවතා දමන ලද අතර ඈන් පිතටට තල්ලු කරන ලදී .

මිනිස්සු වචනයක් හෝ කතා නො කළහ . කල්තබා සියල්ල සැලසුම් කොට තිබූ බවක් ඔවුන් කෙරෙන් දක්නට ලැබින . රථයෙන් පිතටට ඇදගෙන එන ලද ඈන් දඬු අඬුවකට හසු වූ පරිද්දෙන් ශ්‍රේලින් දෙසොහොයුරෝ ඇගේ දෑත් ග්‍රහණය කොට ගත්හ . එතැන් සිට මිනිත්තු



DILEEP PRASANNA

Scanned with CamScanner

දෙක තුනක කාලයක් ඔවුන් ඉදිරියට ගමන් කළ අතර කටු පඳුරු වල සීරෙමින් ,මුල්වල පැකිලෙමින් කළ ගමන අවසානයේ නිමා වන බව පෙනෙන්නට තිබිණ . කැඩුණු කුරුසියෙන් යුතු දේවස්ථානය යන්තමින් දර්ශනය වන විට ම ඈන් සිහිසුන් වූවා ය .

DILEEP PRASANNA



Scanned with CamScanner

## 09 පරිච්ඡේදය

ජූලියන් , ජෝර්ජ් සහ ඩික් ටිමියා ද සමග ගොවිපොළ කරා යළිත් පැමිනෙන විට සංද්‍යාව උදා වී තිබුනේ ය .දම් පැහැ කිරණක් ව සූර්‍යා බටහිර දෙසින් බැස යමින් තිබූ අතර අන්දකාරය ක්‍රමයෙන් පරිසරය වෙලා ගනිමින් පැවැත්තේ ය .

“ කවුරුවත් ෆාම් එකේ නැති හැඩයි’ යි පවසමින් ජූලියන් වසා තිබූ ඉදිරිපස දොරටුව දෙසත් ක්‍රමයෙන් අන්දකාරයට නතුවන භූමි සීමාව දෙසත් බැල්මක් හෙලී ය . “ කට්ටිය ම කොහේ හරි ගිහින් වගේ”

“ ඔව්’ යි ඩික් හිස සැලී ය . “ සොහොන් පිට්ටනියක් වගේ පාලුයි නොවැ”

සැබැවින් ම ඩික් කීවාක් නිවැරදි විය . සමස්ත ගොවිපොළ තුලින් දක්නට ලැබුනේ සුසාන භූමියක පවත්නා බඳු හුදෙකලාවකි . ඈත ගසක බස්සෙකු හඩන හඩත් ඉටින් ඉට එලුවන් කිකිලියන් ආදී සතුන් නැගූ හඩත් හැරුණු කොට පරිසරයේ නිහඩබව බිද දමන ලද වෙනත් කිසියම් හෝ හඩක් වී නම් ඒ නොනවත්වා හමන මන්ද මාරුතය නැගූ සර සර හඬ ම පමණි .



DILEEP PRASANNA
Scanned with CamScanner

‘ ටින්කර්ලා තාම නැත්තෙ ඇයි කියල හිතා ගන්ට බෑ’’ යි තම හිස පිරිමදිමින් ජෝර්ජ් කීවා ය . “ දෙයියන්ගෙ නාමෙට නිශ්ශබ්ද වෙනව ටිමී’’

‘ මම  දැං යන්නම්’’ යි අස්වසානයේ ජූලියන් කීවේ තීරණයක් ගත් ලෙසිනි . “ මම පයින් ම ඇවිදගෙන යනවා . හැත්තැම්ම දහයක් වගේනෙ තියෙන්නෙ . ඔයාලා මෙහෙම ඉන්න මම අර දෙන්නව හොයාගෙන එනකන්’’

“ අපිත් එනවා’’ යි ඩික් විරුද්ධ වී ය . “ තනියම යන එකේ තේරුමක් නෑනේ . ඊටත් මෙතන ඉන්න එකේ තේරුමකුත් නෑ . ගොවිපොලේ කවුරුවත් පේන්ටත් නැති නිසා’

‘ වාහනේ කැඩිලා හරි මොකක් හරි දෙයක් නිසා පරක්කු වෙලා නම් ඈන්ලා මට මග හැරිලා ආවොත් එයාලට කතා කරන්න කවුරු හරි ඉන්ට ඕන . ඒ නිසා අපි තුන් දෙනා ම යන එකේ තේරුමක් නෑ’’

“ ඒක හෲඉ . ජූලියන් ටිමී ව එක්ක යන්න’’

ජෝර්ජ්ගේ අදහස දෙවරක් නොසිතා ම අනුමත කළ ජූලියන් ටිමියා ද සමගෙන් ඉදිරියට ඇදෙන්නට පටන් ගත්තේ ය . අන්දකාරයට නතුව තිබෙන මාවත ඔස්සේ ඉදිරියට ඇදීමේදී ටිමියා තමා සමග සිටීම සැබැවින් ම ඔහුට මානසික සහනයක් වී ය . ඈන්ට සහ ටින්කර්ට සිදු වූවේ කුමක් දැයි ගමන අතරතුර ද කොතෙක් කල්පනාවට බදුන් කළ ද සරල අදහසක් හෝ ඒ සම්බන්දයෙන් ගොඩ නගා ගැනීමේ හැකියාවක් පිරිමි ළමයාට නො වී ය . අණතුරක් සිදු වන්නට ඇති ය යන බිය තරයේ සිත වසා පැතිරෙන්ට වූවේන් තව දුරටත් කිසිත් කල්පනා කිරීම ගමනට බාදාවකැයි හේ අන්තයේ තීරණය කොට ගති .

ජූලියන්ගේ සහ ටිමීගේ පිටව යෑමත් සමගින් ජෝර්ජ් සහ ඩික් තව දුරටත් හුදෙකලා වූහ . තැති ගැන්ම හා සම්මිශ්‍රව හුදෙකලාව වඩාත් තදින්



DILEEP PRASANNA

Scanned with CamScanner

දැනෙන්නට වූවෙන් කිසියම් කටයුත්තක නියැලිය යුතු යැයි ඔවුහු අවසානයේ තීරණය කළහ .

" අපි මඩුවක දොරක් ඇරල ඇතුලට යමු" යි ඩික් අවසානයේ යෝජනා කලේ එහෙයිනි . " මේ බෙහෙත් පැලැටි ටික තියන්ටත් එපායැ"

තවත් අනපේක්ෂිත සිදු වීමකට ඉඩ හසර සාදමින් ඩික් ජෝජ් ද සමග ආසන්නයේ වූ මඩුවක දොරක් විවර කොට ඇතුලට ගමන් කළ හ . ඒ තුළ ද කිසිවෙකුත් දක්නට නො ලැබුණු අතර පෙරළා පිතටට පැමිණීමේ රිසින් ආපසු හැරෙන්නා හා සමග ම ඇසුනු පිය ගැටෙන හඬක් සමග ළමෝ ත්‍රස්ත වූහ . ඒ හාත් සමග ම දොර අගුලු වැටෙන හඬ ඔවුන්ට අසන්නට ලැබුනේ ය . තමන් අදුරු මඩුව තුල සිර ගත කොට තිබෙන බව වටහා ගන්නට ඔවුන්ට අපහසු වූවේ නැත .

" මේ මොන විකාරයක් ද ඩික් ?" යි ජෝර්ජ් හැඩුම් බර ස්වරයෙන් ඇසුවා ය . ' කවුද අපව හිර කලේ ?"

" මෙතනින් එළියට ගියා ම කියන්නම්" යි ඩික් මද සිනාවක් පෑවේ ය . " ඊට පස්සෙ අල්ල ගමු මොකාද අපි ව හිර කලේ මොනව ද මෙතන වෙන්නෙ කියල"

" එලියට යන්නෙ කොහොම ද ?"

' පිදුරු දාපු වහලයක තියෙන අඩුපාඩුව කාව වත් හිර කරන්න බැරි එක"

---

දිගු කලක් තිස්සේ ළමුන් සමග ගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් ඒ ඒ අවස්ථාවන්හීදී හැසිරිය යුතු ආකාරය පිලිබඳ මනා අවබෝදයක් ටිමියා තුල ඇතිව තිබුනේ සහජයෙන් ම ය . බුරා ගෙන දත් විලිස්සාගෙන පැනිය යුත්තේ කවර අවස්ථාවන්හී දැයි ඌ මනා සේ දන්නේ ය . එපරිද්දෙන් ම



DILEEP PRASANNA

Scanned with CamScanner

මීක් හඩකුදු නො නගා මීයට පිම්බාක් සේ නිහඬව පසු විය යුතු අවස්ථාවන් ද ඌ මනා කොට හඳුනන්නේ ය . ජූලියන් මේ රාත්‍රියේ දී විදුලි පන්දමක් පමනක් දල්වාගෙන මේ සොයා යන්නේ කවුරුද යන්න පිළිබඳ ව පවා මේ මොහොතේ ටිමියා දැන සිටියේ ය . ඒ වූ කලී මුසාවක් නො ව අවිවාදයෙන් පිලිගත හැකි සත්‍යක් ම වන්නේ විටින විට ඉව කරමින් ඇන්ගේ හා ටින්කර්ගේ සුවද සොයා ගැනීම සම්බන්දයෙන් ටිමියා උත්සාහ දරමින් සිටි බැවිනි .

ශ්‍රේලින් වලට පැමිනි මුල් දිනයේදී තේ පානය කළ ආපන ශාලාව අසළට පැමිණි ජූලියන් මද වේලාවක් සිතිවිල්ලේ පසු වූවේ ආපන ශාලාවේ කාන්තාව හමු වී ඇන්ගේ සහ ටින්කර්ගේ හෝඩුවාවක් වේදැයි විමසිලිමත් වෙනවාද නැද්ද යනුවෙන් තීරණයක් ගත නො හැකි ව ය . ඒත් සමග ම ටිමී සියුම් බිරුමක් නගා වසා තිබූ කඩය දෙසට හැල්මේ දුවන්නට පටන් ගත්තේ ය .

" උඹට මොකක් හරි ඉවක් හම්බුනා ද ටිමී ?" යි සුරතල් බල්ලාගේ හැසිරීම සම්බන්දයෙ බලාපොරොත්තු සහගත හඬින් ජූලියන් විචාලේ ය .

" වුෆ්" යි ටිම් එකග වූවේ ය .

' මට ටින්කර්ගේ ජාතික සුවද දැනෙනවා" යි කියන්නට ඌට වුවමනාව තිබෙන්නට ඇත .

සාප්පුව සම්පූර්නයෙන් ම වසා තිබුනෙන් ඒ තුළට යාමේ හැකියාවක් ජූලියන්ට හෝ ටිමිට තිබුනේ නැත . දොරටුව අසල මද වේලාවක් රැඳුනු බල්ලා ඉනික්බිති සැර පරුශ බිරුම් හඬක් නගා මාවතේ ඉහළට දුවන්නට පටන් ගත්තේ ජූලියන් ද ඇදගෙන ය .

අනපේක්ෂිත යමක් හදිසියේ සිදුවන විට ටිමියා සමග ඇවිද යන ජූලියන් සිටියේ අවන්හලට තරමක් ඔබ්බෙන් වූ උස් එල්ම් ගසක් අසල ය . අකුනු

DILEEP PRASANNA



Scanned with CamScanner

පහරක් එල්ල වන කලෙක මෙන් එක් වරම අහසෙන් අයෙක් ජූලියන්ගේ උරහිසට පැන්නෙන් බියපත් වූ රාවයක් ද සමගින් ජූලියන් පාර මත පෙරලී ගියේ ය . තත්පර කිහිපයක ඇවෑමෙන් යලි සිහි එළවා ගත් ජූලියන්ට දක්නට ලැබුනේ ප්‍රීතියෙන් කෑ ගසා නටන්නට තරම් සිතෙන දර්ශනයකි . මෙතුවක් අතුරු දන් ව හුන් මිස් චීෆ් ජූලියන්ගේ මුහුන සිප ගනිමින් වානර බාශාවෙන් මොන මොනවදෝ තෙපලන්ට පටන් ගත්තේ තොරතෝංචියක් නැති ව ය .

‘ අසරණයා ගහ උඩට වෙලා බයේ වෙව්ල වෙව්ල ඉන්ට ඇති’’ යි තමාටම කියා ගත් ජූලියන් , ‘‘ ටින්කර් කෝ මිස්චීෆ්’’ යි විචාලේ ය .

ජූලියන් එසේ විමසුවා හෝ නො විමසුවා තමාට කොහේදෝ යෑමට වුවමනා බව දක්වමින් මිස් චීෆ් දැක් වූ ඉඟිය ටිම් වටහා ගත්තේ ය . ඌ මිස් චීෆ් සමග ඉදිරියට ඉදිරියට ඉදිරියට ඇදෙන්නට පටන් ගත්තේ ය . අතුරු මාවතකින් හැරී මද දුරක් ගමන් කරන ඔවුන්ට හදිසියේ ම නවතා දමා තිබූ ජූලියන්ගේ මෝටර් රථය දක්නට ලැබෙන විට තවත් මිනිත්තු දහයකට වැඩි වේලාවක් ගත වැ තිබුනේ නැත .

මේ වන විට ජූලියන්ට ඇති ව තිබෙන හැඟීම් සියල්ල ලියා දැක්වීම නො කළ හැක්කක් බැව් ප්‍රාඨකයාට දන්වා තැබීම යෙහෙකැයි සිතමි . සියල් සිතිවිලි අවනයේදී බාෂාව බොහෝ විට දුප්පත් වීම ඊට හේතුව යි . සෙල්ලම් බඩුවක් දකින කුඩා ළමයෙකු ප්‍රීතියට පත් වෙන ලෙසින් ජූලියන් මෝටර් රථය වටා නැටුවේ ය . එය සිප ගත්තේ ය . ටිමියා පවා බුරමින් උඩ පනිමින් දඟිරි දමමින් නැටුවේ ය . එසේ ද වුව ඇන් හෝ ටින්කර් සොයා ගැනීමට හැකි හෝඩුවාවක් ඔවුන්ට හමු වූවේ නැත . ඔවුන්ට කුමක් සිදු වේදැයි වටහා ගැනීමේ ගැනීමේ හැකියාවක් ද ඔහුට නො වී ය . විටෙක



DILEEP PRASANNA

හඬමින් විටක උමතුවෙන් මෙන් සිනා සෙමින් ජූලියන් සිදු කරන ලද රංගනය අවසානයේ නිමාවට පත් වූවේ ඔහු මිස්චීෆ් දෙසට හැරී ,

“ එයාලා කොහේට ද ගියේ ?” යි විමසීමත් සමග ය .

විදුලි පන්දම් ආලෝකයට දිලිසෙන යමක් මිස් චීෆ්ගේ ගෙලේ රැඳී තිබී ජූලියන්ට දක්නට ලැබුනේ එ විට ම ය . ඉහළට විහිදෙන කොටස නැති කුරුස පළඳනාවක් මිස් චීෆ් පැළැද සිටින්නේ කෙසේදැයි වටහා ගැනීමට කොලුවාට හැකි වූවේ නැත .

“ එදා බාකර්ගේ කුරුසෙත් ආපිට දුන්නනේ” යි ජූලියන් ටිමියාට හා මිස් චීෆ්ට ඇසෙන පරිද්දෙන් කියා ගත්තේ ය . “ මේක කොයින්ද ?”

තවත් මිනිත්තුවකට ආසන්න කාලයක් ගත වෙද්දී ජූලියන් වහා තීරණයක් ගත්තේ ය .
“ පල්ලිය’ යි ඔහුට කිය වුනේ ය . “ මොනව වුනත් මෙතන පල්ලියට සම්බන්ද දෙයක් තියෙනවා . පල්ලියට ගියොත් මොනව හරි හෝඩුවාවක් හොයා ගන්ට පුලුවන් වෙයි”

ඇන්ගේ හෝ ටින්කර්ගේ හෝ ඉවක් හමු වූ ලෙසින් ටිමී බිරුම් හඬක් නගා දුවන්නට පටන් ගත්තේ ය . වනය අතුරින් ඒගයෙන් දුවන ඌ පසුපසින් දෙවනුව මිස් චීෆ් ද තෙවනුව ජූලියන් ද පඳුරු කඩා බිඳ දමමින් මේ වන විට ඉදිරියට දුවමින් සිටින්නේ ය . පුරහඳෙන් ආලෝකමත් ව දිලිසෙන කැඩුනු කුරුසියෙන් යුතු පල්ලිය හදිසියේ ඇස ගැසෙන විට , වනය මැද්දෙන් වන කෙටි පාරක් පල්ලිය කරා වන බව ජූලියන් වටහා ගත්තේ ය .

DILEEP PRASANNA

ටිමී නිහඬ ය . ඌ තරප්පි පෙල ඉහළට ඉහලට නගින්නට පටන් ගත්තේ ය . මිස්චීෆ් ද ටිමියා සමගින් විටින් විට පොළොව සිඹිමින් වේගවත් ගමනක යෙදෙන්නේ ය .

දේවස්ථාන භූමිය පුරා මේ මොහොතේ පැතිර පවතින්නේ වචනයේ පරිසමාප්තියෙන් ම ගුප්ත බවකි . පුර හද විසින් සමස්ත පරිසරය මුලුවනින් ම ආලෝකවත් කොට තිබූ අතර විදුලි පන්දමක අවශ්‍යතාවය තව දුරටත් දැනුනේ නැත . උරහිස තබා කරන ලද තල්ලු කිරීමේ ප්‍රතිඵලය වශයෙන් දොරටුව විවර වූ අතර ජූලියන් අපේක්ෂා කළ අන්දමේ අඳුරු දේශන ශාලාව නම් එහි නො වූ බව සඳහන් කළ යුතු ය . ඉටිපන්දමින් අලෝකවත් කොට තිබූ කුටිය තුළ කිසිවෙකුත් දක්නට නො වූ නමුදු මිනිසුන් ඉහිපදෙනෙකු කරන යාඥාවක් බඳු යමක් කොහේදෝ සිට ඔහුට ඇසෙන්නට වූවේ ය .

“ හෙමින් යමු ටිමී’ යි ජූලියන් බල්ලාගේ හිස අත ගෑවේ ය . ‘අපේ සද්දෙ දෝන්කාර දෙන්ට පුලුවන්”

පියතුමාට කතා කිරීමේ සිතුවිල්ලක් වඩා බලවත් ව නැගුන ද ජූලියන් එවැන්නක් සිදු කලේ නැත . කොලුවා තුළ ඇති වන සහජ සැකය ඊට හේතු වන්නට ඇතැයි සිතිය හැකි ය . ජූලියන්ට වඩා හදිසියක් තරප්පු පෙළ නැගීමට තිබුනේ මිස්චීෆ්ට ය . උඩු මහලට ආසන්න වන විට යාඥාවේ හඬ වඩාත් වේගවත් ව හා තීව්‍ර හඬින් ඇසෙන්නට පටන් ගත්තේ ය .

පුස්තකාල කාමරය සම්පූර්ණයෙන් ම ආලෝකවත් ව තිබූ නමුදු පියතුමා දක්නට සිටියේ නැත . පොත් රාක්කවල රැඳි පොත්වල නම් පවා ඒ ආලෝකයට ජූලියන්ට පෙනෙයි . හමා එන මන්ද මාරුතය හේතුවෙන් සැලෙන ඉටි පන්දම් සිලු බිත්තිය මත නේක විද භූත රූ මවයි . මේ



DILEEP PRASANNA

Scanned with CamScanner

සියල්ලට ම මත්තෙන් කුටියට ප්‍රවිශ්ට වන්නා හා සමග ඔවුන්ගේ ඇස් ඇස්දී ගත්තේ කනුවකට තබා බැද සිටි ටින්කර් ය .

ටින්කර් බැම්මෙන් මුදා ගන්නට ජූලියන්ට මිනිත්තුවකුදු ගත නො වන්නට ඇත . මිස් චීෆ් පපුවට අත් දෙකෙන් ගසා ගනිමින් හඬමින් ටින්කර් වැළඳ ගත්තා ය . තරුණියක පරිද්දෙන් ටින්කර් ද හඬා වැටුනේ ය .

' ඇන් ව බේර ගන්ට ඕනි'' යි මුවෙහි වන පාන්කඩ ඉවත් වන්නා ත් සමග ම ටින්කර් කෑ ගැවේ ය .

" මොක ද වුනේ ?''

ඇත්තට ම ටින්කර්ට කියන්නට බොහෝ දෑ තිබිණ . එහෙත් සියල්ලට ම පෙර ඇන් බේරා ගත යුතු ය .

DILEEP PRASANNA



Scanned with CamScanner

## 10 පරිච්ඡේදය

DILEEP PRASANNA

ආපන ශාලාව වෙත පය නැගූ ටින්කර් කැඳවාගෙන යද්දේ මුලු තැන්ගෙය ඇතැයි සිතිය හැකි කුඩා සාප්පුවේ පසු පස කාමරයකට ය . ගැහැණිය කාමරයේ දොර විවර කොට පසෙකට වූවේ ටින්කර්ට ඇතුලු වීමට ඉඩ හසර ලබා දෙමිනි . කොලුවා කුටියට ප්‍රවිශ්ය වන්නා හාම අගුලු තද වෙන හඬක් ඇසුනෙන් ටින්කර් මොහොතකට විශ්ම වී ය . වහා ආපිට හැරී බලන ඔහුට දක්නට ලැබුනේ ගැහැණිය තමා කාමරයට දමා දොර වසා ඇති බව ය .

‘ මොන මගුලක් ද ?” යි මුර ගාමින් ඔහු දොරට පා පහර කීපයක් එල්ල කලේ ය . ‘ මේක අරිනවා”

“ හා හා කලබල වෙන්ට එපා’ යි තවත් හඬක් කුටිය තුලින් ටින්කර්ට ඇසුනේ ඒ හාත් සමග ම ය . “ මම කියන විදිහට කලොත් ඔය ළමයාට කිසිම කරදරයක් වෙන්නේ නෑ”

ඒ හඬේ වන හුරු පුරුදු ස්වභාවය හේතු කොටගෙන ටින්කර් වහා හැරී බැලුවේ ය . කුඩා රිවෝල්වරයක් තමා දෙසට එල්ල කරගෙන සිටින ග්‍රේලින් මහතා දක්නට ලැබීම ටින්කර් විශ්මයෙන් ද විශ්මයට පත් කරන්නක් වී ය .



Scanned with CamScanner

‘ මේක සෙල්ලමක් ද ?’’ යි ආයාසකර සිනාවක් මුවගට නගා ගැනීමේ උත්සාහයක නියැලෙමින් ටින්කර් විචාලේ ය .

“ සෙල්ලමක් වගේ තමා’ යි මෙතෙක් කල් ඔවුන්ගේ හිතවත් ගොවියා ව සිටි මිනිසා කී ය . “ උදව් කරනකොට හොයල බලල උදව් කරන්ට ඉගෙන ගෙන නැද්ද ?’’

“ මාව මෙහෙම අල්ල ගන්ට තේරුම මොකක් ද ?’’

ටින්කර් වඩ වඩාත් තැති ගැන්මට ලක් කරමින් මිනිසා වියරු සිනාවක් නගන්නට පටන් ගත්තේ ය .. පැරණි හොල්මන් චිත්‍රපටවල දක්නට ලැබෙන තාලයේ සිනාවක් වූ එය ඇගේ ලේ වතුර කරවනසුලු එකකි . ඊට අමතරව මිනිසා අත රැදි රිවෝල්වරය ටින්කර් අසලට වඩ වඩාත් සමීප වූවේ ය .

“ මම අහන්නේ මේ විකාරයේ තේරුම මොකක් ද කියලා’

‘ මේ හදන්නේ ඒක තේරුම් කරල දෙන්ට තමයි’’ යි ශ්‍රේලින් කිය න්නට විය . “ අද දවස මොකක්ද දන්නව ද ?’

“ මට දවසෙන් වැඩක් නෑ’’

“ රිවෝල්වරය තියෙන්නේ මා අතේ බව අමතක කරන්ට එපා’’ යි මිනිසා නියවී ය . “ කට පරිස්සම් කරගත්තොත් හොදයි . අද පුර පසලොස්වක දවසක් . සම්පූර්ණෙන් ම හද පායන දවසක්’’

“ ඉතිං ?’’



DILEEP PRASANNA

Scanned with CamScanner

‘ ඉතිං අවුරුදු ගානක ඉදල අපේ ආගමේ කරන පූජාවක් තියෙනවා . නගරයට සෞභාග්‍ය පතා රූමත් තරුණියක ගේ රුදිරය යක්ෂයාට පූජා කරනවා . අපේ ගොවිතැන් සාර්තක වෙලා හැම දෙයක් ම ජයග්‍රහනය කරන්ට මේ ශාන්තිය අපට වුවමනා වෙනවා . ඉතිං තමුසෙලා පුංචි කෙල්ල අද රාත්‍රියේ ඒ ගෞරවය දින ගන්න ලැහැස්තියි”

තමා වටා ලෝකය කරකැවෙන්නාක් මෙන් ටින්කර්ට දැනෙන්නට පටන් ගත්තේ ය . තමාට සිහි සුන් වන්න්නාක් මෙන් ඔහුට දැනෙන්නට පටන් ගත්තේ ය . මහදවල් සිහිනයක් දකින්නාක් මෙන් ඔහුට සිතෙන්නට පටන් ගත්තේ ය . ටින්කර් බිම වාඩි ගත්තේ ඒ නිසා ම ය .

ඊ ලගට ග්‍රේලින් කාන්තාවට කතා කලේ ය . දොර විවර වූ අතර රිවෝල්වරය ද එල්ල කොටගෙන ටින්කර් ව වීදිය ඔස්සේ දේවස්ථානය වෙත රැගෙන ගියේ ය .ජුලියන්ගේ මෝටර් රථය අතර මගදී දක්නට ලැබුනු අතර මිස්ටීෆ්ගේ හෝ ඈන්ගේ සලකුනකුදු ඔහුට දක්නට ලැබුනේ නැත .

පල්ලියේ දකුණු පසින් වන තරප්පු පේලිය ඔස්සේ කැදවාගෙන ගිය ටින්කර් ඊ ළගට ඇතුලු කරන ලද්දේ වසා දමන ලද කුටියකට ය . පියතුමා එහි අසුණක වාඩි වී අමුතු පෙණුමක් සහිත පිළිමයක් වෙත නැඹුරු වී සිටියේ ය . ඔහු හැරුණු විට බාකර් ද ග්‍රේලින්ගේ දරුවන් දෙදෙනා ද මේසය මත අතුරා තිබූ ඈන්ගේ නිසල සිරුර දෙස දැහැන් ගත වූ ලෙසින් බලා සිටියෝ ය . ගැහැණු ළමයා මුර ගාමින් දගලමින් සිටියද ඇගෙ මුව ආවරනය කොට තිබුනෙන් කිසිදු හඬක් පිට වූවේ නැත . ටින්කර් ද ශාප කරමින් දෙවනක් වෙන තුරු , ගිරිය ගැලවී එන තරම් හඩින් කෑ ගැවේ ය . එසේ වතුදු සිදු වූ පලක් නැත . ඔහුගේ මුව ද රෙදි කැබැලි සිරකොට බැද දමා තිබූ බැවිනි .

DILEEP PRASANNA

" පුස්තකාල කාමරේට අරන් ගිහින් මූව බැද දමනවා" යි දේව දූතයා කෑ ගැවේ ය . " මූට පූජාව ඉවර වෙනකන් යන්ට හරින්ට එපා"

ඒ අනුව අසරන ටින්කර් දෑත දෙපය පමනක් නො ව මුව ද බැද දමා පුස්තකාල කාමරය තුළ බැද දමනු ලැබීන .

DILEEP PRASANNA



Scanned with CamScanner

## 11 පරිච්ඡේදය

ඩික් කීවාක් මෙන් පිදුරු සෙවිලි කළ මඩුවක යමෙක් සිර ගත කිරීම සිදු කළ නො හැක්කක් බව පෙනෙන්නට තිබිණි . බිත්තියට හේත්තු කරන ලද කුඩා මේසයක් ද ඒ මත තබන ලද කුඩා පුටුවක් ද තවත් නේක විද උපකරණ යන් ද උපකාරී කර ගනිමින් පහත් වහලයේ පරාල දෙකක එල්ලෙන්නට ඩික් සමත් වූවේ ය . දෑතින් ලී දෙකෙහි එල්ලී සිටියද එක් අතක් නිදහස් කොට ගනිමින් ඔහු පිදුරු පහළට අදින්නට පටන් ගත්තේ ය . මද වේලාවකින් සඳ එලිය කුටිය තුළට පැමිණි අතර පිතටට යා හැකි විවරයක් පාදා ගැනීමට හේ සමත් වූවේ ය .

වහලයට නැගගත් ඩික් පහළට බසින අදහසින් පියස්සට කිට්ටු වූවේ ය . දොර දෙස යොමු කොට ගත් දෑස් ඇති ව බලා සිටින මාර්තා ඔහුට දක්නට ලැබුනේ එවිට ය . ඒ හා සමග ම නව අදහසක් සිතට නැගුනෙන් ඩික් හැකි තරම් වීරිය ගෙන මාර්තාගේ සිරුර ඉලක්ක කොට බිමට පැන්නේ හෙන පහරක් වදින්නාක් පරිද්දෙනි .

තරුන ජවයෙන් යුතු ඩික් ගේ පියාසර කිරීම හමුවේ මාර්තා කපා හෙලූ ගසක් පරිද්දෙන් බිම ඇද වැටුණා ය . යළිත් හිස ඔසවා ගැනීමටද ප්‍රථම

DILEEP PRASANNA



Scanned with CamScanner

ඇගේ මුව දඩු අඩුවකට සිරවූවාක් මෙන් ඩික්ගේ දැතට සිර වූවේ ය . මාර්තා තෙරපා ගනිමින් ම දොරටුව විවර කළ ඩික් ඈ ඇතුලට තල්ලු කොට දමා කුටියට ඇතුලු වූවේ ජෝර්ජ් විශ්මයට පත් කරමිනි .

" මම ගෑණුන්ට ගහන්ට කැමති නෑ" යි ඩික් සිනා වූවේ ය . " අපිව හිර කරලා නටන්ට ගිය නාඩගම අහගන්න වැඩේ ඔයාට බාරයි ජෝර්ජ්"

" මම ගෑණුණ්ට ගහන්ට හරිම කැමතියි" යි ක්වින්ටින් මාමා ගේ ජාන මගින් ම ලත් යක්ෂාවේශ බැල්ම මුවගට නගා ගනිමින් ජෝර්ජ් කීවේ ආල වූ පොලු කැබැල්ලක් ද අතට ගනිමිනි . ' ඉතින් .. කැමැත්තෙන් විස්තර කියනව ද නැත්තම් ?"

" උඹලා සේරම මැරෙන්ට යි යන්නේ" යි ගැහැණිය වියරු සිනාවක් නැගුවා ය . " උඹලාට යක්ෂයාගේ ශාපය ලැබෙනවා"

" ආ ඒක අපි දන්නවා නොවැ" යි ඩික් සිනා වූවේ ය . " ඊට කලින් දත් ටික බඩට යයි අරය අහන දේවල් වලට හරියට උත්තර දුන්නේ නැත්තම්"

ගැහැනිය දෙතුන් වතාවක් ජෝර්ජ්ගේ සැර පරුශ මුහුණ දෙස බැලුවා ය . අවසානයේ දෝතින් ම මුහුණ වසා ගත්තා ය . අත රැදි මුගුරින් රිදෙන නොරිද්දෙන කුඩා තට්ටුවක් වක්කඩක් කඩා හැලෙන්නා මෙන් දිගු විස්තරයක් ඇගේ මුවින් ගැනීමට ප්‍රමානවත් වූවේ ය .

" අවුරුදු ගානක් තිස්සේ යක්ශයාට අපි පූජාවක් තියෙනවා . අපිට ශශ්‍රීකත්වය ලැබෙන්නේ අන්න ඒකෙන් . නියම වෙලාවට වැස්ස ලැබිලා අපේ වගාවන් සාර්ථක වෙන්නේ ඒ විදිහට . අවුරුද්දකට සැරයක් ලස්සන ගැහැනු ළමයෙක්ගෙ රුදිරය පූජා කරන්ට ඕන . මෙහේ ගෑණු ළමයි දැන්



DILEEP PRASANNA
Scanned with CamScanner

නා . මිනිස්සු මෙහෙන් ගිහින් . ඒත් වසරකට වතාවක් කවුරු හරි සී දේවි ගෑණු ළමයෙක් ඒ ගෞරවය දිනා ගන්නවා . අද රෑ දොලහට දේවස්තානයේදී උඹලගෙ අර ලස්සන ගැහැණු ළමයාට ඒ ගෞරවය හිමි වෙනවා. බාදාවක් එල්ල වේය කියලා සිතුනු නිසයි උබලව මෙහෙම හිර කර ගන්න හැදුවෙ ...''

ඊට වැඩි යමක් කියන්නට හැකියාවක් ගැහැණියට ලැබුනේ නැත . උමතු වූවියක මෙන් ක්‍රියාත්මක වූ ජෝර්ජ් වේගවත් පර කිහිපයක් ගැහැනියගේ දෙපයට එල්ල කරන්නට වූවා ය . වහා සිහි එලවා ගත් ඩික් ජෝර්ජ් තරයේ වැළද ගෙන මුගුර ඉවත් නොකරන්නට තවත් මොනවායි මොනවා සිදු වේදැයි කීම උගහට ය .

කඹයක් සොයා ගත් ඩික් හැකි ඉක්මනින් ගැහැණිය බැද දැමුවේ ය . කම්පනය දරා ගත නොහැකි වකක් වුව ද ඩික්ගේ බුද්දිය වේගයෙන් ක්‍රියා කරමින් තිබුණේ ය . ජෝර්ජ්ගේ අතින් ඇද ගත් ඔහු දේවස්ථානය දෙසට දුවන්නට පටන් ගත්තේ ,

'' මේ නගරෙට මෙහෙම වෙලා තියෙන්නේ තොපේ ගොන් ආගමික විශ්වාස නිසා තමයි''

යි ද සදහන් කරමිණි .

DILEEP PRASANNA

## 12 පරිච්ඡේදය

සඳ එළිය මනා කොට අල්තාරයක් බඳු මේසය මතට වහලයෙන් ගලා හැලෙන්නේ ය . වහළයේ වන වීදුරු ව සඳ එළියේ ගමන් මගට පාර කියමින් තිබෙන්නේ ය . පුංචි ගැහැණු ළමයා වහලය දෙස රැඳුනු දෑසින් උඩු බැලිව මේසය මත වැතිර හිදී . පූජකයා සම්පූර්ණයෙන් ම කලු ලෝගුවෙන් සැරසී ඈ දෙස බලා සිටියේ ය . ඔහු වටා සිටින පිරිමින් තිදෙනා ද ආපන ශාලාව පවත්වාගෙන ගිය ගැහැණිය ද අමුතු භාෂාවකින් මොනවාදෝ තෙපළමින් හිදින්නේ ගීතිකා පොත් අතැතිව ය . ඇන් ජීවිතයේ ගතකරන අම්හිරිම මොහොත ගත කිරීමට සූදානම් ය . ග්‍රේලින් අත රැඳී තිබෙන සඳ එළියට දිදුලන අසිපත දකින ඇයට ඇති වන හැඟීම් විස්තර කිරීම සැබැවින් ම අපහසු ය .

“ මාර්තා එන බවක් පේන්ට නෑ” යි පූජකයා කීවේ ය . “ වෙලාව දහයට දහයයි “

“ ඇය එනකන් බලා ඉන්ට වුවමනාවක් නෑ” යි ග්‍රේලින් කීවේ ය . “ දහය පනින්ට දෙන්ට බෑ . අපි වැඩේ පටන් ගමු’



DILEEP PRASANNA

“ මේ පොතේ මේ ළමයාගේ නම ලියනවා . ඇන් කිරින් .. මේ අවුරුද්ද දාල ඒක ඉස්සරහින් ලියන්ට”

“ උන් ඇන්ගේ බෙල්ල කපන්ට කලින් මොනව හරි කරන්න ඕන” යි ජූලියන්ගේ වියලි දෙතොල මිමිණුවේ ය . “ මට හිතා ගන්ට බෑ දෙවියනේ . අනේ මගෙ නන්ගි”

“ ශ් ...” යි ටින්කර් ටිමී දෙස බැලුවේ ය . ‘ දෙයියන්ගෙ නාමෙට ඉක්මනට හිතපන් ජූලියන් . මැරුණත් කමක් නෑ ජූලියන් අපි මේ කාලකන්නින්ට ගහමු”

ගීතිකා ගායනයේ හඩ වඩ වඩාත් උස්ව පැතිරෙන්ට පටන් ගත් අතර පූජකයා අසිපත ඉහළට ඔසවා ගත්තේ ආවේශ වූවෙකු ලෙසිනි . තවත් සුලු වේලාවකින් ඒ අසිපත ඇන්ගේ රුදිරයෙන් නැහැ වීමට සියල්ල සූදානම් බව සහතික ය .

වහා ආපිට හැරුනු ජූලියන් යළිත් පුස්තකාල කාමරය දෙසට දුවන්නට පටන් ගත්තේ ය . වහ වහා ඉටිපන්දම් රදවනයෙන් ඉටිපන්දමක් පිතටට ගත් ජූලියන් හොදින් වියැලී තිබූ පොත් පත් ගිනි තබන්නට පටන් ගත්ටර්හේ උමතුවෙන් මෙනි . ගින්න බුර බුරා නැගෙන්ට පටන් ගත්තේත් ටිමියා කෑ ගාන්නට පටන් ගත්තේත් මිස් වීෆ් අරගල කරමින් එකම කාල ගෝට්ටියක් ඇති කරන්නට පටන් ගත්තේත් එක ම මොහොතේය .

“ අර පුටුවක් අරන් දොර ගාවට පලයන් ටින්කර් . එන එකාගෙ ඔලුව කුඩු වෙන්ට ගහන්ට ඕන”

බර ලී පුටුවක් අතට ගත් ටින්කර් උලුවැස්සට හේත්තුවක් දමා ගත් අතර “ ගිනි ගන්නවෝ” යි මුර ගාන්නට ද අමත්ක නො කලේ ය .

DILEEP PRASANNA



Scanned with CamScanner

අපේක්ෂිත ප්‍රතිපලය උදා වෙන්නට වැඩි වේලාවක් ගත වූවේ නැත . බාකර් වේගයෙන් දිවගෙන කුටිය දෙසට පැමිණි අතර මිනිසා කුටියට පිවිසීමත් සමග හිසට එල්ල වූ වේගවත් ප්‍රහාරය හේතු කොටගෙන බාකර් සිහිසුන් ව ඇද වැටුනේ ය . ටිමියා ගොරවමින් ඊ තවත් ප්‍රහාරයකට සූදානම් වෙද්දී ජූලියන් හැකි තාක් වේගයෙන් ටින්කර් ද සමග බිලි පූජාව පවත්වන කුටිය දෙසට දුවන්ට වී ය .

“ ගින්න පැතිරෙනවා” යි ටින්කර් හති ලෑවේ ය . “ වෙලාව ඇති වෙයි කියල හිතනව ද ?”

‘ ඔව්” යි ජූලියන් පිළිතුරු දිනි . “ තව එකෙක් එන්න ඕන දැන් . ගින්න ඇවිලෙනව කියල උන්ට දැනෙනව නම්”

ඔහු මෙසේ කියන්නා හා ම කුටියේ සිට පිතටට පැමිණියේ වින්සන්ට් ය . ග්‍රේලින් පුතනුවන් දෙදෙනාගෙන් වැඩිමල් පුතනුවන් වූ ඔහුට පිරිමි ළමුන් දෙදෙනා ඇස ගැසීමේ භාග්‍ය උදා කොට ගත හැකි වූවේ ය .

මිනිසාගේ විශ්මයට පත් වීම වාසියක් කොට ගත්තේ මිස් චීෆ් ය . එක් වර ම මුහුණ කරා පණින ලද මිස් චීෆ් උමතුවෙන් මෙන් මිනිසා සපන්ටත් පහුරු ගාන්ටත් පටන් ගත්තෙන් තව දුරටත් දෙපයින් සිට ගැනීමේ හැකියාවක් ඔහුට ලැබුනේ නැත . ජූලියන් ද ටින්කර් ද බිම ඇද වැටුනු මිනිසා වෙතට පැන ඉබා ගාතයේ පහර දෙන්නට පටන් ගත්තෝ ය . දෙවරක් බිම වදින ලද හිසින් යුතුව මිනිසා අවසානයේ සිහිසුන්ව සටන් කිරීම නවතා දමන ලද්දේ ය .

“ දෙකයි” යි ජූලියන් කීවේ ය .

DILEEP PRASANNA



Scanned with CamScanner

“ ග්‍රේලින් අල්ල ගත්තොත් මේක ඉවරයි” ඒ ටින්කර් ය .

“ ඇයි ?”

“ මිනිහ ගාව රිවෝල්වරයක් තියෙනව”

“ ආයෙ කෑ ගහනවා ටින්කර් . ගිනි ගන්නවා කියල”

ටින්කර් යළිත් මහ හඬින් කෑ ගාන්නට පටන් ගත්තේත් තවත් මිනිසෙක් එළියට පැමිණියේත් ඒ හා සමග ම ය . එහෙත් මිනිසා පිළි ගැනීමට ළමුන් දෙදෙනාට ප්‍රථම ඉදිරිපත් වූවේ ටිම් ය . මිනිසාගේ පපුවට ම පනිමින් සපා කමින් ඌ ඇති කලේ එක ම කාල ගෝට්ටියකි . මෙතුවක් වේලා යාඥාව හැරුණු කොට පරිසරය වසා පැතිර තිබූ නිහඬතාවය සහමුලින් ම විනාශ කිරීමට මිනිසා නැගූ විලාපයත් ටිම්ගේ ගෙරවුම් හඬත් සමත් වූවේ ය .

“ සෑහෙන දක්ෂ ළමයි ටිකක් නො වැ” යි කියමින් අත රැදි රිවෝල්වරය මානමින් කුටියෙන් පිතටට පැමිනියේ ග්‍රේලින් ය . “ පූජාව ඉවර වෙනකන් පොඩ්ඩක් ඉන්නවකෝ කලබල නො කර”

“ මගෙ නංගිට යන්ට දීපන්” යි ජූලියන් දෙතොල් සැපී ය .

‘ යක්ෂයාට කැප වෙන එක වාසනාව”

“ ඉතිං තෝ කැප වියන්කො’

“ ශ් … කට කට .. ජප කරන්ට අමාරුයි ඔහොම කෑ ගහද්දි . ඔය බල්ලා අල්ලා ගන්නවා . නැත්තම් ඌට මං මුලින් ම වෙඩි තියන්නම් . දන්නවනේ මේකෙ උණ්ඩ හතක් තියෙනවා”

DILEEP PRASANNA



Scanned with CamScanner

“ දහය වෙන්ට කලින් මේක ගිනි ගනී” යි ජූලියන් සිනා වූවේ කවාකාරව කැරකෙමිනි . සැබැවින් ම මේ මොහොතේ ඔහු කවාකාරව කැරකුණේ රිවෝල්වරය අත රැදි මිනිසාට දැක් වූ තැති ගැන්ම හේතු කොටගෙන ය . බරාදයට ඇතුළුවෙන අනෙක් පස දොරටුවට ශ්‍රේලින් පසු පස හරවන තුරුම ජූලියන් කරකැවෙන්නට පටන් ගත්තේ ය .

“ මොනවා .. උබලා ගිනි ? ...”

එහෙත් ඊට වැඩි යමක් කියන්නට මත්තෙන් පිටුපසින් පැමිණි තරුණයෙකු වේගයෙන් මිනිසාගේ දෙපා ඉලක්ක කොට ඉදිරියට පැන්නේ ය . මිනිසාගේ දෙපයේ සමබරතාව ගිලිහී ගිය අතර මහල්ලාගේ හිස අමානුශික අයුරින් පාශානමය පොලව මත වැදුනේය . රුදිරය වැගිරෙන නලලින් යුතුව හේ බිම වැටිර ගනිද්දී ටිමී සපාකෑමේ කටයුතු ද ආරම්භ කරන ලද්දේ ය .

“ ඇති ටිමී” යි රිවෝල්වරය අහුලා ජූලියන් අතට දෙමින ජෝර්ජ් කීවා ය . “ ඇන් ව බේර ගත්ත ද ?”

“ වෙලාවට ආවෙ” යි ජූලියන් සැනසුම් සුසුමක් හෙලුවේ ය . ‘ දහයට කලින් ඇතුලට යන්න ඕන . ගැනියෙකුයි පූජකයෙක්යි විතරයි ඉන්නෙ . මුං ඇන් ව ..”

‘ කතාව දන්නව” යි ඩික් වැර යොදා තවත් පා පහරක් වැතිර සිටි මිනිසාට එල්ල කලේ ය . ‘ අවලම් බල්ලො . තව විනාඩි දෙකයි ඉක්මන්ට යමු”

“ ටිම් උබ ගැනිට පැනපන් . කාලම දාපන්” ජෝර්ජ් කීවාය . ‘ මම මේකව බලා ගන්නම් . ටින්කර් මා එක්ක ඉන්නවා .”

DILEEP PRASANNA



Scanned with CamScanner

තවත් මොහොතකුදු පමාවකින් තොරව ඔවුහු කුටියට ඇතුළු වූවෝ ය . අවේශ වූ කලෙක පරිද්දෙන් වෙව්ලමින් ගීතිකා ගායනයේ නියැලෙන පූජකයා අන්දුන් කුන්දුන් වූවේ කුටියට ඇතුලු වූ සැනින් කිසිදු සෙවිල්ලකින් බැලීමකින් තොරව ජූලියන් පිළිමයට වෙඩි තබන විට ය . ටිමී ද මිස් චීෆ් ද ගැහැණිය අසු පස දුවන්නට වූ අතර ඩික් ඈන් දෙස්සට යැමට සූදානම් වූවේ ය .

" තවත් ඇතුලට ආවොත් කොටහ්නව කෙල්ලට මෙකෙන්" යි පූජකයා අසිපත ඔසවා ගත්තේ ය .

' උබට රශ්නෙ දැනෙන් නැද්ද බූරුවෝ" යි ඩික් මුර ගෑවේ ය . " පණ බේර ගන දුවපන් . තෝත් ඉවරයි තොගෙ පල්ලියත් ඉවරයි තොගෙ දෙයියොත් ඉවරයි"

ඒ වන විටත් ටිමීගේ සපාකෑමට ලක් ව තිබූ ගැහැණිය බිම වැටී සිටි අතර ඩික් ටිමීට සපාකෑම නවතන ලෙස අන දුන්නේ ය .

' අපිට මිනී මරන්න බෑ ටිමී මුන්ට වගේ . ඒ නිසා හැපුවා ඇති"

" මිනී මරන්ඩ මට පුලුවන්' යි ජූලියන් කෑ ගෑවේ සාහසික අයුරෙනි . " කඩුව පැත්තක දාල පස්සට වියන් . නැත්තන් තොගෙ ඔලුව කුඩු කරනවා"

ඒ හාත් සමග ම දහයේ කනිසම නාද වූවේ ය . අනපේක්ෂිත යමක් සිදු වූවේ ද ඒත් සමග ය . හැකි වෙර යොදා අසිපත ඔසවාගත් පූජකයා ඈන්ගේ හිස දෙසට එල්ල කොට කඩු පහරක් එල්ල කිරීමට සූදානම් වූවේ ය . ජූලියන්ගේ අත රැදි රිවෝල්වරය මහ හඩින් පුපුරා ගියේත් අසිපත අතහැර

DILEEP PRASANNA

දමා මිනිසා දෙපය දෝතින් ම අල්ලා ගෙන බිම ඇද වැටුනේත් එක ම මොහොතේ ය .

“ මම වෙඩි තිබ්බ” යි ජුලියන්ගේ අතින් රිවෝල්වරය අන්තයේ ගිලිහී බිම පතිත විය .

“ ඔලුවට වැදුන් නැති එක හොදට ගියා” යි ඩික් කීවේ අසිපත රැගෙන පසෙකට විසි කරමිනි . “ හැබැයි වෙඩි නො තිබ්බ නම් ඈන් ඉවරයි”

ජූලියන් හැකි ඉක්මනින් ඈන් නිදහස් කරන්නට පටන් ගත්තේ ය . පුංචි ගැහැණු ළමයා බොහෝ වේලාවක් වැළඳගෙන සිටි ජූලියන් ,

‘ අපි ගෙදර යමු ඈන්” යි කියා ඈම්මෙ ගොත ගසමිනි .

“ මට බයයි” යි ඈන් ඉකි බින්දා ය . ‘ මූං මාව මරන්න හැදුවා”

“ ආගමක් වෙනුවෙන් මිනී මරන කාලකන්නි ලෝකෙ කොහෙත් ඉන්නවා’ යි ජූලියන් කීවේ ය . “ ආගම් තියෙන්න ඕන මිනිස්සුන්ට යහපතක් කරන්න මිසක් මිනී මරන්න නෙමේ . කුරුස යුද්දයක් ගත්තත් පොඩි පොඩි ආගමික යුද්ද ගත්තත් ආගම වෙනුවෙන් මරා ගන්නව කියන්නෙම මහ කාලකණ්නි වැඩක් “

“ බණ ඇති ජුලියන්” යි ඩික් කෑගැවේ ය . “ ඉක්මන් නො කලොත් මේකෙම අපි සේරම අලුවෙයි . ඉක්මනට මෙතනින් එලියට ගිහින් මේ මිනිස්සුන්වත් එලියට ගෙනියන්න ඕන”

“ හරි’



DILEEP PRASANNA

## 13 පරිච්ඡේදය

ජූලියන් ඩික් ඈන් ජෝර්ජ් ටිමී පස් දෙනා ටින්කර් හා මිස් චීෆ් ද සමගින් මුහුන පෑ ග්‍රේලින් නගරයේ අද්දැකීම සම්බන්ධයෙන් තවත් සඳහන් කළ යුතුව ඇත්තේ ඉතා සුලු කාරණා කිහිපයක් පමණෙකි .

ගින්න වේගයෙන් පැතිරෙන්ට වූවෙන් ඔවුහු හැකි තාක් ඉක්මනින් දේවස්ථානයෙන් පිතටට සම්ප්‍රාප්ත වූවෝ ය . ළමුන්ගේ පහර දීමෙන් සිහිසුන් ව සිටි පිරිස දේවස්ථානයේ ඉදිරි භූමි භාගය වෙත ගෙන එන ලද්දේද ඔවුන් විසින් ම ය . ඈන්ගේ කම්පනය බිඳ දැමීම සඳහා මිස් චීෆ් හා ටිමියා විවිදාකාර සංදර්ශන ඉදිරිපත් කරමින් සිටි අතර ළමුන් ග්‍රේලින් හි මිස දිටුවන් හොඳින් බැඳ දමන ලදී .

DILEEPPRASANNA

‘ අපි දැන් මොකද කරන්නේ ?” යි සියල්ලක් අවසානයේ ඩික් විචාලේ ය .

“ මම පොලීසියට යනවා’ යි ජූලියන් පිළිතුරු දුන්නේ ය . “ එහා නගරයේ පොලීසිය අරන් ඇවිත් මුන් සේරම අල්ලලා දෙන්ට ඕනි”

“ ඔව් . අර මරන ලැයිස්තු පොත ගත්ත ද ?” යි ජෝර්ජ් ඇසුවා ය . “ ඒකෙන් මුන් ඔක්කොම දෙවියන් ගාව්ට යවන්ට පුලුවන්”

“ ඔව් .. මාර්තාව අල්ල ගන්න බැරි වුනු නිසා ඔයාලා හොද අවදානෙන් ඉන්ට ඕන .. “ ගැනි කොහේ හරි ඉදන් මතු වෙන්ට පුලුවන්”

‘ අපූරුයි” යි ඩික් සිනා වූවේ ය . “ මාර්තාව ගහක බැදලා සත්තු ටිකත් සේරම නිදහස් කරලා ගොවි පොළටත් ගිනි තියලා ජෝර්ජුයි මායි ආවෙ’

“ ගොවිපොලට ගිනි තිබ්බ ?” යි ඈන් විශ්ම වීය . ‘ පිස්සු ද ඩික් ?”

“ ඒක ඩික් අතින් දාපු එකක්නේ” යි ඈන්ගේ කරවටා අතක් යොමමින් ජෝර්ජ් කීවා ය . “ ඉක්මනට පොලීසිය අරන් එන්ට”

“ මාත් එන්නම් ජූලියන්” යි ටින්කර් නැගිට්ටේ ය . “ දෙන්නෙක් යන එක හොදයිනෙ”

ඒ අනුව ජූලියන් සහ ටින්කර් වහ වහා මෝටර් රථය සොයා ගැනීම සදහා පිටව ගියහ .

තවත් පැයකට පමණ ආසන්න කාලයක් කිසිදු සිදුවීමකින් තොරව ගෙවී ගිය අතර ගිලන් රථයක් ද පොලිස් රථ කිහිපයක් ද ග්‍රේලින් නගරයට සේන්දු වනු අනතුරුව දක්නා ලදී .

‘ මං එදත් කිව්වා .. අදත් කිව්වා .. හෙටත් කියනව ..” යි ටින්කර් කීවේ පොලිස් රථ හා ගිලන් රථය දර්ශනයෙන් නො පෙනී යනවාත් සමග ම ය .

“ මොකක් ද ?” යි සෙස්සෝ එක් හඩින් විචාලෝ ය .



DILEEP PRASANNA

Scanned with CamScanner

" ජුලියන් , ජෝර්ජ් , ඩික් , ඈන් , ටිමී උඹලා පස් දෙනා එක්ක හිටියොත් මේ වගේ මොකක් හරි අබිරහසක නම් පැටලෙනවා ම යි . එහෙනම් ඉතින් ඔන්න ග්‍රේලින් නගරයේ අබිරහස ඉවරයි"

" හරි හරී ..' යි ඩික් සිනාවක් පෑවේ ය . " ඊ ගාවට තවත් කොහේ හරිත් නිවාඩුවක් ගත කරන්ට යමන්කෝ"

" බිල්ලට මාව නැතිව ටින්කර්ව තෝර ගන්ට කියන්ට එහෙනම්" ඒ ඈන් ය .

" හරි හරි . ඉක්මනට කූඩාරමට ගිහින් බඩු ලෑස්ති කර ගමු . තව එක දවසක් වත් මේ උලව් නගරේ ඉන්ට ඕන නෑ"

අදද ග්‍රේලින් නගරය දක්වා ගමන් ගන්නෙකුට එක් දේවස්ථානයක නටඹුන් දක්නට ලැබෙන්නේ ය . ගිනි ගෙන විනාශ වී තිබෙන දේවස්ථානයේ ගින්නට හේතු වූ කාරණා තවමත් බොහෝ දෙනෙක් නිසියාකාරව දන්නේ නැත .

DILEEP PRASANNA

නිමි

## සත්‍යය ගවේශක කතාමාලාව 01

**Terry goodkind** විසින් ලියන ලද **sword of truth** කතා මාලාව ම සින්හලෙන් කියවීමේ අවස්ථාව දැන් මගේ අතලොස්සක් ප්‍රාඨකයින්ට උදා වී තිබෙන්නේ ය . **legend of the seeker** නමින් රූපවාහිනී ටෙලි නාට්‍ය මාලාවකට ද නැගුනේ මෙහි එන පොත් දෙකකි .කතා මාලාවේ සියලු ම කෘතීන් දැනට මා විසින් සිංහලයට නගා ඇති බව ඔබට දන්වා සිටින්නේ හද පිරි සතුටිනි .

එහි පළමුවැන්න වන **wizard of the first rule** සත්‍ය ගවේශක 01 මායාකරුගේ පළමු රීතිය වශයෙන් නම් කොට තිබේ . ඕඩන් බලය හිමි කොට ගැනී ම සදහා ඩාර්කන් රාල් ක්‍රියාත්මක වෙමින් සිටින අවදියක සත්‍ය ගවේශකයා බවට පත් වන රිචර්ඩ් සයිපර් කේලන් ඇම්නෙල්ගේ හා සෙඩ්ගේ සහය පෙර දැරි ව ඊට එරෙහිව සටන් වදින්නේ ප්‍රාඨකයාගේ හදවත ත්‍රාසයට පත් කරමිනි . රිචර්ඩ් සයිෆර් සමග එකී ව්‍යායාමයේ නියැලෙමින් මායාවත් කෲරත්වයත් රජයන කාලයෙන් වැසී ගත් අතීතයකට ගමන් ගැනීම සදහා පැමිනෙන මෙන් මෙ පරිද්දෙන් දයාබර ඔබට ආරාධනා කොට සිටින්නෙමු .

" රාත්‍රිය අන්ධකාරයෙන් වැසී ගොසිනි . නුදුරේ හට ගැනෙන ක්‍රියාංචිතය සදහා සූදානම් ශරීරයෙන් යුතුව රිචර්ඩ් අසිපත අතට ගත්තේත් දූනුවායාගේ ආගමනය සිදු වූවේත් එක

DILEEP PRASANNA

ම මොහොතේ ය . වේගයෙන් බමන හිස ස්ථාවර කොට ගැනීමේ අරගලයක නියැලෙමින් ද භීතියෙන් තිගැස්මට පත් කේලන් කෙරෙහි නෙත් කොනින් බලමින් ද කොලුව රැදී හුන් ගසේ අතු මතින් නැගී සිටියේ ය . සටන ආරම්භ කළයුතු කාලය පැමිණ තිබේ .. යථොක්ථ පණිවුඩය රැගත් මන්ද මාරුතය අනන්තය සිසාරා වේගයෙන් ගමන් ගනිමින් පැවැත්තේ ය ."

" දැඩි කොට ගත් සිතෙන් ද සපාගත් දෙතොලතින් ද නැගී එන වේදනාව දරා ගත් රිචර්ඩ් වහ වහා දෙපයින් සිට ගත්තේ ය . යෂ්ටියෙන් නැගෙන වේදනාව අසීමාන්තික එකක් වූ ව ද කොලුවාගේ දරා ගැනීමේ ශක්‍යතාවය මේ මොහොතේ පැවතියේ ඊට ඔබ්බෙනි . කේලන් විසින් ගුවනට විසි කරන ලද අසිපත ඩැහැගත් හේ හිංසකාවගේ සම් ඇඳුම විනි විදින පරිද්දෙන් ඇගේ උදරය හරහා තෙරපා හැරියේ ඇසි පිය ගසන වේගයෙනි ..

......

" කොහොම ද එහෙම කලේ ?" යි අවසානයේ ඩෙනා ගොත ලැවා ය .

" වේදනාව දරා ගන්නේ එහෙමයි" යි රිචර්ඩ් මද සිනාවක් පෑවේ ය .

DILEEP PRASANNA



Scanned with CamScanner

“ උඹේ මරණය අද නො වුනත් අත ළඟ ම මරණය නුඹ සොයා පැමිණෙනවා කොල්ලෝ”

“ ඒක මම දන්නවා”

**සත්‍ය ගවේශක 01**

**මායාකරුගේ පළමු රීතිය**

**අසංක්ෂිප්ත සිංහල පරිවර්තනය - දිලීප් ප්‍රසන්න**

**පිටු 820 යි . සිතුවම් සහිතයි**

DILEEP PRASANNA



Scanned with CamScanner